# වාර්ෂික වාර්තාව 2012

## කාර්මික තාක්ෂණ ආයතනය

**තාක්ෂණ හා කාර්මික ප්‍රවර්ධනයේ ඔබේ සහකරු**

# පටුන


| | |
|---|---|
| ගුණාත්මක බව පිළිබඳ කාර්මික තාක්ෂණ ආයතන ප්‍රතිපත්තිය | 1 |
| පනත හා නීති රෙගුලාසි | 2 |
| සතු බලතල හා වගකීම් | 2 |
| දර්ශනය | 2 |
| මෙහෙවර | 2 |
| පාලක මණ්ඩලය හා කමිටු | 3 |
| සංවිධාන ව්‍යුහය | 4 |
| ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වය | 5 |
| සභාපතිතුමාගේ පණිවුඩය | 6 |
| විධායක වාර්තාව | 8 |
| සුවිශේෂී නිපුණතා | 17 |
| ගුණාත්මක යටිතල පහසුකම් ප්‍රවර්ධන කටයුතු | 23 |
| කාර්මික තාක්ෂණ ප්‍රවර්ධනය වේගවත් කිරීම | 26 |
| තරඟකාරීත්වයේදී අනභිභවනීය ස්ථානයක පසුවීම | 32 |
| පාරිසරික දූෂණ තත්වයන් නිරීක්ෂණය හා වැලකුම් ක්‍රියාමාර්ග | 36 |
| මානව සුභ සාධන හා සමාජ ආර්ථික ප්‍රවර්ධනය සඳහා තාක්ෂණය | 41 |
| පුහුණු වැඩසටහන් හා වැඩමුළු | 43 |
| ධාරිතා ගොඩනැගුම හා ඵලදායිතා ප්‍රවර්ධනය | 45 |
| නව ප්‍රවේශයන් | 49 |
| සංයුක්ත දැනුවත් කිරීම් | 52 |
| කර්මාන්ත සඳහා තොරතුරු සේවා | 54 |
| තිළිණ, ප්‍රදාන හා සම්මානලාභී පිළිගැනීම් | 59 |
| සමාජ සුභ සාධන හා ආගමික කටයුතු | 62 |
| ප්‍රකාශන, ඉදිරිපත් කිරීම් හා පේටන්ට් බලපත් | 64 |
| මානව සම්පත් | 74 |
| විධායක කාර්ය මණ්ඩලය | 78 |
| මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශන | 88 |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වැදගත් සිදුවීම් | 92 |
| විගණකාධිපති වාර්තාව | 102 |
| විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු | 110 |

# ගුණාත්මක බව පිළිබඳ කාර්මික තාක්ෂණ ආයතන ප්‍රතිපත්තිය

ජාතික ගුණාත්මක ප්‍රතිපත්තිය මත පිහිටමින් පරීක්ෂණ හා ක්‍රමාංකන සේවා ISO 17025 ගුණාත්ම කළමණාකරණ පද්ධතියට එකඟව ද ආයතනය පූර්ණ වශයෙන් ISO 9000 ගුණාත්ම කළමණාකරණ පද්ධතියට එකඟව ද සේවාලාභීන් වෙත වෘත්තීමය ප්‍රමිතීන්ට අනුකූලව උසස් සේවාවන් සැපයීමට කාර්මික තාක්ෂණ ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමණාකරණය නොපැකිලිව ඉදිරිපත්ව සිටී.

කාර්මික තාක්ෂණ ආයතනයේ සියලු සේවක සේවිකාවන් ක්‍රියාත්මක සංකල්පය පිළිබඳව මනාව දැනුවත් කර ඇති හෙයින් අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූල වන අයුරින් සියලු සේවා සැපයීමට සැදී පැහැදී සිටී.

සේවාලාභීන්ගේ අභිමතාර්ථයන් හැකි ඉහළම අයුරින් ඉටුකර දෙමින් සපයන සේවාවන්ගේ නිරන්තර ප්‍රවර්ධනය සහිතව ISO 17025 ගුණාත්ම රීතීන් අනුව කාර්මික සේවා සැපයීමත් ISO 9000 ප්‍රමිතියට අනුව ගුණාත්ම කළමණාකරණ සේවා ඉටුකිරීමටත් ආයතනයේ සියලුම සේවක සේවිකාවන් බැඳී සිටී.

## පනත හා නීති රෙගුලාසි

කාර්මික තාක්ෂණ ආයතනය (ITI) ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. 1994 විද්‍යා හා තාක්ෂණ ප්‍රවර්ධන පනතේ අංක 11 ට අනුව, 1998 අප්‍රේල් 01 දින සිට බලපවත්වන අයුරින් ස්ථාපිත කොට ඇත. 1955 පිහිටුවන ලද ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය (CISIR) ඇවෑමෙන් කාර්මික තාක්ෂණ ආයතනය බිහි විය. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ පවත්නා, ශ්‍රී ලංකා රජයේ පූර්ණ අයිතිය ක්‍රියාකාරීත්වය හා අධීක්ෂණය ඇති කාර්මික තාක්ෂණ ආයතනය තම සේවාලාභීන් හා අනෙකුත් පාර්ශව කරුවන් වෙළඳපොල කරා මෙහෙයවන මග පෙන්වන්නෙකු ලෙස සිය කාර්යභාරය ඉටු කරයි.

## සතු බලතල හා වගකීම්

1994 දී ඉදිරිපත් කරන ලද විද්‍යා හා තාක්ෂණ ප්‍රවර්ධන පනතේ අංක 11 ට අනුව, 1998 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මකව පවත්නා අප සතු බලතල හා වගකීම් පහත දක්වා ඇත.
තාක්ෂණ ආයතනය ඉල්ලුම විසින් මෙහෙයවනු ඇත. තාක්ෂණ ආයතනයේ අභිමතාර්ථය විය යුත්තේ සීඝ්‍ර කාර්මික සංවර්ධනයක් සඳහා ශ්‍රී ලංකාවේ තාක්ෂණ ප්‍රවර්ධන කටයුතු ඉහළ තලයකට ගෙන යාමයි.

## දර්ශනය

ජාතික සංවර්ධනය උදෙසා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ක්ෂේත්‍රයේ විශිෂ්ඨ කලාපීය මධ්‍යස්ථානය ලෙස කටයුතු කිරීම.

## මෙහෙවර

ශ්‍රී ලාංකීය ජන සමාජයේ උන්නතිය සඳහා අන්තර්ජාතික තරඟකාරී නව කාර්මික පර්යේෂණ හා සංවර්ධන කටයුතු ප්‍රවේගකාරී අයුරින් පවත්වාගෙන යාම.

# පාලක මණ්ඩල හා කමිටු

**සභාපති**

මහාචාර්ය විජය කුමාර්

**සාමාජිකයින්**

ආචාර්ය ඒ එම් මුබාරක්
*අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී, කාර්මික තාක්ෂණ ආයතනය*

නිහාල් අබේසේකර මහතා
*සභාපති, ජපන් ලංකා කාර්මික සංවර්ධන මධ්‍යස්ථානය*

ජේ ඒ ජී ආනන්දරාජා මහතා
*කළමණාකාර අධ්‍යක්ෂ, ඩිජ්ඩ් ප්‍රොඩක්ට්ස් පුද්ගලික සමාගම*

ඊ ඒ රත්නසීල මහතා
*අධ්‍යක්ෂ, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව*
*මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය*

මහාචාර්ය බී එස් බී කරුණාරත්න
*අධ්‍යක්ෂ, පශ්චාත් උපාධි ආයතනය-විද්‍යා, පේරාදෙණිය*

ආචාර්ය සී ටී එස් බී පෙරේරා
*කළමණාකරන අධ්‍යක්ෂ, සැම්සන්ස් රජරට ටයිල්ස් පුද්ගලික සමාගම*

ආචාර්ය කේ පී ඒ සේනාරත්න

**විගණන කමිටුව**

ඊ ඒ රත්නසීල මහතා
*සභාපති / පාලක මණ්ඩල සාමාජික / භාණ්ඩාගාර නියෝජිත*

අචාර්ය සී ටී එස් බී පෙරේරා
*පාලක මණ්ඩල සාමාජික*

ආචාර්ය කේ පී ඒ සේනාරත්න
*පාලක මණ්ඩල සාමාජික*

රේණුකා ජයතිලක මහත්මිය
*ආයතන ලේකම් හා ලේකම්, පාලක මණ්ඩල හා විගණන කමිටුව*

# සංවිධාන ව්‍යුහය

**සභාපති**
**පාලක මණ්ඩලය**

කළමණාකරණ කමිටුව

**අධ්‍යක්ෂ (ප්‍රධාන විධායක නිලධාරී)**

ප්‍රතිපත්ති උපදේශන කමිටුව

- **ජෛව තාක්ෂණ ඒකකය (BTU)**
- **පර්යේෂණ හා සංවර්ධන අංශය (R & D)**
  - ආහාර තාක්ෂණ අංශය (FTS)
  - ශාක තාක්ෂණ අංශය (HTS)
  - ද්‍රව්‍ය තාක්ෂණ අංශය (MTS)
  - පාරිසරික තාක්ෂණ අංශය (ETS)
  - ඉංජිනේරු සේවා අංශය (ES)
- **තාක්ෂණ සේවා අංශය (TS)**
  - රසායන හා ක්ෂුද්‍රජීවී රසායනාගාරය (CML)
  - ද්‍රව්‍ය තාක්ෂණ රසායනාගාරය (ML)
  - කර්මාන්ත මිණුම් රසායනාගාරය (IML)
  - විද්‍යුත් තාක්ෂණ රසායනාගාරය (ETL)
- **තොරතුරු සේවා මධ්‍යස්ථානය (ISC)**
- **පරිපාලන හා මෙහෙයුම් අංශය (A & O)**
  - මානව සම්පත් දෙපාර්තමේන්තුව (HRD)
  - අලෙවි හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව (MBD)
  - පරිගණක ඒකකය (CU)
  - ප්‍රවාහන ඒකකය (TU)
- **මූල්‍ය දෙපාර්තමේන්තුව (FD)**
  - ගබඩාව (STO)
  - සැපයුම් (SUP)
- **තත්ව සුපරීක්ෂණ දෙපාර්තමේන්තුව (QAD)**
- **අභ්‍යන්තර විගණන අංශය (IA)**

# ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වය

**අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී**
ආචාර්ය ඒ එම් මුබාරක්

**අතිරේක අධ්‍යක්ෂ, පර්යේෂණ හා සංවර්ධන**
ආචාර්ය ජී ඒ එස් ප්‍රේමකුමාර

**අතිරේක අධ්‍යක්ෂ, කාර්මික සේවා**
ඒ එස් පන්නිල මයා

**අතිරේක අධ්‍යක්ෂ, පාලන හා මෙහෙයුම්**
ඩී සී ඒ සතෘකුලසිංහ මයා

**පර්යේෂණ හා සංවර්ධන**

ආචාර්ය ඉල්මී ජී එන් හේවාජුලිගේ
*ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ, ආහාර තාක්ෂණ අංශය*

ආචර්ය ජේ කේ ආර් ආර් සමරසේකර
*ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ, ශාක තාක්ෂණ අංශය*

ආචාර්ය අයි ආර් එම් කෝට්ටෙගොඩ
*ප්‍රධානි, ද්‍රව්‍ය තාක්ෂණ අංශය*

එච් එම් ගුණදාස මයා
*ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ, පාරිසරික තාක්ෂණ අංශය*

*ඒ එස් ආරච්චි මයා*
*ප්‍රධානි, ඉංජිනේරු සේවා*

ආචාර්ය එස් ජී සේනාරත්න
*ප්‍රධානි, ජෛව තාක්ෂණ ඒකකය*

**තොරතුරු සේවා මධ්‍යස්ථානය**
සුරනි සමරසේකර මිය
*ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ, තොරතුරු සේවා මධ්‍යස්ථානය*

**අභ්‍යන්තර විගණන අංශය**
කේ ඒ එස් පී කළුආරච්චි මයා
*ප්‍රධාන අභ්‍යන්තර විගණක*

***මූල්‍ය දෙපාර්තමේන්තුව***
ජොන්සන් සොලමන් මයා
*ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ, මූල්‍ය දෙපාර්තමේන්තුව*

**කාර්මික සේවා**

ජේ කේ ඒ බී විජේගුණසේකර මයා
*ප්‍රධානි, රසායන හා ක්ෂුද්‍රජීවී රසායනාගාරය*

ජේ එම් එස් ජයතිලක මයා
*ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ, ද්‍රව්‍ය රසායනාගාරය*

*ආචාර්ය ඩබ් එම් එස් විජේසිංහ*
*ප්‍රධානි, කාර්මික මිණුම් රසායනාගාරය*

ආර් එම් වීරසිංහ මයා
*ප්‍රධානි, විද්‍යුත් තාක්ෂණ රසායනාගාරය*

**තත්ව සුපරීක්ෂණ දෙපාර්තමේන්තුව**
එම් කේ ඩී ආර් දයාරත්න මිය
*ප්‍රධානි, තත්ව සුපරීක්ෂණ දෙපාර්තමේන්තුව*

**පරිපාලන හා මෙහෙයුම්**
*තිලක් සමරසේකර මයා*
*ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ, පාලන හා මානව සම්පත්*

*ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ,*
අලෙවි හා ව්‍යාපාර ප්‍රවර්ධන
*(පුරප්පාඩුව පවතී)*

**ආයතන ලේකම්**
ඒ එම් කේ ආර් ජයතිලක මිය

- ආචාර්ය ශාන්ති විල්සන්, BSc(Hons)(London), PhD(Cantab) අතිරේක අධ්‍යක්ෂ, පර්යේෂණ හා සංවර්ධන ලෙස 2012 ඔක්තෝම්බර් 9 දක්වා කටයුතු කරන ලදි.
- දමිතා රාජපක්ෂ මහත්මිය, BSc(Hons)(SL), MSc(Sri Jayawardhanapura) CChem, MIChemC ආහාර තාක්ෂණ අංශයේ වැඩ බලන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස 2012 පෙබරවාරි 16 සිට ඔක්තෝම්බර් 29 දක්වා කටයුතු කරන ලදි.
- ආචාර්ය ජානකී ගුණරත්න, BSc(Hons)(Allahabad), MSc(Bombay), PhD(SL), LIChemC ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස 2012 පෙබරවාරි 15 දින දක්වා කටයුතු කරන ලදි.

# සභාපතිතුමාගේ පණිවුඩය

## ආයතනයීය ඉපැයීම්

2011 වසර හා සංසන්දනාත්මකව 2012 වසර තුලදී ආයතන ආදායම රුපියල් මිලියන 158.3 සිට මිලියන 188.4 ක ප්‍රමාණයකින් 19% ක වර්ධනයක් පෙන්නුම් කරයි. පසුගිය වසර 3 සඳහා ශ්‍රී ලංකා මහා බැංකු අව ප්‍රමාණ අගයන් 2011 සඳහා 7.8% ක් ද 2012 සඳහා 8.9% ක් ද ලෙස සැලකිල්ලට ගතහොත් මෙම වසර සඳහා ලද ආදායම් ප්‍රතිශතය 10% ක් ලෙස ඉහළ ගොස් ඇති බව 2011 වසර තුල ලද අධි ප්‍රමාණ අගය වන 1.9% ක් හා සංසන්දනාත්මකව සැලකිල්ලට භාජනය කළ හැක. තාක්ෂණ සේවා අංශය දිගින් දිගටම උපරිම වර්ධන වේගයකින් සිය දායකත්වය රු. මිලියන 110.8 සිට රු. මිලියන 124.2 ක ප්‍රමාණයකින් 12.9% කින් වර්ධනය කර ගෙන ඇත. කොන්ත්‍රාත් පදනම මත දියත් කළ ව්‍යාපෘති වෙතින් ලද ආදායම 2011 වසරේ පැවති රු. මිලියන 4.5 සිට 8.1 දක්වා වර්ධනය වී ඇති අතර තාක්ෂණ හුවමාරු වෙතින් ලද ආදායම 2011 වසරේ පැවති රු. මිලියන 1.7 සිට රු. මිලියන 2.8 දක්වා වර්ධනය වී ඇත. කෙසේ වෙතත් 0.61 ලෙස 2011 වසරේදී ඉහල අගයක පැවති ආදායම හා ප්‍රතිපූරක වියදම් අනුපාතය 2012 වසරේදී 0.6 ලෙසට පහත බැස ඇත. නව වැටුප් පටිපාටිය ක්‍රියාත්මක කිරීම තුලින් පුද්ගල වැටුප් හා දීමනා 2012 වසර තුලදී 21% රු. මිලියන 35.8 කින් ඉහළ යාම මගින් මුළු ප්‍රතිපූරක වියදම් 20% කින් ඉහළ යාම තුළින් පවත්නා උද්ධමනකාරී ආර්ථික රටාව විදහා පායි. ඒක සේවක වියදම් 20% කින් ඉහළ ගිය ද එක් සේවකයෙකු විසින් ඉපැයූ සාමාන්‍ය ආදායම් ප්‍රමාණය 19.6% ක ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇති බව මා සතුටින් ප්‍රකාශ කර සිටින්නේ ඵලදායිතාවයේ පවත්නා වර්ධන ප්‍රමාණය සැලකිල්ලට ගැනීමෙනි.

මාලබේ ඉදි කෙරෙන කාර්මික තාක්ෂණ ආයතන නව ගොඩනැගිලි සංකීර්ණයේ පරිපාලන අංශ ගොනැගිල්ල මෙන්න ආහාර තාක්ෂණ අංශ ගොඩනැගිල්ලේ සියළු ඉදි කිරීම් කටයුතු අවසන් අදියරේ පවතින අතර, ආහාර තාක්ෂණ අංශය සඳහා වෙන් කෙරෙන අතිරේක මහල් ඉදි කිරීම සඳහා සැකිල්ල කාර්මික තාක්ෂණ ආයතනය විසින් උපයා ගත් ආදායම් භාවිතයෙන් නිම කරන ලදී. චන්ද්‍රිකා කුමාරනතුංග මාවතේ සිට ඇති පිවිසුම් මාර්ගය මෙන්ම පාලමක් ද අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීමෙන් පසු මේ වන විට ඉදි කරමින් පවතී. උසස් ද්‍රව්‍ය තාක්ෂණ අංශය ඉදි කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන බලාපොරොත්තු වූ පරිදි බාහිර අරමුදල් මේ වන තෙක් සොයා ගැනීමට ආයතනයට නොහැකි වී ඇත. පරිපාලන ගොඩනැගිල්ලේ දෙවන අදියර සඳහා ටෙන්ඩර් පටිපාටිය ක්‍රියාත්මක වෙමින් පවතී.

පර්යේෂණ කාර්ය මණ්ඩලය සඳහා පිරිනැමෙන රාජ්‍ය වැටුප් පරිමාන තරඟකාරී ස්ථානයක නොපවතින හෙයින් ආයතනයට අවශ්‍ය දක්ෂතා සහිත ප්‍රමිතියක් ඇති සේවක මණ්ඩලයක් ආයතනය වෙත ආකර්ෂණය කර ගැනීමේ හැකියාව මේ වන තුරු ද පිරිමසා ගැනීමට නොහැකි වී ඇත. පර්යේෂණ දීමනා මෙන්ම පර්යේෂණ තුලින් ලැබෙන ඉපයීම් මගින් ගෙවීම් සිදු කිරීමට අවශ්‍ය අඩිතාලම් සකස් කල ද පසුව සඳහන් කල දීමනාව පමණක් ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබී ඇත.

# සභාපතිතුමාගේ පණිවුඩය

එමගින් ඇති වූ බලපෑම එතරම් බලවත් වූවක් ලෙස සැලකීල්ලට ගත නොහැකිව ඇත්තේ පර්යේෂණ නිලධාරීන්ගේ ගණන 2010 දී අඩු වූ 79% ක ප්‍රමාණය 2011 වසරේ දී 11% කින් පමණක් අඩු වීමත් 2012 වසරේ දී එය නොවෙනස්ව පැවතීම හේතුවෙනි. මේ අතර තාක්ෂණ කාර්ය මණ්ඩලය 2011 සිට 2012 දක්වා 14% කින් අඩු වුවද තාක්ෂණ නොවන ශ්‍රේණිවල 10% ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

ප්‍රවණතා පදනම මත ගෙවන පාරිතෝෂික දීමනාව හා විද්‍යාඥයින් සඳහා පිරිනැමූ ප්‍රමාණ හා පාරිතෝෂික දීමනාව ද ආයතනය විසින් ක්‍රියාත්මක කරන ලදී. සේවක සහසම්බන්ධතා හොඳින් පවත්වා ගෙන යන ලදී. අන්තර් ජාතික හා දේශීයව ප්‍රතීතකරණය සහිත රසායනාගාර සේවාවක් විවිධ ක්ෂේත්‍ර සඳහා සපයමින් කාර්මික තාක්ෂණ ආයතනය නිරන්තරව ශ්‍රී ලාංකීය කර්මාන්ත වෙත ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරන ලදී. මෙම සේවාවන් අතර ස්වීඩන් ප්‍රතීතකරණ ආයතනය විසින් ප්‍රතීතකරණය කල සේවාවන් 77 ක් මෙන්ම දේශීය SLAB ආයතනය විසින් ප්‍රතීතකරණය කල සේවා 98 කි. විවිධ පරාසයක මිනුම් සඳහා ශ්‍රී ලාංකීය කර්මාන්ත ආයතන වෙත ආයතනය ක්‍රමාංකන සේවා සපයමින් සහාය දක්වන ලදී. අන්තර්ජාතිකව තම ප්‍රතිරූපය ප්‍රවර්ධනය කර ගනිමින් ඉහත සේවා විදේශීයව ද සැපයූ අතර, ක්ෂුද්‍රජීවීමය විශ්ලේෂණ විදේශීය විද්‍යාඥයින් සඳහා සැපයීමට ද හැකි වී ඇත.

කාර්මික තාක්ෂණ ආයතනය රට තුල පැවති අර්බුදකාරි තාක්ෂණික ප්‍රශ්ණ පිළිබඳව මෙන්ම කර්මාන්ත ක්ෂේත්‍රය මුහුණ දුන් විවිධාකාර ගැටළු ක්‍රමාංකන සඳහා ද විසඳුම් නිරන්තරව සපයන ලදී. මෙම ක්‍රියාදාමයන් හා වැදගත් කාර්යභාරයන් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු වාර්ෂික වාර්තාවේ සටහන් කර ඇත. පාරිසරික ගැටළු පිළිබඳව ද විශේෂ උනන්දුවක් දක්වමින් කර්මාන්ත සඳහා පාරිසරික නිරීක්ෂණ කටයුතු හා වැලකුම් ක්‍රියාමාර්ග ඉදිරිපත් කරමින් කර්මාන්ත සඳහා ප්‍රමුඛ කාර්යභාරයක් ආයතනය විසින් ඉටු කරන ලදී.

වාර්තාවේ සවිස්තරාත්මකව දක්වා ඇති මෙම කරුණු අතර ශබ්ද හා කම්පන දූෂණ තත්ත්ව, නව නිෂ්පාදිත නෞකා, වායුගෝලීය වා විසිරුම්, ඝන අපද්‍රව්‍ය හා අපජල කළමනාකරණ ක්ෂේත්‍ර මූලිකව සිදු කරන ලද සේවාවන් අතරින් විශේෂිතය.

ප්‍රධාන විධායක නිලධාරි, අධ්‍යක්ෂ ආචාර්ය අසීස් මුබාරක් මහතා අගය කල යුතු නායකත්වයක් ආයතනයට ලබා දුන් අතර ඔහු සමග සේවය කිරිම මහත් ආශ්වාදජනක අත්දැකීමක් විය. මම ඔහුට ස්තුති කරන අතර ම දේශීය කර්මාන්ත සමඟ යහපත් සම්බන්ධතා දැඩි ලෙස පවත්වා ගනිමින් දිවයිනේ ප්‍රමුඛ කාර්මික පර්යේෂණ ආයතනය ලෙස කාර්මික තාක්ෂණ ආයතනය හොබවන සුවිශේෂී ස්ථානය ආරක්ෂා කරගනිමින් ආයතනයීය කාර්යභාරය මැනවින් ඉටු කරන ආයතන කාර්ය මණ්ඩලය හා කළමනාකරණ සේවයට මාගේ හදපිරි ස්තුති ප්‍රණාමය පුදකර සිටිමි.

විජය කුමාර් (මහාචාර්ය)
සභාපති

# විධායක වාර්තාව

සමීක්ෂණයට ලක් කෙරෙන වසර තුලදී ආයතනය විසින් සිදුකරන ලද පර්යේෂණ හා කාර්මික සේවාවන් අතුරින් සැලකිල්ලට ගත යුතු වැදගත් යැයි සැලකිය හැකි කරුණු සමහරක් පමණක් මෙහි සඳහන් කර ඇත.

## කර්මාන්ත ක්ෂේත්‍ර ප්‍රවර්ධනය උදෙසා සිදුකරන ලද පර්යේෂණ හා සංවර්ධන කටයුතු

### තාක්ෂණ හුවමාරු

"ඔමෙගා තුන" මේද අම්ල වෙතින් අධිපෝෂණය කරන ලද බිත්තර නිෂ්පාදනය සඳහා යොදාගත හැකි තාක්ෂණ ප්‍රවර්ධනය සඳහා ආරෝග්‍යා ෆාම් පුද්ගලික සමාගම සමඟ තනි අයිතිය සහිත එකඟතා ගිවිසුමකට අත්සන් තබන ලදි. බෝ නොවන රෝග මර්ධනය කිරීමේ දී අධි කොලෙස්ටරෝල් ප්‍රමාණ සහිත ආහාර පාලනය උග්‍ර අර්බුදකාරී තත්වයක් ශ්‍රී ලංකාවට මෙන්ම ගෝලීය වශයෙන් ද උද්ගතව ඇත. "ඔමෙගා 3" වැඩි ප්‍රමාණයක් සහිත බිත්තර සිරුරේ කොලෙස්ටරෝල් ප්‍රමාණය අවම තත්වයකට පත් කිරීමට හැකි ප්‍රධාන සාධකයකි.

ට්‍රොපික් ෆුඩ්ස් පුද්ගලික සමා වෙත බෝතල් කරන ලද තැඹිලි නිෂ්පාදන තාක්ෂණය හුවමාරු කරන ලදි. තැඹිලි වතුරෙහි පවත්නා අධි පොටෑසියම් හා ලවණ ප්‍රමාණය නිර්ජලීය තත්වය පාලනය සඳහා ප්‍රතිකර්මයක් මෙන්ම සිසිල් බීමක් ලෙස තැඹිලි ජනප්‍රිය පානයකි. බෝතල් කරන ලද සිසිල් බීම වර්ගයක් ලෙස ලෝක වෙළඳපොලෙහි අධි ඉල්ලුමක් සහිත නිෂ්පාදනයක් ලෙස මෙය නම් කල හැක. මීට අමතරව තවත් තාක්ෂණ හුවමාරු 5 ක් පුද්ගලික අංශය වෙත පැවරීමට වසර තුල ආයතනය සමත්ව ඇත. මේ අතර ගවර් ස්ට්‍රීට් හෝල්ඩින්ග් පුද්ගලික සමාගම වෙත රස කරන ලද අයිසොටොනික බීම විශේෂයක්, ඉස්සන්ගේ පොතු යොදා චිටෝසාන් නිස්සාරණ තාක්ෂණය, සීමාසහිත එස්කොසෑන් පුද්ගලික සමාගම වෙත ද, කීල්ස් ෆුඩ් ප්‍රොඩක්ට්ස් පුද්ගලික සමාගම වෙත (KFC) ක්ෂණික බත් නිෂ්පාදන හා සැකසුම් ක්‍රමවේද තාක්ෂණය මෙන්ම වාණිජ නිෂ්පාදනයක් ලෙස පෙක්ටීන් නිෂ්පාදන තාක්ෂණය මැජෙස්ටි නැචුරල් ෆුඩ් ඇන්ඩ් කෙමිකල් එක්ස්පෝට් පුද්ගලික සමාගම වෙත පවරා දෙන ලදි.

වසර තුලදී කාර්මික තාක්ෂණ ආයතනය අපජල ප්‍රතිකාරක යන්ත්‍ර 2 ක් ක්‍රියාත්මක යන්ත්‍ර ලෙස සාර්ථක ලෙස ස්ථාපිත කරන ලදි. ඉන් එකක් ප්‍රීම් ඉන්ටවේක් ශ්‍රී ලංකා පුද්ගලික සමාගම, මාස් හෝල්ඩිංග් සමූහ ව්‍යාපාරය වෙත සාර්ථක ලෙස නිර්මාණය කල අතර අපජලයේ පැවති වර්ණක ඉවත් කිරීම සඳහා ප්‍රතිකාරක යන්ත්‍ර සැපයීමට ද හැකි විය.
පෙර හිඟුරාන සීනි කර්මාන්තායතනය ලෙස හැඳින් වූ දැනට ගල්ඔය වතු සමූහ ව්‍යාපාර පුද්ගලික සමාගම වෙත අපජල ප්‍රතිකාරක යන්ත්‍රසූත්‍ර සැපයීම මගින් සීනි නිෂ්පාදනයේදී ඊට සමාන්තරව ක්‍රියාත්මක කෙරෙන ආසවනය හේතුකොට ගෙන ජනිත වන අධි සාන්ද්‍රිත අපජල ප්‍රමාණය හේතුවෙන් සිදුවිය හැකි භූගත ජල අපවහන හේතුවෙන් පාරිසරික හානි තත්වයන් වැලැක්වීමට කටයුතු සම්පාදනය කරන ලදි.

# විධායක වාර්තාව

වා දූෂණය, අප ජල අපවහන ප්‍රතිකාරක යන්ත්‍ර, දහනය හේතුකොට සිදුවන පාරිසරික වැලකුම් පාලක කටයුතු, විෂ අපද්‍රව්‍ය කළමණාකරණ කටයුතු, ඇතිවන ආපදා තත්වයන් වෙතින් සිදුවිය හැකි අනතුරු ඇගයීම් හා පාරිසරික කළමණාකරණය ද ඊට ඇතුලත් වේ.

## කුඩා හා ක්ෂුද්‍ර ව්‍යවසායකයින්ගේ තත්වයන් විද්‍යා හා තාක්ෂණය භාවිතා කොට සිදුකල ප්‍රවර්ධන කටයුතු

ගැමි ආර්ථිකය ඉහල තලයකට ගෙන ඒමට රජය මගින් දියත් කර ඇති විදාතා හා දිවිනැගුම වැඩසටහන් සඳහා නිරංතර සහයෝගය දෙමින් ආයතනය අවශ්‍ය කටයුතු නොපිරිහෙලා ඉටු කරන ලදි. වසර තුලදී විදාතා සම්පත් මධ්‍යස්ථාන නිලධාරීන් ගණනාවක් වෙත විශේෂ පුහුණු කිරීමේ සාමාර්ථතා සහතික තාක්ෂණ ක්‍රමවේද ගණනාවක් සඳහා පිරිනමන ලදි. ඖෂධීය අමුද්‍රව්‍ය සඳහා අගය වැඩි කිරීම, පසු අස්වනු තාක්ෂණ ක්‍රම, සෝයා මාංශ රසකාරක හා කුළුබඩු නිෂ්පාදන, නියැදි පරීක්ෂාව හා සෞඛ්‍ය ආරක්ෂණ පුරුදු, හතු වගාව, කිරි නිෂ්පාදන, සහල් නිෂ්පාදන, පලතුරු සැකසීම, ජෑම් වර්ග නිෂ්පාදනය, කෝඩියල් වර්ග හා ක්ෂණික බීම වර්ග, මත්ස්‍ය නිෂ්පාදන, දියරමය අත් ශෝධක, මදුරු විකර්ශක කූරු, පාරදෘශ්‍ය ප්ලාස්ටික් යෙදූ විසිතුරු භාණ්ඩ, රෙදි මෘදුකාරක හා පැස්ටල්, ක්‍රෙයෝන් නිෂ්පාදන ආදිය සඳහා තාක්ෂණ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

මන්නාරම, රත්නපුර, මහනුවර, පොලොන්නරුව, වව්නියාව, බදුල්ල, මාතලේ, ගාල්ල, මුලතිව්, පුත්තලම, කොළඹ, යාපනය, ගම්පහ, අනුරාධපුර, කෑගල්ල හා හම්බන්තොට ආදී පළාත් වලදී 1000 කට අධික පිරිසක් දිවි නැගුම වැඩසටහන යටතේ පුහුණු කරන ලදි. මේ සඳහා මූල්‍ය ආධාර හා සම්පත් දායකත්වය දිවි නැගුම වැඩසටහන් ත්‍රිත්වයක් තුලින් එනම් දිවි නැගුම සුවතා වැඩසටහන, දිවි නැගුම පුහුණු, දිවි නැගුම බැංකු සායන වැඩසටහන් වෙතින් සපයන ලදි.

## අන්තර්ජාතික තරඟකාරී තාක්ෂණ සේවා සැපයුම්

## කර්මාන්ත ක්ෂේත්‍රයේ තරඟකාරී ස්වභාවය ප්‍රවර්ධනය

දිවයිනෙහි ඇති ප්‍රධාන පෙලේ ප්‍රතීතකරණය සහිත පරීක්ෂණ හා ක්‍රමාංකන රසායනාගාරය ලෙස කාර්මික තාක්ෂණ ආයතන පරීක්ෂණ හා ක්‍රමාංකන සේවාවන් 16000 කට අධික ප්‍රමාණයක් සේවාලාභීන් 2300 කට අධික ගණනකට නීති සම්පාදක ආයතන එනම් CEA, BOI, කෘමිනාශක ලියාපදිංචි, ධීවර දෙපාර්තමේන්තුව, පොහොර ලේකම් කාර්යාලය, රේගුව, තේ මණ්ඩලය වැනි ආයතන ද ඇතුලුව සපයන ලදි. මීට අමතරව රසායනාගාර QMS, කාර්මික මිණුම්කරණය, ආහාර සුරක්ෂිතභාවය (HACCP), ISO 17025, ISO 15819 (වෛද්‍ය පරීක්ෂණ සේවා) මෙන්ම පර්යේෂණ හා කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා ද සපයන ලදි.

# විධායක වාර්තාව

ISO/TEC 17025 ප්‍රතීතකරණ තත්වය SWEDEC හා SLAB ආයතන වෙතින් විවිධ පරාමිතීන් සඳහා පරීක්ෂණ කටයුතු මෙහෙයවීමේ කුසලතා නිරංතරව ආරක්ෂා කරගනිමින් කටයුතු කරන ලදි. ශබ්ද ප්‍රමාණ මැන බැලීම සඳහා SLAB ආයතනයේ ප්‍රතීතකරණය සහිතව ඉටුකරදීමට පවත්නා කුසලතාවන් ද ආරක්ෂා කරගනිමින් සේවා ඉටුකරන ලදි. ISO 9001 : 2008 ප්‍රමිතිකරණය සහිත තොරතුරු සේවා මධ්‍යස්ථාන හා පර්යේෂණ හා සංවර්ධන රසායනාගාර සිය කටයුතු නිරංතරව මෙහෙයවන ලදි.

කාර්මික තාක්ෂණ ආයතනය මෙම වසර තුලදී විදේශීය ව්‍යාපාරික සේවාවන් ඉටුකරමින් මාලදිවයින් ජනරජයේ හා සෞඛ්‍ය රසායනාගාරය වෙත එහි ක්‍රමාංකන සේවා ඉටුකරදෙන ලදි.

ප්‍රමුඛ පෙලේ රෝහල් හා අනුබද්ධ වෛද්‍ය රසායනාගාර ගණනාවකට ක්‍රමාංකණ සේවා සැපයීම මගින් රෝගීන් වෙත නිකුත් කෙරෙන වෛද්‍ය වාර්තාවන්ගේ නිරවද්‍යතාව සුරැකීම සඳහා දායකත්වය සපයන ලදි.

කාර්මික තාක්ෂණ ආයතනයේ සිදුකරනු ලබන පරීක්ෂණ සේවාවන්ගේ ප්‍රවීණතාව ස්වාධීනව ඇගයීම සඳහා තෙවන පාර්ශවයක් වෙතින් සිදුකරණ ප්‍රවීනතා ඇගයුම් පරීක්ෂණ (Proficiency testing) රසායන, ක්ෂුද්‍රජීවී, ද්‍රව්‍ය විශ්ලේෂණ හා ක්‍රමාංකන මිණුම් ක්ෂේත්‍ර සඳහා පවත්වන ලදි.

## සමාජ යහපැවැත්ම, සෞඛ්‍ය, පෝෂණ හා පාරිසරික තත්වයන් ඉහල නැංවීම

පාරිභෝගික ආරක්ෂණය හා සුභසාධනය උදෙසා ජාතික වශයෙන් වැදගත් ගැටළු සහගත තත්වයන් සමථ කිරීම සඳහා ආයතනය සතු බුද්ධිමය සම්පත් උපයෝගී කරගනිමින් නොපිරිහෙලා ඉටුකරන ලදි.
කරදියන ප්‍රදේශයේ කසල අපද්‍රව්‍ය බලශක්තියට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා කාර්මික තාක්ෂණ ආයතනය තම සේවා සැපයූ අතර, යාපනය දිස්ත්‍රික්කයේ සිමෙන්ති හා බලශක්ති ව්‍යාපෘතීන් මෙන්ම හම්බන්තොට කලාපීය සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු සඳහා ශබ්ද හා කම්පන මිණුම් ලබාදීමෙන් ද සහාය දක්වන ලදි.

ග්‍රාමීය ජනතාවගේ මූලික එදිනෙදා අවශ්‍යතා වැඩිදියුණුව සඳහා අවශ්‍ය සේවාවන් ස්ථාපනය කිරීම උදෙසා දරාගත හැකි මිලකට තාක්ෂණ ක්‍රම දියත් කරමින් අවශ්‍ය පර්යේෂණ හා සංවර්ධන කටයුතු දියත් කරන ලදි. ඒ අතර කසල අපද්‍රව්‍ය යොදාගනිමින් සිදුකල ව්‍යාපෘති ගණනාවකි. බැක්ටීරියා හා කාබනික අපද්‍රව්‍ය මගින් අපවිත්‍ර වූ ජලය පිරිසිදු කිරීම සඳහා සූර්ය බලශක්තිය මගින් නොකඩවා ක්‍රියාත්මක කෙරෙන අඩු වියදම් ප්‍රතිකාරක යන්ත්‍ර, ජාඩි නිෂ්පාදනයන්හි ගුණාත්මක බව ඉහල නැංවීම, ආහාර කර්මාන්තය සඳහා සියඹලා ඇට භාවිත කොට නිෂ්පාදිත පෙක්ටීන්, රතු මැටියෙන් තැනූ මිල අඩු ජල පෙරණ ආදිය සඳහා තාක්ෂණ ක්‍රම මෙන්ම පරීක්ෂණ සේවා ඒ අතර විය. එසේම ජාතික වශයෙන් වැදගත් තාක්ෂණ සේවාවන් වැල්ලවත්ත ඇල මාර්ගයේ ඇති රොන්මඩ තුල පවත්නා විෂ ප්‍රමාණ නිර්ණය කිරීම හා දකුණු මුහුදු වෙරල තීරයේ වැලි පිළිබඳව සමාජයීය සංවර්ධනය උදෙසා පරීක්ෂණ සේවා පවත්වන ලදි.

# විධායක වාර්තාව

## කාර්මික තාක්ෂණ ආයතනයේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු නව ප්‍රවණතා සහිතව

## මාලඹේ තොරතුරු තාක්ෂණ උද්‍යානයේ ඉදිවන නවීන කාර්මික තාක්ෂණ ආයතනයීය පර්යේෂණ හා සංවර්ධන සංකීර්ණය

ජෛව තාක්ෂණ සංකීර්ණයේ බිම් මහලේ මෙන්ම පළමු හා දෙවන මහලේ ඉදිකිරීම් 2KR කෘෂි හා ආහාර තාක්ෂණ ව්‍යාපෘතිය තුලින් මේ වන විට අවසන් කර ඇති අතර රසායනාගාරයේ අදාල වෙනත් ඇතුලත සවිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා පියවර ගෙන ඇත. කාර්මික තාක්ෂණ ආයතනයීය මූල්‍ය ආධාර යොදාගනිමින් ජෛව රසායනාගාරයේ තෙමහල් ගොඩනැගිල්ලේ කටයුතු අවසන් වෙමින් පවතී. උසස් ද්‍රව්‍ය තාක්ෂණ සංකීර්ණය ඉදිකිරීම සඳහා අවශ්‍ය මූල්‍ය ආධාර දායකත්වය අපේක්ෂාවෙන් සංශෝධිත ව්‍යාපෘති වාර්තාවක් NPD ආයතනය වෙත ඉදිරිපත් කර ඇත.

## ප්‍රවර්ධිත පර්යේෂණ හා සංවර්ධන ධාරිතා

පර්යේෂණ කටයුතු සඳහා පශ්චාත් උපාධි මගින් ඇති කෙරෙන පිටිවහල මනාව හඳුනාගනිමින් කාර්මික තාක්ෂණ ආයතනය විද්‍යාඥයින් හා ඉංජිනේරු ක්ෂේත්‍ර සඳහා පශ්චාත් උපාධි වැඩසටහන් දිරිගැන්වීමට නිරංතරව කටයුතු කරයි. වසර තුල එක් පර්යේෂණ නිලධාරියෙකු පශ්චාත් ආචාර්ය උපාධිය ජපානයේදී සම්පූර්ණ කර ඇති අතර තවත් පර්යේෂකයෙකු වෙත දේශීය විශ්ව විද්‍යාලයක් වෙතින් ආචාර්ය උපාධිය පිරිනමා ඇති අතර තවත් 5 දෙනෙකු ආචාර්ය උපාධිය සඳහා ද 8 දෙනෙකු විද්‍යාපති හා දර්ශනවේදී (M.Phill) උපාධි සඳහා ලියාපදිංචි වී ඇත. තවත් 6 දෙනෙකු පශ්චාත් උපාධි පාඨමාලා කටයුතු සිදුකරගෙන යමින් සිටින අතර ආහාර තාක්ෂණ, පසු අස්වනු තාක්ෂණ, කාර්මික ක්ෂුද්‍රජීවී විද්‍යා, ඖෂධ පැලෑටි හා ද්‍රව්‍ය තාක්ෂණ ක්ෂේත්‍රයන්හි එම අධ්‍යයන කටයුතු සිදුකරමින් පවතී.

## ප්‍රකාශන, පේටන්ට් බලපත්, සම්මාන හා ඇගයීම්

වසර තුලදී විනිශ්චයට ලක් වූ ප්‍රකාශනයන්ගේ සංඛ්‍යාවේ සුවිශේෂී වර්ධනයක් පෙන්වමින් පර්යේෂණ වාර්තා 16 ක් ප්‍රකාශයට පත් කිරීමට හැකි වී ඇත. අප විසින් සිදුකල එක් නව සොයාගැනීමක් වන "ස්වයං පවිත්‍රක මෙන්ම ක්ෂුද්‍රජීවී විකර්ෂණ පිඟන් ගඩොල" සඳහා පේටන්ට් බලපත්‍රයක් හිමිකරගත් අතර දේශීයව තවත් ඉල්ලුම්පත් 6 ක් ඉදිරිපත් කිරීමට හැකි වී ඇත.

# විධායක වාර්තාව

## මානව සම්පත්

කාර්මික තාක්ෂණ ආයතනයේ දීර්ඝ කාලයක් නොසැලෙන සේවයක් කල අතිරේක අධ්‍යක්ෂක (පර්යේෂණ හා සංවර්ධන) ආචාර්ය ශාන්ති විල්සන් මිය හා ආහාර තාක්ෂණ අංශ වැඩබලන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ දමිතා රාජපක්ෂ මහත්මිය තම සේවයෙන් විශ්‍රාම ගන්නා ලදි. තිලක් සමරසේකර මහතා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂක / පරිපාලන හා මානව සම්පත් ධූරයට පත් කරන ලදි. අංශ ප්‍රධාන තනතුරු ගණනාවක් කාර්මික මිණුම් රසායනාගාරය, තත්ව ආරක්ෂණ දෙපාර්තමේන්තුව, ද්‍රව්‍ය තාක්ෂණ අංශය, ජෛව තාක්ෂණ ඒකකය හා ඉංජිනේරු සේවා අංශ ප්‍රධාන තනතුරු තවමත් පුරප්පාඩුව පවතී.

වසර තුල පර්යේෂණ හා ඉංජිනේරු විද්‍යාඥයින් 23 දෙනෙකු නව පත්වීම් සමඟ පත් කල අතර 4 දෙනෙකු ඉල්ලා අස් විය. උසස් තත්වයෙන් යුතු උපාධිධාරීන් බඳවා ගැනීම හෝ රඳවා ගැනීම දිනෙන් දින අපහසු කාර්යයක් වී ඇති අතර එවැන්නක් සඳහා විශ්ව විද්‍යාල හා රාජ්‍ය සංස්ථා සඳහා බඳවා ගන්නා උපාධිධාරීන් වෙනුවෙන් පිරිනමන උසස් වැටුප් තල හා වෙනත් දීමනා හා සන්සන්දනාත්මකව විද්‍යාඥයින් හා ඉංජිනේරු වෘත්තීන් සඳහා පිරිනමන වැටුප සමඟ කාර්මික තාක්ෂණ ආයතනයීය වැටුප් තල කොහෙත්ම ගැලපිය නොහැකි තත්වයක පැවතීම එයට ප්‍රධානතම හේතුව වශයෙන් සඳහන් කල හැක. වසර හතරකට ඉහතදී ආයතනයේ ආචාර්ය උපාධිධාරීන් 14% ක් හා 40% ක් දර්ශනපති උපාධි හිමියන් පර්යේෂණ කාර්ය මණ්ඩලය සතු විය. එය 2012 වසර තුල 17% හා 39% ප්‍රතිශතයකින් වෙනස් වී ඇත. ආචාර්ය උපාධි හා දර්ශන උපාධි සහිත විද්‍යාඥයින් හා ඉංජිනේරු වරුන්ගේ ගණන නිරංතරව අඩු ගණනක් වූ අතර මෙයට ප්‍රධාන හේතුව ලෙස තරුණ උපාධිධාරීන් පුහුණු කිරීමට අවැසි පරීක්ෂණ නිලධාරීන්ගේ හිඟය මෙන්ම පශ්චාත් උපාධි (පර්යේෂණ) සඳහා ඇති අවස්ථා සීමාසහිත වීම පෙන්වා දිය හැක. ඉහල තත්වයේ පශ්චාත් උපාධි ලබා ගැනීම සඳහා ඇති අවස්ථා අඩු වීමත්, තරුණ උපාධිධාරීන් නව විද්‍යාත්මක ක්ෂේත්‍ර වෙත පුහුණු කිරීම සඳහා උසස් තත්වයේ පුහුණු පරීක්ෂණ නිලධාරීන් ආයතනය තුල නොමැති වීමත්, ආචාර්ය හා දර්ශනපති උපාධි හිමි නිලධාරීන්ගේ ප්‍රතිශතනය නිරංතරව අවම ප්‍රමාණයක් වීමට හේතු සාධක වී ඇත.

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙතින් තරුණ විද්‍යාඥයින් හා ඉංජිනේරුවන් වෙනුවෙන් පිරිනමන ශිෂ්‍යත්ව කිහිපයක්, 40 කට නොඅඩු පිරිසක් උදෙසා කොහෙත්ම ප්‍රමාණවත් නොවේ. උසස් තත්වයේ පර්යේෂණ කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය දිගු කාලීන විදේශීය උපාධි හා ඉහල දැනුමක් සහිත පර්යේෂකයින් පරිසක් නොමැතිව රට තුල අනාගත අභිවෘද්ධිය සඳහා අවශ්‍ය උසස් නව තාක්ෂණ ප්‍රවණතා වර්ධනය කිරීම අසීරු වනු ඇත.

## සේවක සබඳතා හා සුභ සාධන කටයුතු

කාර්ය මණ්ඩලයේ නිපුණතා වර්ධනය කිරීම සඳහා අවශ්‍ය ICT දැනුම, ව්‍යාපාරික ඉංග්‍රීසි හා ලේඛන ප්‍රවණතා පුළුල් කිරීම උදෙසා පුහුණු වැඩසටහන් ගණනාවක් වසර තුලදී දියත් කරන ලදි.

# විධායක වාර්තාව

සුභ සාධක සංගමය, බෞද්ධ සංගමය සමඟ ඒකාබද්ධව විරාගත සම්ප්‍රදායානුකූලව නව වසර උත්සවාකාරයෙන් සමරණ ලදි. අප පිරිමි ක්‍රිකට් කණ්ඩායම ක්‍රිකට් තරඟ 7 ක් සඳහා සහභාගී විය. සේවා වනිතා ඒකකය මගින් සුපුරුදු පරිදි ආධාර ලැබිය යුතු සේවකයින්ගේ දරු දැරියන් වෙත පාසැල් පොත් පරිත්‍යාග කිරීම මෙන්ම නත්තල් හා අවුරුදු උත්සව සමරමින් භාණ්ඩ අඩු මිලට මිලදී ගැනීම සඳහා පොල සංවිධානය කරන ලදි.

තවද ජාතික රෝහලේ දන්ත ඒකකය සම්බන්ධ කරගනිමින් සේවකයින් සඳහා දන්ත සායනයක් අනුග්‍රාහක මිලකට සංවිධානය කරන ලදි. අධ්‍යාපන කටයුතු වලදී සාමාර්ථතා පෙන්වූ සේවක දරු දැරියන් සඳහා මුදල් තිළිණ ප්‍රධානය කරමින් පොත් පත් බෙදාදෙන ලදි. නොකඩවා 5 වැනි වතාවටත් වෙසක් පහන් කූඩු තරඟය මෙම වසරේ ද පවත්වන ලදි. ක්‍රිස්තියානි සංගමය මගින් චාරිත්‍රානුකූල නත්තල් සාදය කැරොල් ගායනා පවත්වමින් කාර්මික තාක්ෂණ ආයතනයීය සේවකයින්ගේ දරු දැරියන් වෙත ත්‍යාග ප්‍රදානය කරන ලදි.

## මූල්‍ය ප්‍රවණතා

රාජ්‍ය අනුග්‍රහය යටතේ පිරිනැමෙන ප්‍රතිපාදන අඩු වූ අතර ප්‍රාග්ධන ප්‍රදානයන් පසුගිය වසරේ අයවැයට සාපේක්ෂව වැඩි ප්‍රමාණයක් විය. ප්‍රතිපාදන ප්‍රදාන සුළු වශයෙන් මිලියන 162 සිට 169 දක්වා අඩු වුවද ප්‍රාග්ධන ප්‍රදානයන් මිලියන 141 සිට 97.2 දක්වා අඩු විය.

2011 දී පැවති රු. මිලියන 158.5 ක ආයතන ඉපැයීම් 2012 දී රු. මිලියන 188.4 දක්වා 19% වැනි සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි කර ගැනීමට සමත් වුවද ප්‍රතිපාදන වියදම් ඉහල යමින් ආදායම / ප්‍රතිපාදන වියදම් රු. මිලියන 261 සිට 314.3 දක්වා ඉහල යමින් 20.4% වර්ධනයක් පෙන්නුම් කරයි.

ඉහල යමින් පැවති ප්‍රතිපාදන වියදම් අනුපාතය 61% සිට 60% දක්වා පහල ගොස් ඇත. පරීක්ෂණ හා ක්‍රමාංකන සේවා වෙතින් ලද ආදායම 12.1% (රු. මිලියන 124.2) ප්‍රමාණයක් මුළු ආදායමට දායක වී ඇති අතර 2012 වසරේදී කොන්ත්‍රාත් හා උපදේශන සේවා වෙතින් ලද ආදායම 2011 වසරේ පැවති මිලියන 12.5 මේ වසරේදී 18.2 දක්වා ඉහල ගොස් ඇත. තාක්ෂණ පැවරුම් වෙතින් ලද ආදායම පසුගිය වසරේ පැවති රු. මිලියන 1.7 ක මුදල රු. මිලියන 2.8 දක්වා සුළු ප්‍රමාණයකින් ඉහල ගොස් ඇත.

එක් සේවකයෙකු විසින් උපයන ලද සාමාන්‍ය ආදායම සුළු වශයෙන් ඉහල අගයක් පෙන්නුම් කරමින් පසුගිය වසරේ පැවති රු. 481,800/- ක ප්‍රමාණය වසර තුල රු. 576,300 දක්වා ඉහල ගිය අතර වසර තුල එක් සේවකයෙකු වෙනුවෙන් දැරූ පිරිවැය රු. 793,500/- සිට රු. 961,162/- දක්වා ඉහල ගොස් ඇත. වසර තුල ඉලක්කගත ආදායම ළඟාගර ගැනීමට ලද හැකියාව මත නොකඩවා 9 වන වරටත් සේවකයන් සඳහා ප්‍රසාද දීමනා පිරිනමන ලදි.

# විධායක වාර්තාව

ආයතනය උපයා ගනු ලබන ආදායමෙන් වැඩි ප්‍රතිශතයක් තවමත් පරීක්ෂණ හා ක්‍රමාංකන සේවා වෙතින් ලැබෙන අතර තාක්ෂණ හුවමාරු හා පර්යේෂණ සංවර්ධන ක්‍රියා වෙතින් ලැබෙන ආදායම 5% ක පමණ ප්‍රමාණයක් පමණි. එමගින් රට තුල තවමත් සංවර්ධන පර්යේෂණ කටයුතු සඳහා පවත්නා ඉල්ලුමේ අව ප්‍රමාණය පැහැදිලි වේ. ද්විත්ව බදු සහනයන් පුද්ගලික අංශය වෙත රජය මගින් ප්‍රදානය කොට පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාවලිය වෙත ඔවුන් නැඹුරු කිරීම සඳහා රජය විසින් ගත් ක්‍රියාමාර්ග වෙත යොමු වීම ප්‍රමාණවත් ලෙස ඉහල ගිය ආකාරයක් දක්නට නොලැබේ. පර්යේෂණ කටයුතු වාණිජකරණය කිරීමට ඇති අපහසුතාවයට හේතුවක් ලෙස විශේෂයෙන් සුළු හා මධ්‍ය පරිමාණයෙන් ක්‍රියාත්මක කර්මාන්තකරුවන් විශාල ප්‍රමාණයක් ආයෝජන වෙතින් ක්ෂණිකව මුදල් ඉපැයීමට නැඹුරුව සිටීමත් අභියෝගාත්මක තර්ජනයන්ට මුහුණ දීමට ඇති නොහැකියාවත් පෙන්නුම් කරයි. එසේම සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා ණය සහන සැපයීමේ ආර්ථික සැලසුම් දියත් කිරීම මගින් ඉහල තාක්ෂණය සහිත ආයෝජන වෙත යොමු වීමට ඇති අවස්ථා අවම වීමත් හේතුකාරක වී ඇත.

2016 වසර වන විට ශ්‍රී ලංකාව කලාපීය දැනුම සහිත ප්‍රමුඛ කේන්ද්‍රස්ථානය ලෙස කටයුතු කිරීමට අපේක්ෂිත තත්වයක් තුල උසස් තාක්ෂණය සහිත කර්මාන්ත බිහි කිරීමේ උත්සාහයේදී කාර්මික තාක්ෂණ ආයතනය වැනි ආයතනයන් වැදගත් කාර්යභාරයක් ඉටු කිරීමට හැකි වන සේ කටයුතු කිරීමට අනිවාර්යයෙන් සැදී පැහැදී කටයුතු කල යුතුව ඇත.

# විධායක වාර්තාව

## ආදායම් - ව්‍යාපාරික කටයුතු (රු. මි)




## ආදායම් - ව්‍යාපාරික කටයුතු (රු. මි)




## ප්‍රතිපාදන වියදම් (රු. මිලියන)




## පුනරාවර්තන වියදම් රටාව (රු. මිලියන)



# විධායක වාර්තාව

## මෙහෙයුම් ආදායම් (රු. මිලියන)




## ආදායම් සමග පුනරාවර්ථන වියදම් (රු. මිලියන)




## ඒක සේවක වියදම (රු. මිලියන)




## ඒක සේවක ආදායම (රු. මිලියන)



# සුවිශේෂී නිපුණතා

## යෝජිත කසල අපද්‍රව්‍ය බලශක්තියට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය - කරදියන

කරදියෙන ඉදිකෙරෙන යෝජිත බලශක්ති ව්‍යාපෘතිය සඳහා ශබ්ද සිතියම් නිර්මාණ කටයුතු ඉටුකර දෙන ලෙස මධ්‍යම ඉංජිනේරු උපදේශන ආයතනය කාර්මික තාක්ෂණ ආයතනය වෙතින් ඉල්ලීමක් කරන ලදි. ආරම්භක අදියර තුලදී දිනකට නාගරිකව එකතුවන මෙ.ටො. 1300 ක ඝන අපද්‍රව්‍ය ප්‍රමාණයක් යෝජිත වැඩ බිම තුලට එකතුවන අතර එමඟින් විදුලිබලය උත්පාදන කටයුතු උසස් තාප වායුමය පද්ධතියක් වෙතින් ජනිත කිරීමට සැලසුම් කර ඇත. මේ නිසා ඇති විය හැකි ශබ්ද ප්‍රමාණ වැලකීම සඳහා කලාපය තුල මෙන්ම ඒ අවට ප්‍රදේශ දක්වා ඇතිවන ශබ්ද ප්‍රමාණ ඇස්තමේන්තු කිරීම ශබ්ද සිතියම් උපයෝගී කරගනිමින් සිදු කරනු ඇත.

## හොල්සිම් ලංකා පුද්ගලික සමාගම සඳහා ශබ්ද සිතියම් සම්පාදනය

හරිත සංකල්පය යටතේ කර්මාන්තශාලා ගොඩනැගීමේදී කලාපය තුල ජනිත විය හැකි ශබ්ද ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමේදී ශබ්ද සිතියම් ප්‍රස්ථාරගත කිරීම වැදගත් සංකල්පයක් ලෙස පිලිගැනේ. පුත්තලම ආරුවක්කාලු ප්‍රදේශයේ හොල්සිම් සමාගම මගින් ඉදිකෙරෙන ක්ලින්ක නිෂ්පාදන කම්හලෙහි ශබ්ද සිතියම් නිර්මාණ කටයුතු සමාගම විසින් කාර්මික තාක්ෂණ ආයතනයට පවරන ලදි. ඉහතින් දැක් වූ පරිදි මෙය වැදගත් වනුයේ යෝජිත කර්මාන්ත සංකීර්ණය හේතුවෙන් ප්‍රදේශය තුල හටගත හැකි ශබ්ද ප්‍රමාණය ඇස්තමේන්තු කිරීම සඳහා යි.

කාර්මික තාක්ෂණ ආයතනය වෙතින් සකසන ලද ශබ්ද සිතියම් භාවිතා කර ඉදිරියේදී ක්ලින්ක නිෂ්පාදනාගාරය ස්ථාපිත කිරීම මගින් සිදුවිය හැකි ශබ්ද ප්‍රමාණයන්ගේ ධාරිතාව මැණ බැලීම සඳහා පාදක දත්ත ලෙස එම දත්ත භාවිතා කිරීමට ඇති හැකියාව යි. සිතියම් නිර්මාණය කිරීමේදී කර්මාන්ත ශාලාව තුල ඉතා අධික ශබ්ද ප්‍රමාණ පැවතිය හැකි කලාප මෙන්ම පරිබාහිරව ඇති විය හැකි ශබ්ද නිර්ණය කොට සේවකයින්ගේ ශ්‍රවන ඉන්ද්‍රියන් ආරක්ෂා වීම සඳහා ගත යුතු ක්‍රියා පිලිවෙත් මෙන්ම එම කලාප ශබ්ද අනතුරු ඇති කලාප ලෙස නම් කිරීම හා ඒ පිළිබඳ පෙරහුරු සේවකයන් වෙත සැපයීම යි. ශබ්ද කළමණාකරණ කටයුතු සම්පාදනය සැලසුම්ගත අයුරින් සිදුකොට අනාගත සංවර්ධන කටයුතු දියත් කිරීමේදී ශබ්ද ප්‍රමාණයන්ගේ අගයන් ශබ්ද සිතියම් තුලට ඇතුලත් ශබ්ද පාලනය සඳහා අවශ්‍ය නිසි වැඩපිලිවෙල කළමණාකරණය කිරීම යි. එමඟින් යථානුරූපව ශබ්ද ප්‍රමාණ අනුමාන කිරීම මගින් ඇතිවිය හැකි විශාල ශබ්ද ප්‍රමාණය වැලැක්වීමට සුදුසු පියවර කල් ඇතිව සකස් කිරීමට හැකියාව ලැබෙනු ඇත.

# සුවිශේෂී නිපුණතා

## අප ජල ප්‍රතිකාරක

මාස් හෝල්ඩිංග්ස් සමූහ ව්‍යාපාරික සමාගම යටතේ ක්‍රියාත්මක ප්‍රයිම් ඉන්ටිමේට් ශ්‍රී ලංකා පුද්ගලික සමාගම නයිලෝන් පාදක අමුද්‍රව්‍ය භාවිතයෙන් නිමි ඇඳුම් නිෂ්පාදන සඳහා අවශේෂ නිෂ්පාදනය කරනු ලබන සමාගමකි. වර්ණක ගැන්වීම හේතුවෙන් නයිලෝන් මිශ්‍රිත රෙදිපිළි වෙතින් ඇති කෙරෙන අප ජලය ප්‍රතිකාර කිරීම මගින් එහි වර්ණය ඉවත් කිරීම අප ජලය ප්‍රතිකරණයේදී ප්‍රධාන කාර්යයක් ලෙස සැලකේ. පෙර අවස්ථාවකදී වසර 2002 දී පළමු අප ජල ප්‍රතිකාරක යන්ත්‍ර පද්ධතිය එම ආයතනය සඳහා ඉදිකරන ලද්දේ ද කාර්මික තාක්ෂණ ආයතනය විසින් වන අතර එම යන්ත්‍ර තවමත් එක්තරා ප්‍රමාණයකට වර්ණ ඉවත් කිරීමේ හැකියාව ඇතිව ක්‍රියාත්මකව පවතී. එම අපජල ප්‍රතිකාරක යන්ත්‍ර වැඩිදියුණු කොට දිනකට ඝන මීටර් 200 ක ධාරිතාව සහිතව විශාල කොට ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සමාගමය විසින් කාර්මික තාක්ෂණ ආයතනයට නැවත පවරණ ලදි.

## බිං කොහොඹ ශාකය ආරක්ෂා කර ගැනීම, සුරැකීම සඳහා ශ්‍රී ලංකාව තුල ශාකයේ භූගෝලීය ප්‍රචාරණ රටාව අධ්‍යයනය (*Munronia pinnata* (wall.) Theob. (meliaceae)

කාර්මික තාක්ෂණ ආයතනය ඖෂධ පැලෑටි පිළිබඳ පර්යේෂණ මෙහෙයවන විද්‍යාඥයින් පළමු වතාවට බිං කොහොඹ ශාකයේ භූගෝලීය ප්‍රචාරණ රටාව ගැඹුරින් අධ්‍යයනයට ලක් කරන ලදි. තෙත් කලාපයේ ස්ථාන 3 ක් ද ඇතුලුව නව කලාප 10 ක් තුල ශාකය ප්‍රචාරණය වී ඇති බව හඳුනාගන්නා ලදි. පෙර අවස්ථාවන්හිදී වාර්ථා වී ඇති පරිදි ශාකය වියලි කලාපයේ මෙන්ම අන්තර් කලාපයේ පමණක් දක්නට ඇති බව වාර්තාවන්හි සටහන් වුව ද මෙය තෙත් කලාපය තුල ද වගා කල හැකි බව පෙනී ගොස් ඇත. මෙම අධ්‍යයනයේදී හෙළිදරව් වූ කරුණු අතර මෙම වටිනා මෙන්ම දුර්ලභ ඖෂධීය පැලෑටිය ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ තුල විශාල කාලගුණ පරාසයක් සහිතව වගා කල හැකි බව පැහැදිලි වීමයි. එබැවින් මෙම ශාකය ලංකාවේ කලින් ප්‍රචාරණය වී නොපැවති ප්‍රදේශයන්හි පවා සාර්ථක කාර්මික වගාවක් ලෙස ප්‍රචලිත කර එහි ඖෂධීය වටිනාකම විවිධ කර්මාන්ත මෙන්ම ආයුර්වේද ඖෂධ ක්‍රමය තුල භාවිතයට ගනිමින් නිසි ප්‍රයෝජන ලබාගත හැකි බව ද හෙළිදරව් වීමයි.

## බිං කොහොඹ ශාකයේ මැලේරියා මර්ධන හැකියාව

බිං කොහොඹ (*Munronia pinnata*) ශාක පාරම්පරික ආයුර්වේද ප්‍රතිකාර සඳහා බෙහෙවින් භාවිතයට ගෙන ඇත. බිං කොහොඹ ප්‍රභේද 16 ක් වාර්තා වී ඇති අතර මෙම සෑම ප්‍රභේදයක් තුලම පවත්නා මර්ධන හැකියාව "බ්‍රයින් ශ්‍රිම්ප්" විශ්ලේෂණ ක්‍රම වේදය යොදා පරීක්ෂාවට ලක් කෙරිණ. මේ අතුරින් උසස් මර්ධන හැකියා සහිත ප්‍රභේද 2 ක් තෝරාගනිමින් ඒවායේ මැලේරියා මර්ධන හැකියාව පරීක්ෂා කෙරිණ. මෙම ප්‍රභේද ද්විත්වයම මැලේරියා මර්ධන හැකියාව සහිත බව සොයාගන්නා ලදි. මේ පිළිබඳ පර්යේෂණ කටයුතු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය මගින් ආචාර්ය උපාධිය ප්‍රදානය කිරීම සඳහා නිර්දේශ කෙරිණ.

# සුවිශේෂී නිපුණතා

## ලංකා කුරුඳු (Ceylon cinnamon) තුල පවත්නා ජෛව ක්‍රියාකාරීත්වය

### කුරුඳු කොල හා පොතු නිස්සාරණයන් ප්‍රතිඔක්සිකාරක, දියවැඩියා මර්ධන හා තාරුන්‍යය තිරසාරව පවත්වා ගැනීමට යොදාගත හැකි ආකාරය

කාර්මික තාක්ෂණ ආයතනයේ ඖෂධීය ශාක පිළිබඳ පර්යේෂණ අංශය මගින් ශ්‍රී ලංකාවට ආවේණික කුරුඳු ශාකයේ පොතු හා කොල නිස්සාරක පරීක්ෂාවට ලක් කරමින් එහි අඩංගු ප්‍රතිඔක්සිකරණ, දියවැඩියා මර්ධන හා තරුණ බව ආරක්ෂා කිරීමට ඇති හැකියා පිළිබඳ වාර්තා එළිදක්වා ඇත. මෙය ලෝකයේ ලංකා කුරුඳු තුල ඇති තාරුණ්‍ය ආරක්ෂා කරගැනීමට පවත්නා හැකියාව පිළිබඳ පළමු වරට වාර්තාගත පර්යේෂණයකි. පෙර අවස්ථාවන්හිදී මේ පිළිබඳව වාර්තා ප්‍රකාශනයට පත් කොට තිබුන ද පර්යේෂණයට භාජනය කල කුරුඳු ලංකා කුරුඳු වශයෙන් සඳහන් වී නොමැත.

### දියවැඩියා සහිත හා නිරෝගී මීයන් ආදර්ශ ලෙස යොදා රුධිරයේ පවත්නා සීනි හා ලිපිඩ ප්‍රමාණයන් පාලන හැකියාව සොයා බැලීම

කොළඹ වෛද්‍ය පීඨය සම්බන්ධ කර ගනිමින් ආහාර පරිභෝජන රටාව, සිරුරේ බර, සීනි ප්‍රමාණ පාලන හා ලිපිඩ ප්‍රමාණයන් පාලනය සඳහා ලංකා කුරුඳු උපයෝගී වන ආකාරය අධ්‍යයනයට ලක් කරන ලදි. පරීක්ෂාවට ලක් කල ආදර්ශ මීයන් දියවැඩියා සහිත හා නිරෝගී සතුන්ගෙන් සමන්විත විය. මෙම අධ්‍යයනයේදී ලංකා කුරුඳු භාවිතා කිරීම හේතුවෙන් පරීක්ෂාවට ලක් කල ආදර්ශයෙන් රුධිරයේ සීනි ප්‍රමාණය මෙන්ම LDL කොලෙස්ටරෝල් ප්‍රමාණ මනාව පාලනය වන බව පෙනීගොස් ඇත. මිනිසුන් සඳහා මෙය සිදුවන ආකාරය පිළිබඳ වැඩිදුර අධ්‍යයනය සඳහා සායනික පරීක්ෂා සිදුකරමින් පවතී.

## ජාතික ගැටළු සඳහා දායකත්වය

රට තුලට ආනයනය කරන ලද තත්වයෙන් බාල ඩීසල් තොගයක් හේතුවෙන් වාහන තුල සිදු වූ ඉන්ධන නල හිරවීමේ තත්වය ඇති වීමට හේතු සොයා බැලීමට කාර්මික තාක්ෂණ ආයතනයෙන් ඉල්ලීමක් කල අතර ඩීසල් සාම්පල ශ්‍රී ලංකා දුම්රිය හා ශ්‍රී ලංකා රේගු අධිකාරිය වෙතින් එක්රැස් කර පරීක්ෂාවට ලක් කෙරිණ. ප්‍රතිඵල වෙතින් එම ඩීසල් පුස් විශේෂයකින් දූෂණය වී ඇති බැව් අනාවරණය වූ අතර එම වාර්තාව ලංකා ඛනිජ තෙල් සංස්ථාව වෙත ඉදිරිපත් කරන ලදි.

# සුවිශේෂී නිපුණතා

## ෆ්ලෝරයිඩ් හා වෙනත් දූෂක ද්‍රව්‍යයන් ඉවත් කිරීම සඳහා රතු මැටියෙන් නිම වූ පිල්ටරයක් (පෙරනයක්) නිෂ්පාදනය

ශ්‍රී ලංකාවේ උතුරු මැද පලාතේ මෙන්ම දකුණු පලාතේ සමහර ප්‍රදේශ තුල වකුගඩු අක්‍රිය වීමේ රෝගය සීඝ්‍රයෙන් පැතිර යමින් පවතී. මෙම රෝගයට මූලික හේතු සාධකයක් ලෙස සැක කරනු ලබන්නේ ජලයේ ඒකරාශීව පවත්නා අධික ප්‍රමාණයේ ෆ්ලෝරයිඩ ප්‍රමාණය යි. ජලයේ පවත්නා ෆ්ලෝරයිඩ ප්‍රමාණය උතුරු මැද පලාතේ ඉහල අගයක් ගන්නා අතර දන්ත ෆ්ලෝරයිඩ ප්‍රමාණ තත්වය ගැටළු රාශියක් මතු කර ඇත. ජලය තුලින් ෆ්ලෝරයිඩ, බැක්ටීරියා වැනි මෙම දූෂක ද්‍රව්‍යයන් ඉවත් කිරීමට හැකි රතු මැටිටෙන් නිම වූ පිල්ටරයක් නියමු පරිමාණයෙන් නිම කර ඇත. ඉහත සෞඛ්‍ය ගැටළුවට පිළියමක් ලෙස කාර්මික තාක්ෂණ ආයතනය වෙතින් අඩු පිරිවැයක් සහිතව නිෂ්පාදනය කර ඇති පිල්ටරය කදිම විසඳුමක් ලෙස පෙන්වා දිය හැක. නියමු පරිමාණයෙන් පරීක්ෂණයට ලක් කරන ලද පිල්ටරය ජලයේ ෆ්ලෝරයිඩ ඉවත් කිරීම සඳහා සාර්ථක ලෙස භාවිතා කල හැකි බව සනාථ වී ඇති අතර මේ සඳහා ආයෝජනය කිරීමට සුදුසු ව්‍යවසායකයෙකු සමඟ එක්ව කටයුතු කිරීමට ආයතනය අපේක්ෂාවෙන් සිටී. මෙම නිෂ්පාදනය සඳහා පේටන්ට් බලපත්‍රයක් නිකුත් කරන ලෙස ද ඉදිරිපත් කර ඇත.

## කාන්තා සනීපාරක්ෂක තුවායක් ලෙස භාවිතා කල හැකි සුපිරි අවශෝෂක රෙදි විශේෂයක් කෙසෙල් පට්ටා යොදා නිපදවීම

ග්‍රාමීය ප්‍රදේශ තුල කිසිදු ඵලදායීතාවයකින් තොරව ඉවත දමන කෙසෙල් පට්ටා විශාල ප්‍රමාණයෙන් දැක ගත හැකිය. කාර්මික ලෙස වැදගත් ස්වභාවික නිෂ්පාදනයක් එළිදැක්වීම සඳහා මෙම කෙසෙල් පට්ටා යොදා ගත හැකි ආකාරය පිළිබඳව කාර්මික තාක්ෂණ ආයතනය පර්යේෂණ ව්‍යාපෘතියක් දියත් කරන ලදි. කාන්තාවන්ගේ රුධිර හා මුත්‍ර උරාගැනීම සඳහා භාවිත කල හැකි අවශෝෂක ද්‍රව්‍යයක් ලෙස මෙය යොදාගත හැකි ආකාරය, කාන්තා සනීපාරක්ෂාව සඳහා නිෂ්පාදනයක් ලෙස භාවිතා කිරීම හඳුන්වාදීම මූලික අරමුණ විය.

කර්මාන්තයක් ලෙස දැනට නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදන සඳහා භාවිතා කරන අමුද්‍රව්‍ය හා සැසඳීමේදී කෙසෙල් පට්ටා තුල අවශෝෂක හැකියාව සන්සන්දනාත්මකව ඉහල ප්‍රමාණයක පවතින බව පැහැදිලි වී ඇත. නිෂ්පාදන තාක්ෂණය වාණිජ භාණ්ඩයක් ලෙස කාර්මිකව නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණය හුවමාරු කිරීම සඳහා සූදානම්ව පවතී.

## වසර තුල සිදුකල තාක්ෂණ පැවරුම්

අවබෝධතා, එකඟතා ගිවිසුම් 7 ක් පිලිගත් ප්‍රධාන පෙලේ සමාගම් සමඟ අත්සන් කිරීමට හැකි විය.

# සුවිශේෂී නිපුණතා

## තැඹිලි, බෝතල් කල බීම වර්ගයක් ලෙස

ට්‍රොපික් ෆ්‍රුට්ස් පුද්ගලික සමාගම වෙත අපනයනය සඳහා සුදුසු බීම විශේෂයක් ලෙස තැඹිලි බෝතල් කොට නිෂ්පාදනය කිරීමේ තාක්ෂණය පවරාදෙන ලදි. මෙම නිෂ්පාදනය සඳහා මාස 6 ක් හෝ වැඩි ප්‍රමාණයක වයස සහිත තැඹිලි කුරුම්බා භාවිතා කිරීමට හැකියාව ඇත. කාමර උෂ්ණත්වයේදී වසරක් කල් තබාගැනීමේ හැකියාව නිෂ්පාදනය තුල පවතී. නිෂ්පාදන කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු ISO 22000-2005 ප්‍රමිතිය සහිතව පවත්වා ගැනීම සඳහා ප්‍රතිනිර්මාණය කරන ලදි. UHT තත්වයන් භාවිතා කොට බෝතල් වශයෙන් මෙන්ම බෑගයක් ලෙස තැඹිලි වතුර අසුරා වෙළඳපලට නිකුත් කිරීමට හැකිව තාක්ෂණය හුවමාරු කරන ලදි. කර්මාන්ත ශාලාවේ කාර්ය මණ්ඩලය අවශ්‍ය ක්‍රමවේදය පිළිබඳව පුහුණු කල අතර අපනයනය සඳහා උචිත ලෙස සාම්පල නිෂ්පාදනය කිරීමේ කටයුතු ද සිදු කරන ලදි.

## "ඔමෙගා 3" වැඩි ප්‍රමාණයක් සහිත කුකුළු බිත්තර නිෂ්පාදනය

කුකුළු ගොවිපල සත්ව ආහාරයක් ලෙස 'ඔමෙගා 3' අධිකව බිත්තර තුලට උකහා ගත හැකි තාක්ෂණය අත්හදා බැලීමේ පරීක්ෂාවක් ලෙස සිදුකිරීම සඳහා සීමාසහිත ආරෝග්‍යා පුද්ගලික ගොවිපල සමාගම වෙත තාක්ෂණය පැවරීම සඳහා එකඟතා ගිවිසුමකට අත්සන් තබන ලදි. කාර්මික තාක්ෂණ ආයතනය මගින් නිෂ්පාදනය කරන ලද කුකුළු ආහාර කිකිළියන් 300 ක් සඳහා පරීක්ෂා කිරීමේ කටයුතු ආයතනය මගින් මේ වන විට දියත් කර ඇත. කර්මානත්ශාලා කාර්ය මණ්ඩලය කුකුළු ආහාර නිෂ්පාදනය කිරීම පිළිබඳව පුහුණු කරන ලදි. නිෂ්පාදනයේදී සෞඛ්‍ය ආරක්ෂිත අන්දමින් එම කුකුළු ආහාර නිෂ්පාදනය කල යුතු ආකාරය ද පෙන්වා දෙන ලදි. ඒ සමඟ ප්‍රමිති හා රෙගුලාසි පිළිබඳව ද කාර්ය මණ්ඩලය දැනුවත් කරන ලදි.

වෙළඳපල වෙත බිත්තර ඉදිරිපත් කිරීම කෙරෙන කාල වකවානුව වන විට බිත්තර තුල අඩංගු කොලෙස්ටරෝල් ප්‍රමාණ පිළිබඳව ද සැලකිල්මත්ව කටයුතු කෙරෙන අතර පාලනයක් අවශ්‍ය යැයි පැහැදිලි වේ නම් ඒ සඳහා ද සූදානම්ව සිටී.

- එස්කොසැන් පුද්ගලික සමාගම
  ඉස්සන් පොතු භාවිතා කොට චිටෝසාන් නිෂ්පාදනය

- හොල්සිම් ලංකා පුද්ගලික සමාගම
  පාරිසරික පරාමිතීන් නිරීක්ෂණ හා මිණුම්

- ගවර් ස්ට්‍රීට් හෝල්ඩිංග්ස් පුද්ගලික සමාගම
  රස කරන ලද අයිසොටොනික බීම නිෂ්පාදනය

- කීල්ස් ෆුඩ් ප්‍රොඩක්ට්ස් පුද්ගලික සමාගම
  ක්ෂණික බත් නිෂ්පාදන ප්‍රවර්ධනය

- මැජෙස්ටි නැචුරල් ෆුඩ් ඇන්ඩ් කෙමිකල් එක්ස්පෝට් පුද්ගලික සමාගම
  ආහාර කර්මාන්තයට අවශ්‍ය පෙක්ටින් වාණිජ ලෙස නිෂ්පාදනය කිරීම

# සුවිශේෂී නිපුණතා

## විදේශීයව සිදුකල ක්‍රමාංකන මිණුම් සේවා

### මාලදිවයින් ජනරජයේ සෞඛ්‍ය වෛද්‍ය රසායනාගාරය, මාලදිවයින් ජනරජය

මාලදිවයිනේ ආහාර හා ඖෂධ අධිකාරියේ සෞඛ්‍ය වෛද්‍ය රසායනාගාරයේ ඉල්ලීම පරිදි උදුන්, උණුසුම් කුටීර (incubators), හුමාල කුටීර, තුලා, ජලතාපක හා ශීතකරණ ක්‍රමාංකනය කරන ලදි. ISO 17025 ප්‍රමිතිකරණයට අනුකූලව උපකරණ වෙතින් ගනු ලබන මිණුම් නිරවද්‍ය බව තහවුරු කොට ප්‍රතීතකරණය සහිතව ක්‍රියාත්මක වීම සඳහා උපකරණ ක්‍රමාංකනය ඉතා වැදගත් ලෙස සැලකේ. මීට අමතරව කාර්මික තාක්ෂණ ආයතනය විසින් සිදුකරනු ලබන වෙනත් සේවාවන් පිළිබඳව ද සෞඛ්‍ය වෛද්‍ය රසායනාගාර කාර්ය මණ්ඩලය වෙත හඳුන්වාදීමේ වැඩසටහනක් ද ඉදිරිපත් කරන ලදි.

# ගුණාත්මක යටිතල පහසුකම් ප්‍රවර්ධන කටයුතු

## කාර්මික තාක්ෂණ ආයතනයීය පරීක්ෂණ හා මිණුම් සේවා ප්‍රතීතකරණය

### SLAB හා SWEDEC ආයතන වෙතින් පිරිනමන ISO 17025 ප්‍රතීතකරණය

දිවයිනෙහි ඇති ප්‍රමුඛ පර්යේෂණ හා සංවර්ධන ආයතනය වශයෙන් කාර්මික තාක්ෂණ ආයතනය කර්මාන්ත වෙත ගුණාත්මක තාක්ෂණික සේවා සපයමින් තම කාර්යභාරය ඉටු කිරීම සඳහා කැප වී කටයුතු කරනු ලබයි.

### රසායනික හා ක්ෂුද්‍රජීවීමය විශ්ලේෂණ සඳහා ප්‍රතීතකරණය

SWEDEC හා SLAB ආයතන වෙතින් රසායනික හා ක්ෂුද්‍රජීවීමය විශේෂතා කටයුතු සඳහා පිරිනමන ලද ප්‍රතීතකරණය පිළිවෙලින් වසර 10 ක් හා 5 ක් සඳහා නොකඩවා සුරක්ෂිත ලෙස පවත්වාගෙන යාමට හැකියාව ලැබී ඇත. ජලය, අප ජලය, ආහාර හා පොහොර නිෂ්පාදනයන්ගේ රසායනික හා ක්ෂුද්‍රජීවීමය පරාමිතීන් SWEDEC ආයතනය මගින් සේවාවන් 77 ක් හා SLAB ආයතනය මගින් 98 ක් සඳහා නොකඩවා පවත්වාගෙන යාමට හැකියාව ලැබුණි. රසායනික හා ක්ෂුද්‍රජීවී රසායනාගාරය සාමාර්ථතා පරීක්ෂණ මෙහෙයවනු ලබන ආයතන එනම්, FAFAS, CSIR, CFTRI, Magruda, Qatestz, LEAP, Livsmedel verket National Food Administration - ස්වීඩන්, PTA ඕස්ට්‍රේලියා යන ආයතන වෙතින් පවත්වනු ලබන ප්‍රවීණතා පරීක්ෂණ සඳහා ප්‍රතීතකරණය කර ඇති ක්ෂුද්‍රජීවී හා රසායනික පරීක්ෂණ ආවරණය වන පරිදි පවත්වන ලදි. මෙම ප්‍රවීණතා සාමාරථතා පරීක්ෂණ වෙතින් රසායන හා ක්ෂුද්‍රජීවී රසායනාගාරය වෙතින් කෙරෙන පරීක්ෂණ සේවාවන්ගේ නිරවද්‍යතාවය තහවුරු කර ඇත.

### ද්‍රව්‍ය පරීක්ෂණ සේවා සඳහා ප්‍රතීතකරණය

කාර්මික තාක්ෂණ ආයතනය මගින් සිදුකරනු ලබන රබර් නිෂ්පාදනයන්ගේ පරීක්ෂණ සේවාවන් ප්‍රතීතක තත්වය තහවුරු කිරීම සඳහා පිහිටුවා ඇති ස්වීඩන ආයතනය (SWEDEC) වෙතින් ප්‍රතීතකරණය සිදු කර ඇත. ISO 17025 ගුණාත්මක තත්ව පාලන පද්ධතියට එකඟව උසස් තාක්ෂණික සේවා තත්වය මෙන්ම එහි පරිපාලනමය කටයුතු සිදුකෙරෙන ඉහල ගුණාත්මක තත්වය සැලකිල්ලට ගනිමින් 2007 වසරේදී පිරනමන ලද ප්‍රතීතකත්වය වසර 2012 හා 2013 දක්වා දීර්ඝ කරන ලදි. ද්‍රව්‍ය තාක්ෂණ රසායනාගාරය මගින් රබර් නිෂ්පාදන සඳහා සිදුකරනු ලබන පරීක්ෂණයන්ගේ ප්‍රතිඵල SWEDEC ප්‍රවීණතා සාමාර්ථතා අනුව පිලිගත් පරාසයන් තුල පවත්නා බවට ස්ථිර කර ඇත. තවද SLAB ප්‍රතීතකරණය ද්‍රව්‍ය තාක්ෂණ රසායනාගාරය සිදුකරනු ලබන යාන්ත්‍රික හා රසායනික මිණුම් (රබර් නිෂ්පාදන හා ඊයම් මෙන්ම කැඩ්මියම් ශේෂ සඳහා කෙරෙන පරීක්ෂණ) සඳහා වසර 2012/2013 දක්වා දීර්ඝ කරන ලදි.

# ගුණාත්මක යටිතල පහසුකම් ප්‍රවර්ධන කටයුතු

## ක්‍රමාංකන මිණුම් සේවා සඳහා ප්‍රතීතකරණය නොසැලී පවත්වා ගැනීම

තාපමිතික, ප්‍රමාණික, විදුලි, පරිමා හා දිග, පළල මිණුම් සඳහා කෙරෙන මිණුම් සඳහා SWEDEC ආයතනය වෙතින් පවත්වනු ලබන සුපරීක්ෂණ විගණන මෙහෙය වූ අතර පරිමාමිතික මිණුම්, මයික්‍රො ප්‍රමාණ පිපෙට්ටු ක්‍රමාංකනය සඳහා දෙවන වතාවට ද සුපරීක්ෂණ විගණනයට භාජනය කරන ලදි. SLAB හා SWEDEC ආයතන මගින් කාර්මික තාක්ෂණ ආයතනයේ කාර්මික මිණුම් රසායනාගාරය ලද සහතිකලාභීභාවය ඉදිරි වසර සඳහා ද දීර්ඝ කරන ලදි.

## ඉදිකිරීම් සිදු කරන ස්ථානයන්හි ඇතිවන ශබ්ද ප්‍රමාණ මැනීම සඳහා මිනුම් පරාසයන් පුලුල් කිරීම

ශ්‍රී ලංකා ප්‍රතීතක මණ්ඩලය විසින් 2010 වසරේ දී යාන්ත්‍රික මිණුම් ක්‍රමාංකනය පිළිබඳව පිරිනමන ලද ISO/TEC 17025:2005 ප්‍රමිතියට අමතරව ඉදිකිරීම් සිදු කෙරෙන ස්ථානයන්හි ඇති වන ශබ්ද ප්‍රමාණයන් මැන බැලීම සඳහා ද උපයෝගී කර ගැනීමට හැකියාව ඇතිව මිණුම් ගැනීමට උචිත ලෙස පුලුල් වූ පරාසයක් ඇතිව කාර්මික තාක්ෂණ ආයතනයේ විද්‍යුත් තාක්ෂණ රසායනාගාරය ප්‍රතීතකරණය කරන ලදී. 2012 වසරේ නොවැම්බර් මාසයේ දී පුලුල් කරන ලද මිණුම් පරාසයක් සඳහා සුපරීක්ෂණ විගණනය සාර්ථක අයුරින් සිදු කල අතර එමගින් විද්‍යුත් තාක්ෂණ රසායනාගාරය වෙළඳපලෙහි එම පුලුල් කරන ලද පරාසයන් මැන බැලීම සඳහා තරඟකාරී ලෙස සේවා සැපයීමට අවස්ථාව උදා කර ගෙන ඇත.

## ලියකියවිලි හා වාර්තා පාලන පුහුණු කටයුතු

තත්ව පාලන, ප්‍රතීතකරණ ක්‍රියාදාමයන්ගේ නිරන්තර ප්‍රගමණය උදෙසා ගැටළු ඇතිවීම වැලැක්වීම අරමුණු කොට තත්ව නියෝජිතයින් (QR) සඳහා ISO 9001:2008 තත්ව පද්ධතීන් ක්‍රියාවට නැංවීම පිළිබඳව පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. මෙම පුහුණු පාඨමාලාවේ දී තත්ව නියෝජිතයින් වෙත අභ්‍යන්තර විගණක නිලධාරීන් විසින් ඉස්මතු කරන ලද අනනුකූලතා පිළිබඳව දැනුවත් කරන ලද අතර, තත්ව පාලන දෙපාර්තමේන්තුව වෙතින් සකසා අංශ වෙත ඉදිරිපත් කරන ලද තත්ව දර්ශක ඇගයීම් පත්‍රිකාව තවදුරටත් ප්‍රවර්ධනය කලයුතු ආකාරය පිළිබඳව තත්ව නියෝජිතයින් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී. ආයතනයීය කුසලතා වර්ධනය අරමුණු කොට තත්ව පාලන දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කොට තත්ව පරීක්ෂණ පද්ධති ප්‍රතිසංවිධානය කරන ලදී.

# ගුණාත්මක යටිතල පහසුකම් ප්‍රවර්ධන කටයුතු

## අභ්‍යන්තර විගණන

ISO-9001:2005 තත්ව කළමනාකරණ පද්ධතියට (QMS) අනුකූලව තත්ව සුපරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අභ්‍යන්තර විගණන 06 ක් පවත්වා ඇත. කළමනාකරණ පද්ධති, කළමනාකරණයේ වගකීම්, සම්පත් කළමනාකරණය, සේවා නිසි පරිදි හඳුනා ගැනීම, ගිණුම් විශ්ලේෂණය සහ ප්‍රවර්ධනය හා තිරස් විගණන කටයුතු මේ යටතේ සිදු කරන ලදී. එක් එක් අංශ කාර්ය මණ්ඩල වෙතින් හා අභ්‍යන්තර විගණකවරුන් විසින් පෙන්වා දෙන ලද අනනුකූලතා සඳහා විසඳුම් ඉදිරිපත් කරන ලදී. අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ දී අංශ කීපයක සාමාජිකයින් විසින් ආයතනයීය තත්ව කළමනාකරණ පද්ධතිය ක්‍රියාවට නැංවීමේ දී මූලික විගණකවරුන්, විගණකවරුන් හා නිරීක්ෂකයන් ලෙස ක්‍රියාදාමය ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය වැදගත් උපදෙස් රාශියක් පෙන්වා දෙන ලදී.

# කාර්මික තාක්ෂණ ප්‍රවර්ධනය වේගවත් කිරීම

## ගුවන්විදුලි තරංගමාලා පාදක වීදි ලාම්පු පාලක

වීදි ලාම්පු ව්‍යාපෘතියේ දෙවන අදියර ලෙස දුරස්ථ පාලකයක් වෙතින් දැල්වීම හා නිවාදැමීම සිදුකල හැකි මෙවලමක් නිර්මාණය කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. මෙම පද්ධතිය සඳහා සරල ගුවන් විදුලි තරංග ප්‍රතිග්‍රාහකයක් සමඟ පිල්ටර් පරිපථයක් පාලක ඒකකයක් සමඟ යොදා ගන්නා ලදී. සුපුරුදු සංඥා රටාවක් සහිතව ගතානුගතිකව පවත්නා ගුවන්විදුලි නාලිකාවක් දැල්වීම/නිවාදැමීම (ON/OFF) සිදු කෙරෙන අතර අනතුරුව පිල්ටර් පරිපථය හරහා මෙම සංඥාව වීදි ලාම්පු නිවා දැමීමේ කටයුත්ත සාර්ථකව ඉටු කරයි. මේ වන විට නියාමක අත්හදා බැලීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. වීදි ලාම්පු නිවා දැමීමේ සංඥාව දිනපතා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ සිංහල වෙළඳ සේවය මගින් නිකුත් කිරීමට හැකි වන ලෙස මෙය ප්‍රවර්ධනය කර ඇත. මේ දක්වා සිදුකල අත්හදා බැලීම් සාර්ථක වී ඇති අතර කාර්මික තාක්ෂණ ආයතනය ක්ෂේත්‍ර පරීක්ෂණ කොළඹ මහ නගර සභාවේ හා ලංකා විදුලි සමාගම හා එක්ව අනාගතයේ දී සිදු කිරීමට සැලසුම් කර ඇත.

## ජෛව සන ද්‍රව්‍ය භාවිත උදුන් සාර්ථකව යොදා ගැනීමට නිකුතු අළු පාලනය සඳහා අඩු පිරිවැය පාලකයක්

තාප බලය ලබා ගැනීමේදී භූගත ඉන්ධන වෙනුවට විකල්පයක් ලෙස ජෛව සන ද්‍රව්‍ය භාවිතයෙන් තාප බලය නිෂ්පාදනයට එක් විසඳුමක් ලෙස පෙන්වා දිය හැක. කුඩා පරිමානයේ බොයිලර් උදුන් භාවිතා කරන වැඩි දෙනෙකු ලී කුඩු සහ දහයියා මේ සඳහා උපයෝගී කර ගනී. විවිධ ආකාරයේ උදුන් නිර්මාණ මේ සඳහා යොදා ගත්ත ද දැවෙන අළු හා වායූන් නිකුතුව හේතුවෙන් ඇති වන පාරිසරික දූෂක තත්ත්වය මෙම උදුන් දීර්ඝකාලීනව භාවිතා කිරීම ගැටළු සහගත සෘණාත්මක සාධකයක් ලෙස හඳුනා ගෙන ඇත. මහා පරිමාන තාපක උදුන් සඳහා භාවිතා කරන පිල්ටර් බෑගයක් වෙනුවට සරල තෙතමනය සහිත අවශෝෂක ස්ක්‍රබර් ක්‍රමවේදයක් අවම ප්‍රාග්ධන ආයෝජනයක් මෙන්ම මෙහෙයුම් වියදම් ද අවම ලෙස යොදා මගහරවා ගැනීමේ ක්‍රමවේදයක් ද හඳුන්වා දීමට හැකිව ඇත.

කාර්මික තාක්ෂණ ආයතනය විසින් ප්‍රවර්ධනය කොට පරීක්ෂා කරන ලද මෙම ස්ක්‍රබර් පද්ධතිය වාරියපොල HMDR සහල් මෝල හා දන්කොටුවේ ජයකොඩි මිල්ස් පුද්ගලික සහල් මෝලෙහි සවිකර සාර්ථකත්වය නිරීක්ෂණයට ලක් කොට ඇත.

## තේ කොල තිළිණයක් ලෙස ප්‍රදානය කිරීම සඳහා ඇසුරුම් ක්‍රමයක් ලෙස කුඩා දැව පෙට්ටි භාවිතය විමර්ශනය කිරීම

තේ කොල තිළිණ ලෙස ප්‍රදානය කිරීම සඳහා විවිධ ද්‍රව්‍යයන්ගෙන් නිර්මාණය කරන ලද පිඟන්, කාඩ්බෝඩ්, ලෝහ, ස්වාභාවික පත් හා ලී යෙදූ ඇසුරුම් භාවිතා කරයි. මෙම තේ කොල ඇසුරුම් ලෝක වෙළඳ පලෙහි විවිධ කාලගුණික තත්ත්වයන් යටතේ ගබඩා කර ඇත.

## කාර්මික තාක්ෂණ ප්‍රවර්ධනය වේගවත් කිරීම

එක් තේ අපනයන කරුවෙකු විසින් මෙම විවිධ කාලගුණික තත්ත්වයන් යටතේ තේ ඇසිරීම සඳහා දැව පෙට්ටි සතු හැකියාව පරීක්ෂා කරන ලෙස ඉල්ලීමක් කර ඇත. සේවාලාභියාගේ අවශ්‍යතාව අනුව පරීක්ෂා කලයුතු පරාමිතීන් හඳුනා ගත් අතර අවශ්‍ය විධික්‍රම ද ස්ථාපනය කරන ලදී. දැනට මෙම පරීක්ෂා කර්මාන්ත උදෙසා සැපයීමට හැකියාව ඇත.

### කොළඹ ඩොක්යාර්ඩ් PLC සමාගම මගින් නිම කරන ලද නව නෞකාවේ ඇතුලත පැවැතිය හැකි ශබ්ද හා කම්පන ප්‍රමාණයන් මැන බැලීම

නොකඩවා තෙවන වසරටත් කොළඹ ඩොක්යාර්ඩ් PLC පුද්ගලික සමාගම වෙතින් සමාගම නිෂ්පාදනය කරනු ලබන නව නෞකාවන්ගේ යාත්‍රාව තුල ඇතිවන ශබ්ද හා කම්පන ප්‍රමාණ මැණ බැලීමේ කටයුතු කාර්මික තාක්ෂණ ආයතනයට පවරන ලදී. සිංගප්පූරුවේ ග්‍රේට්ෂිප් ග්ලෝබල් ඕෆ්ෂෝ සර්විසස් ආයතනය සඳහා 2012 වසරේ දී නව විවිධාංගික වේදිකා සහිත යාත්‍රා ත්‍රිත්වයක් සඳහා ශබ්ද හා කම්පන ප්‍රමාණ මැණ බලන ලදී. මෙම මිණුම් ගැනීමේ අරමුණ වූයේ ‘CAC Notation’ තත්ව ලබා ගැනීමයි.

සාමාජිකයින් 06 දෙනෙකුගෙන් සැදුම් ලත් කණ්ඩායමක් විසින් මිණුම් ගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කල අතර IMO, A 468(xii) ක්‍රියා පටිපාටියට එකඟව නාවික යාත්‍රා ඇතුලත ශබ්ද ප්‍රචාරණ මැනීමේ ආචාර ධර්මතාවනට අනුකූලව මිණුම් සටහන් කල අතර ISO 6954:2000(E), යාන්ත්‍රික කම්පන සඳහා මිණුම් සටහන් කරන ලදී. මෙම මිණුම් ගැනීමේ දී, මිණුම් වාර්තා කිරීම හා විගණනය මගී යාත්‍රා හා වෙළඳ යාත්‍රා සඳහා ඉදිරිපත් කර ඇති නිර්දේශ මත ක්‍රියාත්මක කරන ලදී.

පෙර අවස්ථාවන් 2 දී වසර දෙකක් සඳහා මිණුම් ගනු ලැබුවේ යාත්‍රා තුල පූර්ණ ආතතිය ඇතිව ය. 2012 වසරේ දී යාත්‍රා Dynamic Positioning තත්ව ඇතිව යාත්‍රාව එක් ස්ථානයක නොසැලී නැංගුරම් යොදා, පූර්ණ ආතති තත්ත්වය ඇති අවස්ථාවලදී යාත්‍රා සාමාන්‍ය ගමනාගමනයේ යෙදී එන්ජින් පංකා හා අනෙකුත් උපකරණ ක්‍රියාත්මක වෙමින් HVAC පද්ධතීන් සහිතව සිදු කරන ලදී. කම්පන ප්‍රමාණය හා ශබ්ද ප්‍රමාණයන් සියලු තෙරපුම් බල හා විහිදුම් බල 40% ක මුළු බර ප්‍රමාණය සහිතව ඇති විට ඉහල අගයක් ගනු ඇත.

### රබර් කිරි කැපීමේ දී වැසි ජලයෙන් සිදුවන හානි වැලැක්වීමට නව මැලියම් විශේෂයක්

වැසි ජලය රබර් කිරි සමඟ මිශ්‍රවීම වැලැක්වීමට යොදන පොලිතින් ආවරණය රබර් ගස හා සම්බන්ධ කිරීමේ දී කිසිදු හිඩැසක් නොමැතිව ගසට ආවරණය සවි කිරීමට යොදා ගත හැකි නව මැලියම් විශේෂයක් කාර්මික තාක්ෂණ ආයතනය මගින් ප්‍රවර්ධනය කර ඇත.

# කාර්මික තාක්ෂණ ප්‍රවර්ධනය වේගවත් කිරීම

පාරම්පරිකව භාවිත කෙරෙන මැලියම් විශේෂය හා සංසන්දනාත්මකව මෙම මැලියම් වර්ගය භාවිතය මගින් තෙත්ව ඇති පෘෂ්ඨය හා වුව ද මනාව සවිවීම,පහසුවෙන් සකසා ගත හැකි බව, අඩු පිරිවැය, තාපයට හා හිරු එළියට නිරාවරණය වුව ද හානියක් සිදු නොවීම, සවි කිරීම සඳහා රත් කිරීම අනවශ්‍ය බව, ජෛවීය ලෙස දිරාපත් වීම හා පොලිතීන් ආවරණය නැවත භාවිතයට ගැනීමට ඇති හැකියාව විශේෂ ගුණාංග ලෙස පෙන්වා දිය හැක. ක්ෂේත්‍ර පර්යේෂණ මගින් සාර්ථකත්වය පෙනී ගොස් ඇති අතර තාක්ෂණය පවරා දීම සඳහා සූදානම්ව ඇත.

## පලතුරු හා එළවළු අගය වැඩි කිරීම සඳහා පටක පෙරහන් තාක්ෂණ ක්‍රමවේදය හඳුන්වා දීම

වෙළඳ පළෙහි අලෙවිය සඳහා ඇති පලතුරු හා එළවළු යුෂ පැහැදිලි ද්‍රාවණ ලෙස නොමැත. කැරට්, අන්නාසි හා අනෝදා යුෂ ආදිය පටක පෙරහන් තුලින් පෙරා ගත් පසු ජෛව ක්‍රියාකාරී සංයෝග සාන්ද්‍ර 28 ක් ලෙස සකසා ගත හැක. කැරට්, කරවිල, බන්ඩක්කා, ගොටුකොල හා මුගුණුවැන්න ආදියේ ප්‍රතිඔක්සිකරණ හැකියාවන් ද නිර්ණය කරන ලදී.

## අධික යකඩ හා ප්‍රෝටීන සහිත සහල් නිෂ්පාදනය

අධි ප්‍රමාණයක යකඩ ප්‍රමාණයක් සහිත සහල් කුරුට්ට සහිතව, මුංඇට, රටකජු හා මේදය රහිත කිරිපිටි සමඟ වෙනත් ආහාර ද්‍රව්‍ය මුසුකොට ශක්තිජනක ගුණදායී බිස්කට් වර්ගයක් නිෂ්පාදනය කර ඇත. අධික ප්‍රෝටීන හා යකඩ සහිත මෙම බිස්කට් භාවිතය මගින් ළමුන්ගේ පෝෂණීය තත්ත්වය ඉහල අගයක පවත්වා ගැනීමට හැකියාව ඇත.

## ස්වභාවික මිනිරන් භාවිතා කොට ග්‍රැෆේන් හා ග්‍රැෆයිට් සංකලනය

ශ්‍රී ලංකාව ඉතා පිරිසිදු ස්වභාවික මිනිරන් විශාල ප්‍රමාණයක් ඉතා අඩු කිලෝග්‍රෑමයක් ඇමෙරිකානු ඩොලර් 1 ක පමණ මිලකට අපනයනය කරයි. එසේ වුව ද මෙම මිනිරන් භාවිතා කොට නිෂ්පාදනය කෙරෙන ග්‍රැෆේන් කිලෝග්‍රෑමයක් ඇමෙරිකානු ඩොලර් 100,000 ක පමණ මිල කරයි.

ග්‍රැෆේන් වැනි උසස් අගය වැඩි කල නිෂ්පාදනයක් ලංකාවේදී නිෂ්පාදනය කිරීමට හැකියාව ලැබේ නම් එය ශ්‍රී ලංකා දල ජාතික නිෂ්පාදනය ඉහල දැමීමට බෙහෙවින් උපකාරී වේ.

ග්‍රැෆයිඩ් ඔක්සයිඩය ද අධික වෙළඳ වටිනාකමකින් යුක්ත වන අතර එය ග්‍රැෆේන් නිෂ්පාදනයේදී ලැබෙන අන්තර් ඵලයකි. අධ්‍යයන කටයුතු මේ වන විට යොමු වී ඇත්තේ අඩු පිරිවැයක් සහිතව මිනිරන් ග්‍රැෆේන් හා ග්‍රැෆයිඩ් ඔක්සයිඩ සංකලනය දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීම සඳහා සුදුසු පාර්ශව කරුවෙකු තාක්ෂණය හුවමාරු කිරීම සඳහා සොයා ගැනීම කෙරෙහි ය.

# කාර්මික තාක්ෂණ ප්‍රවර්ධනය වේගවත් කිරීම

## පිෂ්ඨය භාවිතා කොට පැසවීම මගින් ග්ලූකෝස් නිෂ්පාදනය

බඩ ඉරිඟු පිෂ්ඨය අමු ද්‍රව්‍යයක් ලෙස යොදා ඊතයිල් මධ්‍යසාරය නිෂ්පාදන තාක්ෂණය ඇක්මී ලංකා ඩිස්ටිලරීස් සමාගමය සඳහා අධ්‍යයනය කරන ලදි. නිෂ්පාදන තාක්ෂණය ලෙස ඊස්ට් භාවිතා කොට සිදු කෙරෙන පැසවීම, සැකසීමේ ක්‍රම වේදය ලෙස යොදා ගන්නා ලදි.

## පලතුරු යොදා මධ්‍යසාර නිෂ්පාදනය පිළිබඳ තාක්ෂණ වාර්තාවක් සැපයීම

ස්වභාවික සම්පතක් ලෙස පවත්නා පලතුරු භාවිතා කොට ඊතයිල් මධ්‍යසාර නිෂ්පාදනය විමර්ශනයට ලක් කෙරිණ. වවුලුගල ඩිස්ටිලරීස් සමාගමය වෙත නිෂ්පාදන තාක්ෂණය පවරා දෙන ලදි.

## රතු මැටියෙන් නිම වූ විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය

දේශීය වශයෙන් පවත්නා අමු ද්‍රව්‍ය යොදා රතු මැටි පසින් විසිතුරු භාණ්ඩ නිෂ්පාදන තාක්ෂණය ප්‍රවර්ධනය කරන ලදි. පුද්ගල ව්‍යවසායකයින් වෙත තාක්ෂණ අයිතිය පවරා නොගෙන හුවමාරු කරන ලදි.

## කක්කල් කැස්ස වැලඳී ඇත්දැයි සොයා දැනගැනීමට පරීක්ෂණ කට්ටලයක්

බැක්ටීරියාවක් ආසාදනය වීමෙන් (*Bordetella pertussis*) ස්පර්ශයෙන් බෝවීම සිදුවන කක්කල් කැස්ස එන්නත් ලබා නොගත් කුඩා ළමුන් තුල ඇති වන රෝගකාරක තත්වයකි. ශ්‍රී ලංකාවේදී මාධ්‍යයක් තුල රෝපණය කර හඳුනාගන්නා ක්‍රමවේදයක් පමණක් පවතී. නමුදු වැඩි වශයෙන් ප්‍රති ජීවක ඖෂධ භාවිතයෙන් පසු පරීක්ෂාවට ලක් කෙරෙන රෝගීන් ඉහත පරීක්ෂාව මගින් හඳුනාගැනීමට නොහැක. වෙළඳ පළෙහි වඩා සංවේදී පරීක්ෂණ කට්ටල ඇතත් ඒවායේ මිල ඉතා අධික මෙන්ම භාවිතය සඳහා මනා දැනුමක් සහිත තාක්ෂණික නිලධාරීන් අවශ්‍ය ය.

කාර්මික තාක්ෂණ ආයතනය ජෛව තාක්ෂණ අංශය මගින් මෞලික ජීවවිද්‍යාව භාවිත කොට කක්කල් කැස්ස රෝගීන් හඳුනා ගැනීම සඳහා වඩාත් සංවේදී මිල අඩු පරීක්ෂණ කට්ටලයක් ප්‍රවර්ධනය කර ඇත. මෙම පරීක්ෂණ කට්ටලය භාවිත කොට Bordetella Portussis බැක්ටීරියාව පමණක් නොව වඩා ප්‍රචලිතව නොපවතින Bordetella parapertussis ආසාදිත තත්ත්වය ද එකම පරීක්ෂණයකින් සිදු කල හැක. විශ්ලේෂණ ක්‍රමවේදය උසස් තත්ත්වයකට පත්කොට සායනික සාම්පල පරීක්ෂා පැවැත්වීමට කටයුතු කරමින් පවතී. පරීක්ෂාව නව මෞලික ජීවවිද්‍යා පාදක රෝග නිශ්චය සඳහා යොදා ගත හැකි පරීක්ෂණ මෙවලමක් ලෙස ශ්‍රී ලංකාවේ රෝහල් වෙත කක්කල් කැස්ස රෝග විනිශ්චය සඳහා හඳුන්වා දීමට අපේක්ෂා කෙරේ.

# කාර්මික තාක්ෂණ ප්‍රවර්ධනය වේගවත් කිරීම

## විවිධ උපකරණ හා භාණ්ඩ නිසිලෙස ක්‍රියා නොකිරීම/අලාභ හානි වීමට හේතු පැහැදිලි කිරීම්

ක්‍රියා විරහිතවීම් හෝ අලාභ හානි සිදුවීම වලක්වාලීම සඳහා ඒ එසේ සිදුවීමට හේතු සාධක මනාව තේරුම් ගැනීම තුලින් නිෂ්පාදනයන්ගේ ගුණාත්මක බව ඉහල දැමීම සේවාදායකයින් තෘප්තිමත් කිරීම සඳහා ඉවහල් වේ. මෙවැනි සේවාවන් ගණනාවක් කාර්මික තාක්ෂණ ආයතනය සේවා දායකයින් ගණනාවක් වෙත විවිධ ක්ෂේත්‍ර එනම්, ලෝහමය නිෂ්පාදන, සිමෙන්ති හා කොන්ක්‍රීට් සඳහා සපයන ලදී.

## විදුලි සංදේශ කුළුණක් මලකෑමට හේතු පැහැදිලි කිරීම

සමහර විදුලි සංදේශ කුළුණු මත මලකෑම හේතුවෙන් දුර්වර්ණ වී ලප කැලැල් මතුවී ඇති බව පෙනී යාමෙන් පසු විමසීමේ දී ඉදි කිරීම සඳහා යොදා ඇති කඳන් මල නොකන ලෝහ මගින් නිෂ්පාදනය කර ඇති බව අනාවරණය කෙරිණ. එසේ නමුදු පරීක්ෂණවලින් අනතුරුව පැහැදිලි වූයේ නිෂ්පාදනය සඳහා භාවිතා කර ඇති ලෝහය බාල තත්ත්වයෙන් යුක්ත බවයි.

## ගැල්වනයිස් කරන ලද කේබලයක තැන්පත්ව තිබූ මලකඩ ඉවත් කොට එයට හේතු පැහැදිලි කිරීම

උස් ගොඩනැගිලි සඳහා භාවිතා කරනු ලබන ගැල්වනයිස් කරන ලද කේබල් මලකෑමට ලක්වන බව වාර්තා වූ අතර කේබලය නිෂ්පාදනය කරන ලද ලෝහ මෙන්ම මලකඩ ද විශ්ලේෂණය සඳහා භාවිතා කරන ලදී. සිදුවීමට හේතුව සොයා ගත් අතර මලකඩ ඉවත් කිරීම සඳහා ද්‍රාවණයක් ද සකසා දෙන ලදී.

## එතීමේදී නූල් පන්දු පටලැවීමට හේතු සොයා බැලීම

නිමි ඇඳුම් හා රෙදිපිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ නූල් පන්දු ඉතා බහුලව භාවිතයට ගනී. එතීමේදී සමහර නූල් පන්දු පටලැවීම ගැටළුවක්ව පැවතිණ. නූල් පන්දුව මධ්‍යයේ ඇති ප්ලාස්ටික් සිලිංඩරාකාර ආධාරකය පැතලි භාවයට පත්වීම පරීක්ෂා කර බැලීම සඳහා නව ක්‍රමවේදයක් ප්‍රවර්ධනය කරන ලදි. නූල මත ඇතිවන ආතති බලය සිලිංඩරාකාර ආධාරකය මත ඇති කෙරෙන තෙරපුම ද පටලැවීමට හේතුවක් වී දැයි යන්න ද අධ්‍යයනයට ලක් කෙරිණ.

# කාර්මික තාක්ෂණ ප්‍රවර්ධනය වේගවත් කිරීම

## කර්මාන්ත සඳහා පර්යේෂණ සංවර්ධන කටයුතු

- අධි ප්‍රතිඔක්සිකාරක සහිත සහල් නිවුඩ්ඩ යෙදූ ස්නැක්ස්
- කල් තබාගත හැකි කාලය දීර්ඝ කල අන්නාසි, අපනයන වෙළඳපල සඳහා
- GMP සහතිකලාභීත්වය සඳහා ගුණාත්මක සැලසුම්
- වයෝගීස් නිෂ්පාදනය සඳහා තාක්ෂණය
- රනිල කුලයේ බෝග මිශ්‍රිත ධාන්‍ය ප්‍රවර්ධනය
- බෝතල් කල වැල්පෙනෙල පානයක්
- සගන්ධ තෙල් ආසවනයෙන් ඉවත් කෙරෙන ජලය යෙදූ අගය වැඩි කල නිෂ්පාදන සඳහා අත්හදා බැලීම්
- තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ සහාය ඇතිව ආයුර්වේද නිෂ්පාදන සමාගම මගින් නිෂ්පාදනය කෙරෙන නිෂ්පාදනයන්ගේ ගුණාත්මක අගය වැඩි කිරීම.

# තරඟකාරීත්වයේදී අනභිභවනීය ස්ථානයක පසුවීම

රාජ්‍ය අංශයේ ප්‍රමුඛතම පරීක්ෂණ සේවා සැපයුම්කරු ලෙස කාර්මික තාක්ෂණ ආයතනය පුද්ගලික හා රාජ්‍ය අංශයේ සංවිධාන වෙත ප්‍රතීතක පරීක්ෂණ සේවා සපයමින් රටෙහි ආර්ථිකය ඉහල නැංවීමට කටයුතු කරයි.

පරීක්ෂණ සේවා 16,000 කට අධික ප්‍රමාණයක් කාර්මික තාක්ෂණ ආයතනයේ විවිධ පරීක්ෂණ රසායනාගාර එනම් රසායන හා ක්ෂුද්‍රජීවී රසායනාගාරය, ද්‍රව්‍ය තාක්ෂණ රසායනාගාරය, කාර්මික මිණුම් රසායනාගාරය, විද්‍යුත් තාක්ෂණ රසායනාගාරය හා ඖෂධ තාක්ෂණ රසායනාගාරය මගින් ඉටු කර ඇත.

### ශබ්ද හා කම්පන ප්‍රමාණ පරීක්ෂා

## කලාපීය සහයෝගීතාව සඳහා දකුණු ආසියානු සංස්කෘතික මධ්‍යස්ථානය නාවිමන, මාතර

SAARC සාර්ක් සංවිධානයේ සංස්කෘතික මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම සඳහා මාතර නාවිමන ප්‍රදේශය ඉතාම උචිත ස්ථානය ලෙස හඳුනාගන්නා ලදි. එසේ වුවද තෝරාගත් ස්ථානයට යාබදව ගල්මෝල් කිහිපයක් පවතී. ගල් පුපුරුවා හැරීම, ගල් කැබලි විසිරී යාම හේතුවෙන් ඇති වන ශබ්ද හා කම්පන ප්‍රමාණය යෝජිත මධ්‍යස්ථානය ඉදිකිරීමේදී මෙන්ම එය භාවිතයට ගැනීමේදී ආරක්ෂාව පිළිබඳව ද බලවත් ගැටළු සහගත තත්වයක් පැවතිණ. මෙම ගල් කුඩු කිරීම හේතුවෙන් ඇති වන උවදුරු හා ආරක්ෂාව පිළිබඳ තක්සේරු කොට අවශ්‍ය උපදෙස් ලබාදෙන ලෙස මධ්‍යම පාරිසරික අධිකාරිය, මාතර පලාත් සංස්කෘතික අමාත්‍යාංශ ලේකම් කාර්යාලය කාර්මික තාක්ෂණ ආයතනය වෙත ඉල්ලීමක් කරන ලද්දේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය (GSMB) හා ඒකාබද්ධ වෙමිනි. කාර්මික තාක්ෂණ ආයතනයේ නිලධාරීන් පිරිසක් එක් එක් කළුගල් නිෂ්පාදන කර්මාන්තයන් හා එක්ව පිපිරවීම් හේතුවෙන් භූමියේ ඇති වන කම්පන, ශබ්ද ප්‍රමාණය හේතුවෙන් යෝජිත ඉදිකිරීම් භූමියේ ඇති වන පීඩන හා වෙනත් බලපෑම් නිරීක්ෂණය කරන ලදි. පරීක්ෂාවට ලක් කල පිපිරවීම් හේතුවෙන් ඇති වන තත්වය පිළිබඳ වාර්තාවක් අධිකාරී ආයතන වෙත සපයන ලදි.

## ආනයනික මත්ස්‍ය ආහාර ශ්‍රී ලංකාවේදී භාවිතයට ගැනීමේදී ඒවායේ ආහාරමය වැදගත්කම භෞතික ගුණාංග හා සම්බන්ධකොට නිරීක්ෂණය කිරීම සඳහා පහසුකම්

මත්ස්‍ය ආහාර ලෙස ගනු ලබන කැටි කොට භාවිතයට යොදන මත්ස්‍ය ආහාර ජලයේදී ස්ථායී වන ආකාරය පිළිබඳව පරීක්ෂාවට ලක් කෙරිණ. කාර්මික තාක්ෂණ ආයතනය මගින් පොකුණු හා වෙනත් මිරිදිය ජලාශ්‍රිත ටැංකි ආදී මත්ස්‍ය වගා කලාප තුල ජලයේ පවත්නා වේගය හා තරංග පිළිබඳ අධ්‍යයනය කොට එම තත්වයන් යටතේ මත්ස්‍ය ආහාර කෙතෙක් දුරට ස්ථායීව පවතී දැයි අධ්‍යයනයට ලක් කෙරිණ.

# තරඟකාරීත්වයේදී අනභිභවනීය ස්ථානයක පසුවීම

කැටිති මත්ස්‍ය ආහාර ජලයේ ගිලී යෑමේ ප්‍රවණතාව/ ස්ථායීතාව පරීක්ෂා කොට ප්‍රමිතියක් ප්‍රවර්ධනය කරන ලදි. ආනයනික මත්ස්‍ය ආහාර එම පරාමිතීන් යටතේ කෙතෙක් දුරට සාර්ථක දැයි විමර්ශනයට ලක් කරන ලදි. නුදුරු අනාගතයේදී මත්ස්‍ය ආහාරමය වැදගත්කම පිළිබඳ පරීක්ෂා කොට වාර්තා සැපයීමට ක්‍රමවේදය යොදාගත හැකි වේ.

## නාවික යාත්‍රා හා බෝට්ටු නිෂ්පාදනයේදී වීදුරු කෙදි (Glass fiber) යොදා ශක්තිමත් කල ප්ලාස්ටික් සඳහා තත්ව පරීක්ෂාවක්

කලාපීය ලෙස බෝට්ටු හා නාවික යාත්‍රා කර්මාන්තය ඉහල වෙළඳපලක් හිමිකරගෙන ඇත. නිෂ්පාදන කර්මාන්තයේදී ගුණාත්මක බවින් ඉහල ප්ලාස්ටික් අමුද්‍රව්‍ය පිළිබඳ ඇගයීම වැදගත් සාධකයක් ලෙස සලකනු ලබන්නේ මෙම නිෂ්පාදන අන්තර්ජාතික නිෂ්පාදන හා සමානත්වයක පැවතීම වැදගත් හෙයිනි. කාර්මික තාක්ෂණ ආයතනයේ ද්‍රව්‍ය පරීක්ෂණ රසායනාගාරය මෙම පරීක්ෂණ සේවා සැපයීමට ඉදිරිපත් වූ අතර ලොයිඩ්ස් සමීක්ෂණ ආයතනය වෙත පරීක්ෂණ සේවා සිදුකෙරෙන ආකාරය පිළිබඳ නිරීක්ෂණය ලියාපදිංචි වීමට ප්‍රථම සිදුකරන ලෙස ඉල්ලීමක් ද කරන ලදි. අනතුරුව මෙම සේවාව මොරෙක්ස් ලංකා පුද්ගලික සමාගම, සෝලාස් මැරීන් පුද්ගලික සමාගම හා නීල් ප්‍රනාන්දු සහ සමාගම මගින් ඉටුකර ගන්නා ලදි.

## වීදුරුවල තාප පරිවාරක ගුණය

වීදුරු කෝප්ප හා වෙනත් භාණ්ඩ සඳහා තාප පරිවාරක ගුණය ඉතා වැදගත් ගුණාංගයක් ලෙස සලකනු ලබන්නේ මෙම භාණ්ඩ අධික උෂ්ණත්වයක් සහිතව භාවිතයට ගනු ලබන හෙයිනි. සාමාන්‍යයෙන් වීදුරු භාණ්ඩ නිෂ්පාදකයින් මෙම ගුණාංගය සඳහා සහතිකයක් ඉදිරිපත් නොකරයි. රසායනාගාරය තුලදී තාපයට කොතෙක් සංවේදී දැයි සහතිකයක් ඉදිරිපත් නොකරයි. රසායනාගාරය තුලදී තාපයට කොතෙක් සංවේදීව භාණ්ඩ භාවිතා කල හැකි බව සනාථ කිරීම සඳහා 50% ක බිඳී යාමට ඇති හැකියාව නිර්ණය කිරීම සඳහා ක්‍රමවේදයක් නිර්මාණය කරන ලදි.

## ප්‍රතීතක ක්‍රමාංකන මිණුම් සේවා

### වෛද්‍ය පරීක්ෂණ සේවාවන් සඳහා ප්‍රතීතක මිණුම් ක්‍රමාංකන සේවා සැපයීම්

ප්‍රමුඛ පෙළේ පුද්ගලික අංශ ආහාර නිෂ්පාදකයින්, සෞඛ්‍ය හා නිම් ඇඳුම් අපනයන කාර්මික තාක්ෂණ ආයතනය සමඟ එක්ව සේවා ලබාගනිමින් තම නිෂ්පාදනයන්ගේ ඉහල තත්වය සුරක්ෂිතව තබා ගැනීම සඳහා කටයුතු කරන ලදි. තම උපකරණ ක්‍රමාංකන මිණුම් සහිතව භාවිතයට ගැනීම සඳහා මාස් හෝල්ඩිංග්ස්, ෆොන්ටෙරා බ්‍රැන්ඩ් ලංකා පුද්ගලික සමාගම, නවලෝක රෝහල් පුද්ගලික සමාගම, ආසිරි රෝහල් පුද්ගලික සමාගම, ලංකා හොස්පිටල්ස් කෝපරේෂන්, කැළණිවැලි ප්ලාන්ටේෂන් පීඑල්සී ආදිය ඉදිරිපත් වේ.

# තරඟකාරීත්වයේදී අනභිභවනීය ස්ථානයක පසුවීම

## ඖෂධීය පැලෑටි හඳුනා ගැනීම

දුර්ලභ ආවේණික ඖෂධ පැලෑටි හඳුනාගැනීම සඳහා ගුණාත්මක ප්‍රමිතීන් සන්සන්දනාත්මකව ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතියක් දියත් කොට, *Rauvolfia serpentina, Rauvolfia canescence* හා *Rauvolfia densiflora, Munronia pinnata, Andrographis panniculata, Withania somnifera* හා *Ruelia tuberose : Plectranthus zeylinicas* හා *Plectranthus amboinius* ආදී ශාක හඳුනාගැනීම සඳහා උචිත ප්‍රමිති ගුණාංග පිළිබඳ අධ්‍යයනය කරන ලදි. පෙනුමෙන් වෙන්කොට හඳුනාගැනීමට අපහසු මෙම ශාක විශේෂ 4 සඳහා ගොනු කල ප්‍රමිති ගුණාංග යොදාගනිමින් වැරදි ලෙස භාවිතයට ගැනීම වලක්වාලීමට හැකියාව ලබාගන්නා ලදි. මෙම ප්‍රමිති ගුණාංග මෙම ශාක භාවිතයට ගන්නා ආයතන හා පුද්ගලයින් මගින් හඳුනාගැනීමට යොදාගනු ඇත.

## සත්‍ය අසමෝදගම් ස්ප්‍රීතු හඳුනාගැනීම

ආමාශගත රෝග මඟහරවා ගැනීම සඳහා අසමෝදගම් ස්ප්‍රීතු ඖෂධීය නිෂ්පාදනයක් ලෙස භාවිතයට ගනී. *Trachyspermum roxburghianum* (Apiaceae පවුලට අයිති) ශාකයේ බීජ හුමාල ආසවනයට ලක් කිරීම මගින් මෙය නිෂ්පාදනය කෙරේ. තයිමෝල් මෙහි ප්‍රධාන සංඝටකයයි. සමහර ඖෂධ නිෂ්පාදකයින් විසින් තයිමෝල් කැට ජලයේ දිය කිරීම මගින් සාදාගත් ජලීය ද්‍රාවණය වෙළඳපලට ඉදිරිපත් කරයි.

මෙම ගැටළුව බරපතල ප්‍රශ්නයක් හෙයින් අවස්ථා ගණනාවකදී උග්‍ර සෞඛ්‍ය නිෂ්පාදන ගැටළුවක් ලෙස කාර්මික තාක්ෂණ ආයතනයේ ඖෂධ විද්‍යා විද්‍යාඥයින් වෙත ගෙන එන ලදි. මෙහිදී නිවැරදි ප්‍රමිතියක් ඇතිව අසමෝදගම් ස්ප්‍රීතු නිෂ්පාදනය සඳහා පරීක්ෂා කල හැකි ආකාරය ඉදිරිපත් කර ඇති අතර මෙය ලේඛනගත කිරීමට සූදානම් කර ඇත.

## රසායනාගාර උපකරණ අළුත්වැඩියා හා නඩත්තු කටයුතු

කාර්මික තාක්ෂණ ආයතනයේ රසායනාගාර උපකරණ නඩත්තු හා අළුත්වැඩියා කිරීමේ සේවා විද්‍යුත් තාක්ෂණ රසායනාගාරය මගින් ඉටුකිරීම තුලින් උපකරණ ක්‍රියාවිරහිතව පැවතීම වැලැක්වීම මෙන්ම බාධාවකින් තොරව පරීක්ෂණ සේවා හා පර්යේෂණ නොකඩවා ඉටුකිරීමට හැකියාව ලැබී ඇත.

# තරගකාරීත්වයේදී අනභිභවනීය ස්ථානයක පසුවීම

## මධ්‍යසාර සඳහා තාක්ෂණික වාර්තාවක්

නව නිෂ්පාදන සඳහා අමුද්‍රව්‍යයක් ලෙස මධ්‍යසාර භාවිතා කරන කර්මාන්තායතන සඳහා මධ්‍යසාර පිළිබඳ තාක්ෂණ වාර්තා උපදේශ සමඟ ආයතන 7 ක් සඳහා සපයන ලදි. මෙම සේවාවන් ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව වෙතින් කල ඉල්ලීමකට අනුව සිදු කරන ලදි.

## නව පරීක්ෂණ ක්‍රම

- වීදුරු කෙඳි (Fiber glass) I කඳන් තුල පවත්නා නැමෙන සුළු බව හා ශක්තිය පරීක්ෂා කිරීම.
- ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය සඳහා අවකාශයේ යොදන විදුලි බල රැහැන් සඳහා පරිවාරක ද්‍රව්‍යයක් ලෙස ග්‍රීස් යොදා ගැනීම පරීක්ෂා කිරීම.
- නාවික යාත්‍රා තුල තට්ටුව සඳහා යොදන පොලිමර් යෙදූ සිමෙන්ති තුල පවත්නා වියලි ඝනත්ව ප්‍රමාණ පරීක්ෂාව.
- දැව වර්ගයන්ගේ දැඩි බව පරීක්ෂා කිරීම ASTM පාදක පරීක්ෂා ක්‍රමයක්. කාර්මික තාක්ෂණ ආයතනයේ ද්‍රව්‍ය තාක්ෂණ අංශය මගින් අවශේෂ අතිරේක ද්‍රව්‍ය නිර්මාණය කරන ලදි.
- බාබකිව් අඟුරු කැට ඇති කැලරි ප්‍රමාණ සඳහා තත්ව පරීක්ෂාව, සංයුතිය විශ්ලේෂණය දහනය වන කාල සීමාව හා උෂ්ණත්වය විදේශීය ගැණුම්කරුවෙකු සඳහා
- ස්වයං පවිත්‍රක රෙදිපිළි තුල පවත්නා ප්‍රකාශ උත්ප්‍රේරණ හැකියා පරීක්ෂාව.

# පාරිසරික දූෂණ තත්වයන් නිරීක්ෂණය හා වැලකුම් ක්‍රියාමාර්ග

කාර්මික තාක්ෂණ ආයතනයේ පාරිසරික තාක්ෂණ සේවා අංශය වෙතින් කර්මාන්ත ක්ෂේත්‍රය වෙතින් කෙරෙන ඉල්ලීම් අනුව සිදුකරනු ලබන පර්යේෂණ හා සංවර්ධන මෙන්ම තාක්ෂණ ප්‍රවර්ධන කටයුතු ශ්‍රී ලංකාවේ පාරිසරික උවදුරු වලකාලමින් සීඝ්‍ර කාර්මික සංවර්ධනයක් සඳහා මංපෙත් සකසා ඇත. ශ්‍රී ලංකා රජය මගින් තිරසාර යහපත් පාරිසරික තත්වයක් ආරක්ෂා කර ගැනීම සඳහා ස්ථාපිත කෙරෙන නීතිරෙගුලාසි සම්පාදනයේදී විශ්වාසදායී උපදේශකයෙකු ලෙස කාර්මික තාක්ෂණ ආයතනය කටයුතු කරන අතරම දේශීය කර්මාන්ත වෙත යහපත් ප්‍රායෝගික තාක්ෂණ ක්‍රම (BPT) සැපයීමේ ප්‍රමුඛ ආයතනය ලෙස ද කාර්මික තාක්ෂණ ආයතනය කටයුතු කරයි. මහත් කැපවීමක් හා සමාජයීය වගකීමක් ද සහිතව ප්‍රතිඵලදායී සාර්ථක විසඳුම් ශ්‍රී ලංකාව සඳහා ඉදිරිපත් කර ඇත.

වසර තුල සේවාවන් 128 ක් පහත සඳහන් ක්ෂේත්‍ර අලලා සපයා ඇත. වා දූෂක තත්ව පාලක කටයුතු, අපවහන ජල ප්‍රතිකාරක, ඝන අප ද්‍රව්‍ය කළමණාකරණය, දැවුම් පද්ධති හා වා සංසරණ පහසුකම් ප්‍රවර්ධන, උවදුරු තක්සේරුකරණය හා විෂ ඝන අප ද්‍රව්‍ය කළමණාකරණ මෙන්ම පාරිසරික කළමණාකරණය.

## අප ජල ප්‍රතිකාරක

## සීනි කර්මාන්තය සඳහා අප ජල ප්‍රතිකාරක යන්ත්‍ර නිර්මාණය

පෙර පැවති හිඟුරාන සීනි කර්මාන්තායතනය ස්ථාපනය සඳහා 2007 වසරේදී ගල්ඔය ප්ලාන්ටේෂන් සමාගම පිහිටුවන ලදි. මෙය 1997 සිට වසා දැමා තිබූ කර්මාන්තශාලාවකි. කර්මාන්තශාලාව අළුත්වැඩියා කටයුතු 2007 වසරේදී ආරම්භ කල අතර 2012 වසරේ සිට නිෂ්පාදන කටයුතු ආරම්භ කොට උක් ඇඹරීමේ කටයුතු දියත් කරන ලදි. 2013 වසරේ අවසානය වන විට සීනි න්ෂ්පාදනයේ අවශේෂ ඵලයක් ලෙස ගැනෙන මොලැසස් භාවිතා කොට ඊතයිල් මධ්‍යසාරය නිෂ්පාදනය සැලසුම් කොට ඇත. සීනි කර්මාන්ත ශාලාව දිනකට මෙ. ටො. 2000 ක ධාරිතාවයකින් ක්‍රියාකිරීමට සැලසුම් කර ඇතත් දැනට මසකට මෙ.ටො. 30,000 ක ධාරිතාවයක් ඇතිව ක්‍රියාත්මක වේ. සීනි නිෂ්පාදනය මෙන්ම සමාන්තරව කෙරෙන ආසවන කටයුතු හේතුවෙන් අධි සාන්ද්‍රිත අප ජලය ඉවත් කිරීම අවට කලාප තුල ඇති පෘෂ්ඨීය ජල ප්‍රභවයන් වෙත උග්‍ර පාරිසරික ගැටළු ඇති කරමින් ගලා යාමට ඉඩ ඇත. එහෙයින් අප ජලය ප්‍රතිකාර කොට ඉවත් කිරීම සඳහා අධික පිරිවැයක් සහිත ප්‍රතිකාරක යන්ත්‍ර අවශ්‍යතාව පැණ නැගින. අනියම් විසඳුමක් ලෙස අප ජල ප්‍රතිකාරක යන්ත්‍ර නිර්මාණය කොට අවශේෂ ජලය භූමියට මුදාහැරීම සඳහා අවස්ථාව උදාකර දෙන ලදි.

# පාරිසරික දූෂණ තත්වයන් නිරීක්ෂණය හා වැලකුම් ක්‍රියාමාර්ග

## ඝන අප ද්‍රව්‍ය භාවිතයට ගැනීම

## යෝජිත කසල අප ද්‍රව්‍ය බලශක්තිය බවට පරිවර්තන ව්‍යාපෘතිය ඇස්තමේන්තු කිරීම

නාගරික ඝන අප ද්‍රව්‍ය භාවිතා කොට බලශක්තිය නිෂ්පාදනය සඳහා පහසුකම් සමයමින් ස්විස්ටර්ලන්තයේ 5එලිමන්ට් කැපිටල් සමාගම මගින් ඩෙල්ටා එනර්ජි හෝල්ඩිංග් සමාගම ශ්‍රී ලංකාවේ ස්ථාපිත කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කරන ලදි. කොළඹ නගර සභාව ද ඇතුලත්ව බස්නාහිර පලාතේ වෙනත් නගර සභා අනුබද්ධව එකතු වන ඝන අප ද්‍රව්‍ය එක්කොට මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. ව්‍යාපෘති සැලැස්මට අනුව බස්නාහිර පලාතේ අක්කර 50 ක භූමි භාගයක් මේ සඳහා අවශ්‍ය වන අතර පිළියන්දල බඳුවිල වත්ත මේ සඳහා නාගරික සංවර්ධන අධිකාරිය (UDA) මගින් එක් ස්ථානයක් ලෙස හඳුනාගෙන ඇත. ව්‍යාපෘති සම්පාදක අංශය මගින් යෝජිත භූමිය මේ සඳහා කෙතෙක් දුරට යෝග්‍ය වන්නේ ද නිශ්චය කිරීම කාර්මික තාක්ෂණ ආයතනයට පවරා ඇත.

කෙසේ වුවද යෝජිත කලාපය ගංවතුර තර්ජනය සහිත ගොඩනැගිලි බහුල යන්ත්‍ර සූත්‍ර ඝන අපද්‍රව්‍ය කඳු මෙන්ම පිර වූ පසින් සංයුක්ත අධි අවදානම් සහිත කලාපයක් ලෙස හඳුනාගත් මේ සඳහා නුසුදුසු බිමක් ලෙස නිශ්චය කිරීමට සිදු විය. එබැවින් ගං වතුර තර්ජනයට හසු නොවන වෙනත් විකල්ප භූමි භාගයක් වඩා සුදුසු බව නිර්දේශ කෙරිණ. සඳහන් කල යුතු කරුණක් වනුයේ කාර්මික තාක්ෂණ ආයතනයේ පාරිසරික තාක්ෂණ අංශයේ සේවාවන් පාරිසරික කළමණාකරණය සිදු කරන ගෝලීයව වැදගත් ආයතන වෙතින් පිළිගත් ආයතනයක් ලෙස සැලකීමට ඉදිරිපත් වීමයි.

## ශබ්ද හා කම්පන දූෂක තත්ව පාලනය

ශබ්ද ප්‍රමාණයන් නිරීක්ෂණය හා මිණුම්ගත කිරීම් හා උපදේශක සේවාවන් සැපයීම මගින් මේ සඳහා පවත්නා දැඩි ඉල්ලුම සපුරාලමින් ශබ්ද දූෂක තත්වයන් වලකාලීමත්, පාලනයත්, පාරිසරික බලපෑම් විශ්ලේෂණය, ශබ්ද සිතියම් / ආදේශක ගොඩනැගිලි කර්මාන්ත ඉදිකිරීම් ක්ෂේත්‍රය, තාප බලාගාර, ගොඩනැගිලි තුල ශබ්ද තත්වයන් / කම්පන, පතල් කැණීම්, නාවික යාත්‍රා ඉදිකිරීම් කර්මාන්තය සඳහා නීතිමය උපදේශනය සඳහා සිදුකරන ලදි.

## දක්ෂිණ අධිවේගී මාර්ගයේ (CENTIC) ඇඹරුම් කර්මාන්තය

දැනට ක්‍රියාත්මකව පවත්නා ප්‍රධාන ව්‍යාපෘති අතර දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ජාතික වශයෙන් ප්‍රධාන තැනක් ගන්නා ව්‍යාපෘතියකි.
ඇතිරීම සඳහා අවශ්‍ය වන මිශ්‍රන හා වෙනත් අමුද්‍රව්‍ය ඇඹරීම සඳහා ව්‍යාපෘතියේ ප්‍රධාන කොන්ත්‍රාත්තුකරු වන චීනයේ ජාතික තාක්ෂණ අපනයන හා ආනයන සංයුක්ත මණ්ඩල සමාගම මගින් මේ සඳහා වැලිගම ප්‍රදේශයේ ඇඹරුම් යන්ත්‍රාගාරයක් ඉදිකරන ලදි.

# පාරිසරික දූෂණ තත්වයන් නිරීක්ෂණය හා වැලකුම් ක්‍රියාමාර්ග

මෙම ඇඹරුම් යන්ත්‍රාගාරය මධ්‍යම පාරිසරික අධිකාරියේ උපදෙස් අනුව ඉදිකර නොතිබුනු අතර අවට පදිංචිකරුවන් අධික ශබ්දය නිසා පාරිසරික උවදුරකට ලක් විය. එහෙයින් කාර්මික තාක්ෂණ ආයතනයට සුදුසු ශබ්ද පාලක තාක්ෂණ ක්‍රම ස්ථාපිත කරන ලෙස ඉල්ලා සිටියේ ය. කාර්මික තාක්ෂණ ආයතනය මගින් උචිත ශබ්ද පාලන තාක්ෂණ ක්‍රම හඳුන්වා දෙමින් කලාපය තුල හා ඒ අවට ශබ්දය අවම වන සේ යන්ත්‍රාගාරය ක්‍රියා කිරීමට පහසුකම් සපයා දෙන ලදි.

## ශබ්ද පාලක Eu-Rtec ආයතනය සඳහා යෝජනා කිරීම

අපනයන වෙළඳපල සඳහා ඝන ටයර් නිෂ්පාදන ආයතනයක් ලෙස Eu-Rtec පුද්ගලික සමාගම තම නිෂ්පාදන කර්මාන්තය සිදු කරයි. භාවිතයට යෙදූ ඝන රබර් ටයර් නැවත ඉතා සියුම් ලෙස කුඩු කිරීම ඇඹරුම් යන්ත්‍රයක් තුලින් මෙහිදී සිදු කෙරේ. මෙම යන්ත්‍රය ක්‍රියාත්මක කරන විට හා භාවිතය නොමැති අවස්ථාවේදී පවා විශාල ශබ්ද ප්‍රමාණයක් නිකුත් කරයි.

යන්ත්‍රාගාරය පැය 24 පුරාම ක්‍රියාත්මක වන නිසා යාබද නිවැසියන් ඉතා අධික ශබ්ද ප්‍රමාණයකට නිරාවරණය වීමෙන් බලවත් අපහසුතාවයකට පත් විය. එබැවින් කර්මාන්තකරු විසින් කාර්මික තාක්ෂණ ආයතනය වෙත ශබ්ද පාලන විධික්‍රම සපයන ලෙස ඉල්ලීමක් කරන ලදි. මූලික විමර්ශනයන්ගෙන් පැහැදිලි වූයේ යන්ත්‍ර ක්‍රියාකරුවන් ඉතා බරපතල ශබ්ද ප්‍රමාණයකට නිරාවරණය වෙමින් කටයුතු කරන බවයි. මූලික විමර්ශනයන්ගෙන් අනතුරුව ශබ්ද වැලකුම් ක්‍රියාමාර්ග ස්ථාපිත කල අතර ඇඹරුම් යන්ත්‍රය අසල මෙන්ම අවට කලාපය තුල ද පවත්නා ශබ්ද ප්‍රමාණය ආරක්ෂිත සීමාවන් දක්වා ගෙන ඒමට හැකියාව ලැබිණ. සතුටුදායක ප්‍රතිඵල ලද Eu-Rtec පුද්ගලික සමාගම වෙතින් වෘත්තීය සෞඛ්‍ය තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා යන්ත්‍රාගාරය අසල වෙනත් කලාප වල ද ශබ්ද ප්‍රමාණ අවම කර ගැනීමට අවශ්‍ය වැලකුම් ක්‍රමවේද තවදුරටත් සපයාදෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.

## පිටත වක්‍රීය අධිවේගී මාර්ගයේ පාරිසරික නිරීක්ෂණ වැඩසටහන්

පිටත වක්‍රීය අධිවේගී මාර්ගයේ උතුරු කලාප 1, ඉදිකිරීමේ ප්‍රධාන කොන්ත්‍රාත්කරු වන TAISAI සංයුක්ත සමාගම වෙතින් පාරිසරික නිරීක්ෂණ කටයුතු දේශීය නෛතික අධිකාරීන්ගේ රෙගුලාසි වලට අනුකූලව සිදුවන බව නිරංතරව නිරීක්ෂණය කිරීම සඳහා කාර්මික තාක්ෂණ ආයතනයීය නිලධාරී කණ්ඩායමක් පත්කරන සේ ඉල්ලා ඇත. ඉදිකිරීම් අතරතුර ඇතිවන ශබ්ද ප්‍රමාණ, කම්පන ප්‍රමාණ හා දූවිලි ප්‍රමාණයන් මැණ බැලීම සඳහා තාක්ෂණික නිලධාරීන් දෙදෙනෙකු පත් කරන ලදි.

# පාරිසරික දූෂණ තත්වයන් නිරීක්ෂණය හා වැලකුම් ක්‍රියාමාර්ග

## පාරිසරික කළමණාකරණ ක්‍රියාකාරී සැලසුමට අනුව ශබ්ද, කම්පන හා දූවිලි ප්‍රමාණ පිළිබඳව කාර්මික තාක්ෂණ ආයතනය විමර්ශනයට ලක් කරන ලදි.

ඉදිකිරීම් කලාපය තුල නිරීක්ෂණ කණ්ඩායම රැඳී සිට සිදු කල නිරීක්ෂණයන් හේතුවෙන් සමාගමට පාරිසරික ගැටළු අවම වන සේ තම කටයුතු මෙහෙයවීමට අවකාශ ලැබිණ. මෙය ජාතික සංවර්ධන ව්‍යාපෘති සඳහා විද්‍යුත් තාක්ෂණ රසායනාගාරය විසින් කලාපයක් තුල රැඳී සිට නිරීක්ෂණ කටයුතු මෙහෙය වූ දෙවන ව්‍යාපෘතියයි.

## වා දූෂණය පාලක කටයුතු

## කුකුල් ගොවිපල තුලින් නික්මෙන දුර්ගන්ධය මගහැරවීමේ අඩු වියදම් දුගඳ මැඩලීමේ ක්‍රියාමාර්ග

කෘතිම වා සංසරණය සහිතව කුකුලන් දහස් ගණනින් එකම වහලක් යට ඇති දැඩි කිරීමේදී ඇති වන ඉතා අධික දුර්ගන්ධය බරපතල පාරිසරික ප්‍රශ්නයක් ලෙස කුකුලු ගොවිපල හිමිකරුවන් මුහුණ දෙන ගැටළුවකි. ගොවිපල තුලින් විහිදුම් පංකා භාවිතා කොට පිටකරනු ලබන වාෂ්පශීලී කාබනික වායූන් අවට පරිසරය තුල මහත් දුර්ගන්ධයක් ඇති කරයි. මෙය මගහැරවීම සඳහා ක්‍රියාත්මක ජෛව පෙරහන පද්ධතීන්ට වඩා අඩු ප්‍රාග්ධනයක් සහිතව ඔක්සිකාරක අවශෝෂණය යොදා නිකුත්වන දුර්ගන්ධය සමනය කිරීම පහසුවෙන් ක්‍රියාකල හැකි ක්‍රමවේදයකි. නිර්මාණය කරන ලද ඒකකය මගින් නිකුත් වන වායුමය දුර්ගන්ධය තෙත් කිරීමෙන් අනතුරුව ඔක්සිකරණය කිරීම කුටියක් තුල සිදු කරයි. මෙවැනි ඒකක දෙකක් හලාවත Five Broiler Growers පුද්ගලික සමාගම සඳහා මෙන්ම වේයන්ගොඩ Kent Poultry Farm පුද්ගලික සමාගම සඳහා ද නිම කර දෙන ලදි.

## වායු විසුරුම් මොඩල

වායුගෝලීය සංසරණමය වායූන්ගේ විසරණ ප්‍රමාණයන් නිර්ණය කොට තීරණ ගැනීම උදෙසා වායු විසරණ මොඩලයන් භාවිතය මූලික ක්‍රම වේදයක් ලෙස සැලකේ.

වායුගෝලයේ දූෂක වායූන්ගේ සංසරණ ක්‍රියාවලිය අධ්‍යයනය කිරීම සඳහා ඇමරිකානු පාරිසරික ආරක්ෂණ අධිකාරිය වෙතින් අනුමත කරන ලද "AERMOD VIEW" වා සංසරණ මෘදුකාංග මොඩලය කාර්මික තාක්ෂණ ආයතනය විසින් දූෂක වායූන් වායුගෝලයේ පවත්නා ප්‍රමාණයන් නිර්ණය කිරීම සඳහා භාවිතා කරයි.

වසර තුලදී වායු සංසරණ මොඩල යොදා සිදු කල අධ්‍යයන දෙකක් එනම් යෝජිත අරුවක්කලු සිමෙන්ති කම්හල හා යාපනයේ විදුලි බලාගාරයේ දූෂක වායූන්ගෙන් සිදුවිය හැකි පාරිසරික බලපෑම ඇස්තමේන්තු කිරීම සඳහා යොදාගන්නා ලදි.

# පාරිසරික දූෂණ තත්වයන් නිරීක්ෂණය හා වැලකුම් ක්‍රියාමාර්ග

## පරන්තන් රසායනික ද්‍රව්‍ය සමාගම් කර්මාන්තශාලාවේ අවදානම් තත්වයන් විමර්ශනය

2008 වසරේ සිට කළුතර ෆුලර්ටන් කාර්මික ජනපදයේ පිහිටි පරන්තන් රසායනික ද්‍රව්‍ය සමාගම ක්ලෝරීන් ආනයනය, ගබඩා කිරීම හා නැවත පැටවීම සිදුකරන කර්මාන්තයකි. ජල සම්පාදන මණ්ඩලයට අවශ්‍ය සම්පූර්ණ ක්ලෝරීන් ප්‍රමාණය පරන්තන් රසායන ද්‍රව්‍ය සමාගම මගින් ඉටු කරයි. අලෙවිය සඳහා කිලෝ ග්‍රෑම් 68 ක ධාරිතාව සහිත ක්ලෝරීන් සිලිංඩර නැවත පිරවීම ද සිදු කරයි.

2004 අප්‍රේල් මාසයේදී හදිසියෙන් නිකුත් වූ ක්ලෝරීන් වායු පිටාර ගැලීමෙන් පසු මධ්‍යම පරිසර අධිකාරිය වෙතින් නිකුත් කර තිබූ පාරිසරික ආරක්ෂණ බලපත්‍රය අවලංගු කරන ලදි. ක්ලෝරීන් නැවත පිරවීම තාවකාලිකව පිටස්තර පාර්ශවයකට භාරදෙන ලදි. පාලක කටයුතු කිහිපයක් නැවත ස්ථාපිත කිරීමෙන් අනතුරුව පරන්තන් රසායන ද්‍රව්‍ය සමාගම නැවත ක්ලෝරීන් ඇසිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙත පාරිසරික ආරක්ෂණ බලපත්‍රය නිකුත් කරන ලෙස අයදුම් පතක් ඉදිරිපත් කරන ලදි. ඒ සමඟම පරන්තන් රසායන ද්‍රව්‍ය නිෂ්පාදන සමාගම කාර්මික තාක්ෂණ ආයතනය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරමින් ඉල්ලා සිටියේ ආපදාවකදී ඇතිවිය හැකි යැයි සිතෙන උපරිම අනතුරුදායක තත්වය මෙන්ම වෙනත් අනතුරුදායක තත්වයන් සැලකිල්ලට ගනිමින් හානි සිදුවිය හැකි කලාප පිළිබඳ ප්‍රාථමික ආපදා ඇගයීමක් සිදුකරන ලෙසයි. උපකල්පිත තත්වයන් අධ්‍යයනයට ලක්කොට විමර්ශනයකින් අනතුරුව කාර්මික තාක්ෂණ ආයතනය ආපදා සිදුවිය හැකි යැයි හැගෙන කලාප පරන්තන් රසායන ද්‍රව්‍ය සමාගම වෙත උපදෙස් දෙන ලදි.

## මානව සුභ සාධන හා සමාජ ආර්ථික ප්‍රවර්ධනය සඳහා තාක්ෂණය

### බැක්ටීරියා හා කාබනික අපද්‍රව්‍ය මගින් දූෂිත වූ ජලය පවිත්‍රකරණය සඳහා සූර්යබල ප්‍රතිකාරක යන්ත්‍රයක් අඩු වියදමකින් සැපයීම

ප්‍රතිබැක්ටීරියාකාරක හා ප්‍රකාශ උත්ප්‍රේරක ක්‍රියාකාරීත්වය ඇති සූර්ය බල ශක්තියෙන් ක්‍රියාකෙරෙන නව ගෘහස්ත ජල පවිත්‍රකාරකයක් නිර්මාණය කර පරීක්ෂණයට ලක් කෙරිණ. පළමු අදියරේ පරීක්ෂණ කටයුතු නිම කර ඇති අතර ප්‍රකාශ උත්ප්‍රේරක ආලේපනය හා ප්‍රතිකාරකයේ නිර්මාණ කටයුතු මේ වන විට ප්‍රවර්ධනය කරමින් පවතී.

### ආහාර කර්මාන්තය සඳහා සියඹලා ඇට මගින් පෙක්ටීන් නිෂ්පාදනය

අපද්‍රව්‍යයක් ලෙස ඉවත දමන සියඹලා ඇට ආහාර කර්මාන්තයේදී උපයෝගී කර ගැනීම සඳහා අධ්‍යයනයට ලක් කෙරිණ. අඹ, ජෑම් හා දොඩම් කෝඩියල් නිෂ්පාදනය සඳහා සියඹලා ඇට මගින් නිස්සාරණය කල කුඩු හා දියර පෙක්ටීන් භාවිතයට යොදා ගන්නා ලදි. රසය හා සුවඳින් වෙළඳපල අලෙවියට ඇති නිෂ්පාදන හා සන්සන්දනාත්මකව මෙය ඉහල තත්වයක ඇති බව පැහැදිලි වූ අතර තාක්ෂණය කර්මාන්තයක් ලෙස නිෂ්පාදනය සඳහා පැවරීමට සූදානම් ය.

### ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කෙරෙන ජාඩි ගුණාත්මකව වැඩිදියුණු කිරීම

නිවැරදි ප්‍රමාණයන්ට අමුද්‍රව්‍ය යොදා නිශ්චිත තත්ව යටතේ ප්‍රමිතිගත බැක්ටීරියා ආසාදනයන් ප්‍රමාණාත්මකව යෙදීමෙන් ජාඩි නිෂ්පාදනයේ ප්‍රමිතිය ඉහල තත්වයකට ගෙන ඒමට හැකි වී ඇත. ක්ෂුද්‍රජීවීමය ජෛව කොටස් වෙන් කොට හඳුනාගැනීම සඳහා ප්‍රථමයෙන් විවිධ ජාඩි සාම්පල එක්රැස් කර අඩංගු බැක්ටීරියා හා පුස් විශේෂ හඳුනාගන්නා ලදි. කාර්මික තාක්ෂණ ආයතනයේ ආහාර විද්‍යා රසායනාගාරයේ මත්ස්‍ය නිෂ්පාදන අංශයේදී ජාඩි නිෂ්පාදනය සම්මත සෞඛ්‍ය පුරුදු සහිතව නිෂ්පාදනය කර ක්ෂුද්‍රජීවීමය කල් පවත්නා කාල වකවානු විශ්ලේෂණය කරන ලදි. ව්‍යාපෘතිය මගින් ජාඩි නිෂ්පාදනයන්ගේ ගුණාත්මක අගය වැඩි කරමින් අයහපත් පුරුදු හේතුවෙන් ඇති විය හැකි නුසුදුසු ද්‍රව්‍යයන්ගෙන් තොරව සෞඛ්‍යදායී පැසවීමෙන් නිෂ්පාදනය කෙරෙන මත්ස්‍ය ආහාරයක් නිෂ්පාදනය කිරීමට අවකාශ සපයන ලදි.

### ක්‍රිකට් ක්‍රීඩාංගන ආවරණ සඳහා තත්ව පරීක්ෂා

ක්‍රිකට් ක්‍රීඩාංගනයන්ගේ තණතිලි ආවරණ, ක්‍රිකට් ලෝකයේ අත්‍යවශ්‍ය අංගයකි. මෙම ආවරණ සතු ගුණාංග අතර ඉරී වෙන්වීමට ප්‍රතිරෝධක බව, සිදුරු නොවීම, කාන්දු රහිත වීම, අඩු ඝනත්වය සහිත වීම ආදී වැදගත් ගති ලක්ෂණයන් ය.

මිලදී ගැනීමට ප්‍රථම මෙම ගුණාංග, සාම්පල තුල ඇත් දැයි පරීක්ෂා කරන ලෙස ශ්‍රී ලංකා ක්‍රිකට් මණ්ඩලය මගින් කාර්මික තාක්ෂණ ආයතනය වෙත පවරණ ලදි. අවශ්‍ය පරීක්ෂණ ක්‍රම විධි නිර්මාණය කොට යෝග්‍යතාව මැණ බැලීම සිදුකල අතර නිර්දේශිත නිෂ්පාදන මේ වන විට ශ්‍රී ලංකා ක්‍රිකට් මණ්ඩලය මගින් භාවිතයට යොදා ඇත.

# මානව සුභ සාධන හා සමාජ ආර්ථික ප්‍රවර්ධනය සඳහා තාක්ෂණය

## රොන්මඩ හා මුහුදු වැලි තුල විෂ ද්‍රව්‍ය ඇති ප්‍රමාණ නිර්ණය කිරීම

වැල්ලවත්ත ඇල මාර්ගයේ පවත්නා රොන් මඩ තුල පවත්නා විෂ සහිත ප්‍රමාණ තක්සේරු කිරීම සඳහා අධ්‍යයනයක් සිදු කරන ලදි. මෙම අධ්‍යයනයේදී ර්යම්, කැඩ්මියම්, ක්‍රෝමියම්, තඹ, බේරියම්, මොලිබ්ඩිනියම්, නිකල් හා තුත්තනාගම් ප්‍රමාණ මැණ බලන ලදි. සමාන අධ්‍යයනයක් උස්වැටකෙයියාව ළමා උද්‍යානය ඉදිකිරීමට යෝජිත මුහුදු වෙරළේ වැලි සඳහා ද සිදු කෙරිණ. ඉහත සාම්පල කැට ප්‍රමාණ විහිදී ඇති ආකාරය හා විෂ මූල ද්‍රව්‍ය සඳහා ද පරීක්ෂා කරන ලදි.

## තල් කොල නිෂ්පාදනයන්ගේ පවත්නා පුස් මැඩපැවැත්වීම

නොමේරූ තල් කොල පාරම්පරිකව විසිතුරු භාණ්ඩ හා වියමන් යොදා නිෂ්පාදනය කරන ඇසුරුම් සඳහා භාවිතා කරයි. කර්මාන්තයේදී පාරම්පරික දැනුම එක් පරම්පරාවකින් තවත් පරම්පරාවකට රැගෙන යයි. මෙම නිෂ්පාදන අධික ආර්ද්‍රතාවයක් සහිතව දීර්ඝ කාලීනව තබා ගැනීමේදී පුස් හට ගැනීම හේතුවෙන් නිෂ්පාදන විනාශ වී යාම ගැටළුකාරී තත්වයකි. ජාතික මෝස්තර මධ්‍යස්ථානය වෙතින් මේ පිළිබඳව අධ්‍යයනය කොට සුදුසු විසඳුමක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අතර අප අධ්‍යයනයන් මගින් රසායනික ප්‍රතිකර්මයක් මගින් පුස් ඇති වීම වලකා සිදුවන හානිය වලකා ගැනීමට හැකි බව පෙනී ගිය අතර කාර්මික තාක්ෂණ ආයතනය මගින් ආහාර සඳහා කල් තබා ගැනීම්දී භාවිත විෂ ප්‍රමාණය අවම රසායන ද්‍රව්‍ය භාවිතයට ගන්නා ලෙස උපදෙස් දෙන ලදි.

# පුහුණු වැඩසටහන් හා වැඩමුළු

කර්මාන්ත, රාජ්‍ය ආයතන හා පර්යේෂණ මධ්‍යස්ථාන සඳහා පුහුණු වැඩසටහන් පහත සඳහන් ක්ෂේත්‍ර අලලා පවත්වන ලදි.

## ආයතන / සමාගම් සඳහා පුහුණු

- නිඩ්‍රෝ සප්ලයි පුද්ගලික සමාගම - අන්නාසි භෝගයේ පෙර හා පසු අස්වනු තාක්ෂණය
- ඒට්කන් ස්පෙන්ස් හෝටල් කළමණාකරන පුද්ගලික සමාගම - ආහාර තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන
- එපේරල් ටෙක්නොලොජි පුද්ගලික සමාගම - උෂ්ණත්වය, දිග, පළල හා පීඩන මිණුම් පිළිබඳ කාර්මික මිණුම්කරණය
- ශ්‍රී ලංකා ආහාර කෘෂි කාර්මික සංවිධානය හා ජාතික ජලජ සංවර්ධන අධිකාරිය - මත්ස්‍ය සැකසුම් පිළිබඳව
- ශ්‍රී ලංකා රේගුව සඳහා හයිඩ්‍රෝකාබන තෙල් සාම්පල - ඇනිලීන් අංකය හා FT-IR විශ්ලේෂණය පිළිබඳව
- ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා - කාර්මික මිණුම්කරණය
- ජාතික අධ්‍යාපන ආයතනයීය ගුරුවරුන් සඳහා ආහාර තාක්ෂණ සිද්ධාන්ත හා ප්‍රායෝගික පුහුණු වැඩමුළුව
- පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - රනිල ධාන්‍ය හා මේදය සහිත භෝග ආහාර ලෙස පෝෂණීය ප්‍රමාණ විශ්ලේෂණය

## කණ්ඩායම් පුහුණු

- දියර සබන් අත් සේදීම සඳහා නිෂ්පාදනය
- පැහැදිලි ප්ලාස්ටික් භාවිත විසිතුරු භාණ්ඩ
- ආයුර්වේද වෛද්‍යවරුන් හා නව ව්‍යවසායකයින් සඳහා ඖෂධීය අමුද්‍රව්‍ය, ආලේපන, ඖෂධීය තේ, මිශ්‍රිත ඖෂධීය ආයුර්වේද තෙල් අගය වැඩි කොට නිෂ්පාදනය
- කර්මාන්තකරුවන් සඳහා ආහාර තාක්ෂණ පිළිබඳ සහතික
- ක්ෂණික බීම වර්ග නිෂ්පාදනය
- ක්ෂණික ඉදිආප්ප පිටි නිෂ්පාදනය
- පළතුරු හා එළවළු සඳහා පසු අස්වනු තාක්ෂණය
- දියර අත්සෝදන, මදුරු විකර්ශක කූරු, හඳුන් කූරු, පැහැදිලි ප්ලාස්ටික් යෙදූ විසිතුරු භාණ්ඩ, රෙදිපිළි මෘදුකාරක නිෂ්පාදන
- ජෛවීය විශ්ලේෂණ ක්‍රම
- ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය
- අප ජල ප්‍රතිකාරක යන්ත්‍ර ක්‍රියාකරුවන් සඳහා හැකියා ප්‍රවර්ධන පුහුණු
- ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාල විද්‍යාවේදී සිසුන් සඳහා ප්‍රායෝගික සැසියක්

# පුහුණු වැඩසටහන් හා වැඩමුළු

## විදාතා ප්‍රතිව්‍යුහගත කෙරෙන වැඩසටහන්

විදාතා වැඩසටහන යටතේ කලාපීය වශයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා වෙනත් ආයතන යටතේ කුඩා, මධ්‍යම හා ක්ෂුද්‍ර ව්‍යවසායකයින් අතුරින් 51 දෙනෙකු පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා පුහුණු කරන ලදි.

- ඖෂධීය අමුද්‍රව්‍ය, පසු අස්වනු තාක්ෂණ ක්‍රම, සෝයාමීට් රසකාරක හා කුළුබඩු ආශ්‍රිත නිෂ්පාදන
- නියැදි පරීක්ෂාව හා සෞඛ්‍ය පුරුදු
- හතු වගාව
- තාක්ෂණ පිළිබඳ දැනුවත් කිරීම්
- කිරි යෙදූ නිෂ්පාදන
- සහල් ආශ්‍රිත නිෂ්පාදන
- පළතුරු සැකසුම්, ජෑම් නිෂ්පාදනය, කෝඩියල් හා ක්ෂණික බීම
- දියර අත් සෝදන, මදුරු විකර්ශන කූරු, හඳුන්කූරු, පැහැදිලි ප්ලාස්ටික් භාවිත විසිතුරු භාණ්ඩ, රෙදිපිළි මෘදුකාරක, පැස්ටල් හා ක්‍රෙයෝන්
- ඊ ෆාම් වෙබ් අඩවි පිළිබඳ දැනුවත් කිරීම

## දිවිනැගුම වැඩසටහන සඳහා කාර්මික තාක්ෂණ ආයතනයේ දායකත්වය

ආර්ථික සංවර්ධන සඳහා රාජ්‍ය අනුග්‍රාහය ඇතිව ක්‍රියාත්මක දිවි නැගුම සඳහා දිරි ගැන්වීමේ වැඩසටහන්, පුහුණු වැඩසටහන් හා බැංකු සායන කාර්මික තාක්ෂණ ආයතනය මගින් පවත්වන ලදි. වසර තුල 1000 කට අධික පුද්ගලයින් සංඛ්‍යාවක් වැඩසටහන් 31 ක් පවත්වමින් පුහුණු කරන ලදි. දිවි නැගුම දිරි ගැන්වීම් වැඩසටහන් ස්ථාන 13 කදී ද, දිවි නැගුම පුහුණු වැඩසටහන් ස්ථාන 11 කදී ද, දිවි නැගුම බැංකු සායන ස්ථාන 7 කදී ද පවත්වන ලදි.

## උපාධි අපේක්ෂක පුහුණු වැඩසටහන්

පහත සඳහන් විශ්ව විද්‍යාල හා ආයතනයීය සිසුන් පුහුණු කරන ලදි.

- දේශීය ආයුර්වේද වෛද්‍ය ආයතනය, කොළඹ විශ්ව විද්‍යාලයේ සිසුන් තිදෙනෙක්
- රසායන විද්‍යා ආයතනයේ සිසුන් දෙදෙනෙක්
- වයඹ විශ්ව විද්‍යාලයේ සිසුන් දෙදෙනෙක්
- රජරට විශ්ව විද්‍යාලයේ සිසුන් දෙදෙනෙක්
- යාපනය සිද්ධ ආයුර්වේද විශ්ව විද්‍යාලයේ එක් සිසුවෙක්
- සබරගමුව විශ්ව විද්‍යාලයේ එක් සිසුවෙක්
- රුහුණු විශ්ව විද්‍යාලයේ එක් සිසුවෙක්

# ධාරිතා ගොඩනැගුම හා ඵලදායිතා ප්‍රවර්ධනය

## පශ්චාත් ආචාර්ය පුහුණු

1. ආචාර්ය ඉල්මී හේවාජුලිගේ, බයෝටික හා ඒ බයෝටික තත්ව යටතේ පැපොල් බෝගයේ විටෝසාන ආවරණ යහපත් ලෙස යෙදීම, පශ්චාත් ආචාර්ය පුහුණු වැඩසටහන, ජාතික ආහාර පර්යේෂණ ආයතනය, සුකුබා, ජපානය.

## ආචාර්ය අධ්‍යයනයන්

1. ආර්. එම්. ධර්මදාස, පිරිනැමීම - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාවේ පවත්නා බිං කොහොඹ *Munronia pinnata* (Wall) ශාකයේ ප්‍රභේද පිළිබඳ මෙන්ම එහි අඩංගු මැලේරියා මර්ධන හැකියා අධ්‍යයනය.

2. තේජා හේරත්, කැළණිය විශ්ව විද්‍යාලය, අචාර්ය උපාධි ප්‍රභන්ධය - දේශීයව වගා කෙරෙන සමහර සහල් ප්‍රභේද තුල අඩංගු යකඩ ප්‍රමාණය ජෛවීය සිරුරට අවශෝෂණය කර ගැනීමේ හැකියා ප්‍රවර්ධනය.

3. සී. එම්. මනෝරත්න, කොළඹ විශ්ව විද්‍යාලයේ තම ආචාර්ය උපාධි අධ්‍යයන කටයුතු සිදු කරමින් ලිතියම් යෙදූ බැටරි නිෂ්පාදනය සඳහා ග්‍රැෆේන් හා ග්‍රැෆේන් සංකලන වර්ගීකරණ හා සංයෝජනය.

4. කාංචනා අබේසේකර, ආචාර්ය උපාධි අධ්‍යයනය, කොළඹ විශ්ව විද්‍යාලය, ප්‍රබන්ධය - ශ්‍රී ලාංකීය පාරම්පරික සහල් ප්‍රභේද භෞත රසායනික හා ජෛව ක්‍රියාකාරීත්වය සඳහා පරීක්ෂා.

5. ඩබ්. පී. කේ. එම්. අබේසේකර, ආචාර්ය උපාධි අධ්‍යයන කටයුතු කොළඹ විශ්ව විද්‍යාලය, ප්‍රබන්ධය - තෝරාගත් ජෛව ක්‍රියාකාරී ගුණාංග මගින් ශ්‍රී ලංකා කුරුඳු භාවිතයෙන් ලැබිය හැකි සෞඛ්‍ය ආරක්ෂණ ප්‍රතිලාභ.

6. රුවන් වීරසිංහ, කොළඹ විශ්ව විද්‍යාලයේ ආචාර්ය උපාධි අධ්‍යයන කටයුතු සඳහා ලියාපදිංචි විය. ප්‍රබන්ධය - අම්ල වැසි නිරීක්ෂණය සඳහා මධ්‍යස්ථානයක්.

## විද්‍යාපති (M.Sc)/දර්ශනවේදී (M.Phil) අධ්‍යයන කටයුතු

1. එල්. සී. ඩී. නයනජිත්, කොළඹ විශ්ව විද්‍යාලයේ දර්ශනවේදී උපාධි අධ්‍යයන සිදු කරමින් සිටී. ප්‍රබන්ධය - බැටරි නිෂ්පාදනයේදී භාවිතා කෙරෙන ග්‍රැෆේන් හා ගැෆේන් සංකලන තුල පැවතිය යුතු ගුණාංග වර්ගීකරණය.

2. එම්. එස්. එන්. අරූස්, විද්‍යාපති උපාධි අධ්‍යයන කටයුතු ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ සිදුකරමින් පවතින අතර, ප්‍රබන්ධ ලෙස කාර්යාල තුලදී ජංගම පරිඝනක භාවිතයට යොදා ගැනීමේදී බලශක්ති පිරිමැසීම.

## ධාරිතා ගොඩනැගුම හා ඵලදායිතා ප්‍රවර්ධනය

3. කේ. එම්. ටී. අබේසේකර, පුස්තකාල විද්‍යාව පිළිබඳ උපාධි අධ්‍යයන කටයුතු කොළඹ විශ්ව විද්‍යාලයේදී සිදු කරමින් සිටින අතර ප්‍රබන්ධය ලෙස දේශීය ඖෂධ කර්මාන්ත ක්ෂේත්‍රයේ දැනගත යුතු තොරතුරු පිළිබඳව සාර්ථක නිෂ්පාදන බිහි කිරීම අරමුණු කොට සිදුකරමින් සිටී.

4. ර්. එම්. එස්. ඉසංකා විශ්ලේෂණ රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධි අධ්‍යයන කටයුතු, ශ්‍රී ලංකාවේ බහුල ලෙස භාවිතා කෙරෙන කෘෂි නිෂ්පාදනයන්ගේ ආහාරමය සංඝටක පිළිබඳව අධ්‍යයන කටයුතු කොළඹ විශ්ව විද්‍යාලයේදී සිදු කරමින් සිටී.

5. වසුන්දරා දිවිසේකර දර්ශනවේදී (M.Phil) උපාධි අධ්‍යයනය කොළඹ විශ්ව විද්‍යාලයේදී සිදු කරමින් පවතී. ආසාදිත තත්වය පාලනය සඳහා අනියම් ලෙස සහජීවක සංයෝග සහිත ඖෂධීය ගුණ ඇති ආහාර නිෂ්පාදන.

6. එස්. එස්. කේ. මැදගේ දර්ශනවේදී (M.Phil) උපාධිය, විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, සත්ව විද්‍යා විෂය අනුබද්ධ අධ්‍යයන කටයුතු සඳහා ලියාපදිංචි විය.

7. කේ. වී. ටී. ගුණවර්ධන, දර්ශනවේදී (M.Phil) උපාධි අධ්‍යයන කටයුතු කෘෂි විද්‍යා තාක්ෂණ පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, ආහාර තාක්ෂණ විද්‍යා අංශය.

8. ඩී. එස්. සමරවික්‍රම, විද්‍යාපති උපාධි අධ්‍යයන කටයුතු සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ ලියාපදිංචි විය. ශ්‍රී ලංකාවේ අඹ බෝගය ඇසිරීම සඳහා ස්වභාවික තන්තු පාදක ඇසුරුම් හඳුන්වාදෙමින් පසු අස්වනු හානි වැලැක්වීම.

### පශ්චාත් උපාධි ඩිප්ලෝමා

1. නිසල ගුණසේකර, නිෂ්පාදන කළමණාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව කොළඹ විශ්ව විද්‍යාලයේදී සම්පූර්ණ කරන ලදි.

2. එන්. ගීකියනගේ, පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, NILIS, කොළඹ විශ්ව විද්‍යාලයේ ලියාපදිංචි විය.

### කෙටිකාලීන පුහුණු

1. රම්‍යා විජේසේකර, ICTHD ආයතනයේ තෙදින වැඩමුළුව - අප ජලය එක් කිරීම, ප්‍රතිකර්ම හා බැහැර කිරීම හා ප්‍රවේශීය ජල ධාරා ලෙස නැවත භාවිතය. (2012 අප්‍රේල්)

2. හසන්ති දිසානායක, ජාතික බුද්ධිමය දේපල කාර්යාලය මගින් සංවිධානය කල කලාපීය සමුළුව, එක්දින වැඩමුළුවකට සහභාගී විය. (2012 මැයි)

3. සී. කේ. නානායක්කාර හා තිලක් ගුණසේකර - ඉන්ධන අර්බුදයට විසඳුම් ලෙස අනියම් බලශක්තීන් භාවිතය - රසායන විද්‍යා සංගමය සංවිධානය කල එක් දින වැඩමුළුව. (2012 ජූනි)

## ධාරිතා ගොඩනැගුම හා ඵලදායිතා ප්‍රවර්ධනය

4. ඩබ්. ජේ. කේ. ඩී. රන්පටිගේ, MEPA හා IMO සංවිධානය කල OPRC ගිවිසුම හා OPRC-HNS කෙටුම්පත පිළිබඳ සිව්දින ජාතික වැඩමුළුව. (2012 ජූනි)

5. සුදීපමා වැලිවල, උණ වගාව භාවිතය, සැකසුම් ක්‍රම දියුණු වන රටවල් සඳහා පුහුණු වැඩමුළු, චීන ජාතික උණ පර්යේෂණ මධ්‍යස්ථානය විසින් ජූනි 20 - අගෝස්තු 14 දක්වා සංවිධානය කරන ලදි.

6. පී. ටී. ජයසිංහ හා සී. කේ. නානායක්කාර - IIESL මගින් සංවිධානය කරන ලද උසස් ඵලදායීතාවක් හා යහපත් පරිසරයක් උදෙසා සංවිධානය කල එක් දින වැඩමුළුව (2012 ජූලි මස)

7. එස්. පී. අයි. උළුවිස් හේවගේ - ඉංජිනේරුමය කාර්යයන් සඳහා පොලිමයිඩ 66 සංකලන යොදා සවිමත් කල පිලර් වර්ග භාවිතය සඳහා සංවිධානය කල එක් අවුරුදු වැඩසටහන, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.

8. ඒ. රත්නකුමාර, රසායන විද්‍යා සංගමය සංවිධානය කල උපකරණ භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන සඳහා සහභාගී විය.

9. එච්. එච්. කේ. අවලා, ව්‍යවහාරික සංඛ්‍යාන ආයතනය මගින් සංවිධානය කල ‘Basic SPSS’ පුහුණු වැඩසටහන (ජූලි 14, 22, 29 හා 2012 අගෝස්තු 5 දින) සහභාගී විය.

10. තිලක් ගුණසේකර හා පී. වී. ජයසිංහ - ශ්‍රී ලංකා ප්‍රතීතන ආයතනය විසින් සංවිධානය කල වාහන දුම් පරීක්ෂණ මධ්‍යස්ථාන සඳහා සාමාර්ථතා ඇගයීම පිළිබඳ පස් දින පුහුණු වැඩමුළුව සඳහා 2012 අගෝස්තු මස සහභාගී විය.

11. ඩබ්. එම්. වී. පී. වීරසිංහ, තොරතුරු කළමණාකරණය සඳහා තොරතුරු තාක්ෂණය, NISCAIR හා SAARC ලේඛන මධ්‍යස්ථානය, නව දිල්ලිය, පුහුණු වැඩමුළුව සඳහා සහභාගී විය (2012 සැප්තැම්බර් - 2012 දෙසැම්බර්).

12. තිලක් ගුණසේකර හා පී. වී. ජයසිංහ, ICTAD විසින් කල ගොඩනැගිලි තුල බලශක්ති සංරක්ෂණ ක්‍රම පිළිබඳ එක් දින පුහුණු වැඩමුළුව සඳහා සහභාගී විය (සැප්තැම්බර් 2012).

13. එස්. ඒ. ජී. එල්. පෙරේරා, ජාතික ව්‍යාපාර කළමණාකරණ ආයතනය විසින් සංවිධානය කල ‘Secretarial Practices’ පස් දින වැඩමුළුව සඳහා සහභාගී විය (සැප්තැම්බර් 2012).

14. රම්‍යා විජේසේකර, ආපදා කළමණාකරණ මධ්‍යස්ථානය විසින් සංවිධානය කල ආපදා කළමණාකරණය පිළිබඳ එක් දින වැඩමුළුවට සඳහා සහභාගී විය (ඔක්තෝම්බර් 2012).

15. සී. මෙදිස්, ‘සුළු හා මධ්‍ය පරිමාණ ආහාර සැකසුම් ආයතන සඳහා යහපත් ගුණාත්මක හා ආරක්ෂණ විධි ක්‍රම විවිධ රටවල් සඳහා’ ආසියානු ඵලදායිතා සංවිධානය විසින් ඉදිරිපත් කල පුහුණු වැඩමුළුව සඳහා සහභාගී විය (2012 නොවැම්බර් 12 – 17).

16. එච්. එච්. කේ. අවලා හා අයන්තිකා ප්‍රනාන්දු, ‘ජෛව පරීක්ෂණ ක්‍රමවේද’ ශාක තාක්ෂණ අංශය, කාර්මික තාක්ෂණ ආයතනය විසින් සංවිධානය කල වැඩමුළුව සඳහා සහභාගී විය (2012 දෙසැම්බර් 8 – 20).

# ධාරිතා ගොඩනැගුම හා ඵලදායිතා ප්‍රවර්ධනය

17. නිසල ගුණසේකර, ගයන්ති ද සිල්වා, සුදීපමා වැලිවල - 'ආහාර ආරක්ෂණය හා පසු විපරම්' ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශයේ, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් සංවිධානය කල E.learning පාඨමාලාව සඳහා සහභාගී වූහ (2012 දෙසැම්බර් 11 – 13).

18. කරුණා අපෝන්සු, කයිසාන් කළමණාකරණ හා සුපර් 5S පිළිබඳව කම්කරු අධ්‍යයනය පිළිබඳ ජාතික ආයතනය විසින් පවත්වන ලද පුහුණු වැඩසටහන සඳහා සහභාගී විය.

19. ඩබ්. එච්. එස්. විජේසිංහ, අධි සංවේදී මල්ටි ප්‍රොඩක්ට්ස් ක්‍රමාංකණය පිළිබඳව විද්‍යුත් මාණ ක්ෂේත්‍රය මැයෙන් Fluke South East Asia පුද්ගලික සමාගම මගින් සංවිධානය කල වැඩමුළුවට සහභාගී විය.

20. එස්. සමරසේකර හා පී. එච්. ජයසිංහ, SLAAS මගින් සංවිධානය කල නවීන විද්‍යාත්මක පර්යේෂණ හා තාක්ෂණ හුවමාරුව හා වාණිජකරණය පිළිබඳ වැඩමුළුවට සහභාගී වූහ.

21. කේ. ඩබ්. ටී. අබේසේකර, NILIS ආයතනය විසින් සංවිධානය කල පුස්තකාල හා තොරතුරු තාක්ෂණ විද්‍යාව නැමැති වැඩමුළුවට සහභාගී විය.

22. එස්. එම්. සමරසේකර, ඊ. එම්. එස්. රසන්තා හා ජී. ක්‍රිෂ්ණරත්න, NILIS ආයතනය විසින් සංවිධානය කල පර්යේෂණ සමුළුවට සහභාගී වූහ.

23. ඉන්දිරා ගාල්ලගේ හා ඩබ්. එම්. වී. පී. වීරසිංහ, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය විසින් සංවිධානය කල 'Access to information multimedia materials' වැඩමුළුවට සහභාගී වූහ.

# නව ප්‍රවේශයන්

## භාෂ්මිකව ක්‍රියාකාරීත්වය ප්‍රගුණ කල අළු අංශු භූමික බහුඅවයිකරණය (Geopolymerization) වීම විමර්ශනය

ඇලුමිනියම් සිලිකේට් ලෝහ හයිඩ්‍රොක්සයිඩ සමඟ එක් වීමෙන් සෑදෙන බදාම නිෂ්පාදන ක්‍රියාවලිය භූමික බහුඅවයික ලෙස හඳුන්වා දිය හැක. Geopolymer නිෂ්පාදනය සඳහා ඇලුමිනෝ සිලිකේට් කුඩු ප්‍රභවයක් ලෙස කාර්මික අපද්‍රව්‍ය පිලිස්සීමෙන් සෑදෙන අළු, දහයියා අළු, සිලිකා දුමාර හෝ කෙයොලයිට් හා මැටි වර්ග භාවිතයට ගනී. ගල් අඟුරු භාවිතයට ගනිමින් ක්‍රියාත්මක විදුලිබල උත්පාදක තාප බලාගාර මහා පරිමාණයෙන් ජියෝපොලිමර් ඒකරාශී වන ASTM, F කාණ්ඩයේ දැවුණු අළු අපද්‍රව්‍යයක් ලෙස බහුලව හමු වේ.

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ, මෙම දැවුණු අළු තුල පවත්නා රසායනික සංයුතිය කෙතෙක් සාර්ථක ලෙස ජියෝපොලිමර් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා තාප සංවේදී හා ද්‍රාව්‍ය සිලිකේට් සමඟ ප්‍රතික්‍රියා කිරීමේදී එහි ඇති භාෂ්මිකතා විවිධ පරාමිතීන් කෙරෙහි බලපාන්නේ ද යන්න පරීක්ෂා කිරීමයි. පර්යේෂකයා මොරටුව විශ්ව විද්‍යාලයේ M.Phil උපාධිය සඳහා ලියාපදිංචි වී සිටී.

## ස්වයං පවිත්‍රක කොන්ක්‍රීට් පෘෂ්ඨ නිෂ්පාදනය

කොන්ක්‍රීට් පෘෂ්ඨ නිරාවරණය වෙමින් විවිධාකාර ගොඩනැගිලි හා සිවිල් ඉංජිනේරු කාර්ය සාධනය සඳහා යොදා ගැනේ. දිගු කාලීනව මෙම පෘෂ්ඨ නිරාවරණය වෙමින් අඩංගු රසායන ද්‍රව්‍ය බාදනය වෙමින් දුර්වර්ණව පැවතීම සුලභව දැකිය හැක. මෙම දුර්වර්ණ වීම නැවත ප්‍රතිසංස්කරණය කිරීම සඳහා නිරංතර පවිත්‍ර කිරීම සහ ආලේපන ගැල්වීම සිදුකල යුතු අතර ඒ සඳහා වැය කෙරෙන පිරිවැය අධික ය. එසේම මෙම ව්‍යුහමය ගොඩනැගිලි පවිත්‍ර කිරීම ඉතා දුෂ්කර කාර්යයක්ව පවතී. එබැවින් මෙම කොන්ක්‍රීට් පෘෂ්ඨයන් ස්වයං පවිත්‍රකව නිෂ්පාදනය කිරීම මගින් බැක්ටීරියා බාදනය වලක්වා ගැනීමට හැකියාව ඇත.

බැක්ටීරියා ආසාදන, කාබනික හා අකාබනික රසායනික ප්‍රතික්‍රියක බාදන වලක්වාලීම සඳහා ෆොටොකැටලිටික හා උසස් ජලභීතිකා සංයෝග යොදා මෙම තත්වය පවත්වා ගැනීම සඳහා අධ්‍යයනයන් සිදු කරන ලදි. ටයිටේනියම් ඩයොක්සයිඩ, රූටයිල් මගින් කාබනික තැන්පතු ඔක්සිකරණයට ඇති ෆෙටොකැටලිටික හැකියාව විවිධ පාරිසරික තත්වයන් යටතේ අධ්‍යයනයට ලක් කෙරිණ. ටයිටේනියම් ඩයොක්සයිඩ් සමඟ විවිධ ආකලන ද්‍රව්‍ය යොදා අධි ජල ප්‍රතිරෝධක ලක්ෂණ කොන්ක්‍රීට් පෘෂ්ඨ මත ඇති කිරීමේ ප්‍රවණතා ද පරීක්ෂාවට ලක් කරන ලදි. පර්යේෂකයා මොරටුව විශ්ව විද්‍යාලයේ M.Phil උපාධි අපේක්ෂකයෙකු ලෙස ලියාපදිංචි වී සිටී.

# නව ප්‍රවේශයන්

## දකුණු ආසියාතික පලතුරු කල් තබාගැනීම් ප්‍රවර්ධනය

## ගුලේප් විශ්ව විද්‍යාලය, කැනඩාව සහ තමිල්නාඩු කෘෂිකාර්මික විශ්ව විද්‍යාලය සමඟ කෙරෙන සහයෝගීතා පර්යේෂණ ව්‍යාපෘතිය

කාර්මික තාක්ෂණ ආයතනයේ ආහාර තාක්ෂණ අංශය, ද්‍රව්‍ය තාක්ෂණ අංශය හා තොරතුරු සේවා මධ්‍යස්ථානය සහසම්බන්ධ කැනේඩියානු අන්තර්ජාතික ආහාර සුරක්ෂිතතා අරමුදල IDRC/CIFSRF මුල්‍යා ආධාර සපයන විවිධ අංශ එක්ව සිදුකරනු ලබන මෙම වැඩසටහන 2012 මාර්තු මාසයේදී ආරම්භ කරන ලදි. අඹ භෝගයේ පසු අස්වනු හානිය ඉතා උග්‍ර තත්වයක පවතින බව වැවිලිකරුවන් මෙන්ම වෙළදාමේ යෙදෙන්නන් හොඳින් දන්නා කරුණකි. පසු අස්වනු හානි අවම කොට නැවුම් ස්වභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා භාවිත EFF ක්‍රමවේදය යොදා කෘෂි අපද්‍රව්‍ය ඇසුරුම් ද්‍රව්‍ය ලෙස භාවිතා කොට අඹ බෝගය කල් තබාගැනීමේ ක්‍රම මෙම ව්‍යාපෘතිය තුලින් අධ්‍යයනය කෙරේ. තෙවදැරුම් ක්‍රමවේද එනම් EFF ක්‍රමවේදය සමඟ නිනිති (නැනෝ) ෆයිබර් යෙදූ ඇසුරුම් තුල බෙදාහැරීම සඳහා කෙසෙල් අපද්‍රව්‍ය යොදමින් EFF සමඟ ජෛව ඉටි ගැල්වීම ද අධ්‍යයනයට ඇතුලත් ය. ප්‍රථම අදියර තුල අඹ බෝග වගාවේ දැනට පවත්නා සමාජ ආර්ථික තත්වය ඇගයීමට ලක් කොට පාදක දත්ත පිළිබඳව විමර්ශනයට ලක් කෙරෙනු ඇත. කාර්මික තාක්ෂණ ආයතනයේ නිෂ්පාදිත ආහාරමය ඉටි වර්ග ආලේපන ක්‍රමවේදය පර්යේෂණ කණ්ඩායම් මගින් අඹ බෝගයේ ආරක්ෂණය සඳහා යොදා ගැනීමේ ඵලදායීතාව පර්යේෂණයට ලක් කරන ලදි. ආහාර තාක්ෂණ හා ද්‍රව්‍ය තාක්ෂණ නිලධාරීන් තිදෙනෙක් මෙම ව්‍යාපෘතිය මගින් පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු වල ද යෙදේ.

## ශ්‍රී ලාංකීය ස්වභාවික මිනිරන් අගය වැඩි කිරීම සඳහා පවිත්‍ර කිරීම

ස්වභාවික මිනිරන් අපනයනය කෙරෙනුයේ ඉතා අවම මිලකට වන අතර අගය වැඩි කොට පවිත්‍ර කරන ලද මිනිරන් ඉතා අධික මිලකට උපරිම ඉල්ලීමක් ද ඇතිව වෙළඳාම සිදු කෙරේ. ස්වභාවික මිනිරන් 98.9% ක පවිත්‍රතාවය සහිතව අඩු පිරිවැයක් සහිතව නිෂ්පාදනය ක්‍රමවේදයක් සොයා ගැනීම සඳහා අධ්‍යයන සිදු කෙරේ. ව්‍යාපෘතිය වාණිජ ලෙස ක්‍රියාත්මක කිරීම නුදුරු අනාගතයේදී ව්‍යවසායකයෙකු විසින් සිදු කරනු ඇත.

## හෙලිකොබැක්ටර් පයිලොරි ආසාදනයට ප්‍රතිකර්මයක් ලෙස ප්‍රෝබයොටික ආහාර සංකලන නිෂ්පාදනය

හෙලිකොබැක්ටර් පයිලොරි ආසාදනය හේතුවෙන් හටගන්නා ආමාශගත පිළිකා සඳහා අනියම් ප්‍රතිකාරකයක් ලෙස ප්‍රතිජීවක වෙනුවට භාවිතා කල හැකි ප්‍රෝබයොටික ක්‍රියාකාරී ආහාර සංකලන ප්‍රවර්ධන අධ්‍යයන කටයුතු සිදුකෙරෙමින් පවතී. මෙම අනියම් ප්‍රතිකාර ක්‍රමය මගින් එම ආසාදනයට ලක්ව සිටින ජනතාවගෙන් වැඩි ප්‍රතිශතයක් මුදවා ගැනීමේ හැකියාව ලැබෙනු ඇත.

# නව ප්‍රවේශයන්

පූර්ණ සවිස්තරාත්මක තොරතුරු එක්රැස් කර ගැනීම සඳහා ප්‍රකාශිත ග්‍රන්ථ හා ලියවිලි පරිශීලනයට ලක් කරමින් ජෛව විද්‍යාත්මක සංස්කෘතික ගති ලක්ෂණ පිළිබඳව අධ්‍යයනය සිදු කරමින් හෙලිකොබැක්ටර් පයිලොරි බැක්ටීරියාව මාධ්‍ය තුල වර්ධනය නඩත්තු කටයුතු නව ආරක්ෂණ ප්‍රගුණ කර ඇත. ඒ අතර මෙම බැක්ටීරියාවට එරෙහිව ලැක්ටික් අම්ල බැක්ටීරියා ප්‍රභේද හා ඒවායේ බහිශ්‍රාවීය ද්‍රව්‍ය, මනුෂ්‍ය සිරුර තුල එය ක්‍රියාත්මක වන ආකාරය, වෙනත් සතුන් කෙරෙහි බලපාන අන්දම (මීයන් හා හාවුන්) පැසවීම් කාලය තුල පවත්වා ගත යුතු උෂ්ණත්ව, pH අගය, ඔක්සිජන සාන්ද්‍රනය, මිශ්‍ර කල යුතු ආකාරය හා වායු ප්‍රමාණයන්, සෛල ප්‍රමාණය ආදී සාධක අධ්‍යයනය කරන ලදි.

# සංයුක්ත දැනුවත් කිරීම්

## ප්‍රදර්ශන

ආයතනය මගින් ප්‍රවර්ධනය කරන ලද වාණිජ නිෂ්පාදන හා නව නිෂ්පාදන ප්‍රදර්ශනය කරමින් මහජනතාව දැනුවත් කිරීම උදෙසා කාර්මික තාක්ෂණ ආයතනය පහත සඳහන් ප්‍රදර්ශන සඳහා සහභාගී විය.
මෙම ප්‍රදර්ශන මගින් කාර්මික තාක්ෂණ ආයතනය වෙත වඩ වඩාත් ව්‍යවසායකින් ලඟා කරගැනීමටත් වැඩි සේවයක් සැපයීමටත් අවස්ථාව උදා වුණි.

- දැයට කිරුළ 2012 (2012 පෙබරවාරි 4 – 10 දක්වා, අනුරාධපුරයේදී)
- ප්‍රෝ ෆුඩ් ප්‍රෝ පැක් 2012 (2012 ජූලි 5 – 8 දක්වා, බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රන ශාලාව, කොළඹ)
- සහසක් නිමැවුම් ප්‍රදර්ශනය (2012 සැප්තැම්බර් 30 - ඔක්තෝම්බර් 2 දක්වා, බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රන ශාලාව, කොළඹ)
- පර්යේෂණ හා තාක්ෂණය තුලින් ප්‍රතිසංවර්ධනය (2012 දෙසැම්බර් 10 – 11, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය)

## විද්‍යා හා තාක්ෂණ ප්‍රකාශන හා ලිපි

- සියඹලා ඇට ආහාර කාර්මාන්තය සඳහා ශ්‍රී ලංකාව තුල භාවිතය, තරුණ විද්‍යාඥයින්ගේ සමුළු පුවත් ප්‍රකාශනය.
- දන්ත සෞඛ්‍ය සඳහා පුරාණ ස්වභාවික ඖෂධ, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසන් සභා ප්‍රකාශනය

## කාර්මික තාක්ෂණ ආයතනයීය ක්‍රියාකාරකම් හා මෙහෙයුම් සඳහා මාධ්‍ය ප්‍රචාරණ

කාර්මික තාක්ෂණ ආයතනයෙන් සිදු කෙරෙන කාර්යභාරය පිළිබඳව විග්‍රහ කෙරෙන පුවත් හා ලිපි ඉංග්‍රීසි හා සිංහල පුවත් පත් මගින් හතලිස් පස් වතාවක් ප්‍රකාශයට පත් කරන ලදි.

- DNA පෙල සටහන් මගින් ලංකා කුරුඳු හඳුනා ගැනීම (සන්ඩේ ටයිම්ස් - 2012.01.22)
- කොතලහිඹුටු, මංචි මගින් ආරක්ෂා කොට වගා කරයි (ඩේලි නිවුස් - 2012.01.29)
- මං මාවත් තුල විදුලි බල ශක්තිය අපතේ යාම අවම කිරීම (ඩේලි මිරර් - 2012.07.10)
- වීදි ලාම්පු කළමණාකරණ පද්ධති ප්‍රවර්ධනය (ඩේලි නිවුස් - 2012.07.14)
- වීදි ලාම්පු කාර්මික තාක්ෂණ ආයතනය මගින් ස්වයංක්‍රීයව මෙහෙයවයි (සන්ඩේ ඔබ්සර්වර් - 2012.07.15)
- විදුලිය පිරිමැසීමට අපගේ විද්‍යාඥයන්ගෙන් ඵලදායී පර්යේෂණයක් (විදුසර - 2012.08.01)
- පැරණි ඖෂධ පැලෑටි හඳුනා ගැනීමට DNA පෙල (ඩේලි නිවුස් - 2012.08.02)
- දිවි නැගුම යටතේ පුහුණු ව්‍යවසායකයින් හට උපකරණ කට්ටල (දිනමිණ - 2012.10.26)
- දිවි නැගුම ඉදිරියට ගෙන යාමේදී කාර්මික තාක්ෂණ ආයතනය වැදගත් වෙනවා (දිනමිණ - 2012.10.31)

# සංයුක්ත දැනුවත් කිරීම්

- කසල අප ද්‍රව්‍ය භාවිතය පිළිබඳ දැනුම ප්‍රවර්ධනය සඳහා දෙදින වැඩමුළුවක් (සන්ඩේ ටයිම්ස් - 2012.01.04)
- ශාක පටක රෝපණය හා සෛල බද්ධය පිළිබඳ පස් දින පුහුණු වැඩමුළුව (සන්ඩේ ඔබ්සර්වර් - 2012.11.04)
- රතු වැස්සේ ක්ෂුද්‍රජීවීහු (දිවයින - 2012.11.17)
- රතු වැසි රහස පිළිබඳ පර්යේෂණ (අයිලන්ඩ් - 2012.11.17)
- ජෛව පරීක්ෂා පිළිබඳ වැඩමුළුවක්
- තමන්ට ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ පුහුණුවක් කාර්මික තාක්ෂණ ආයතනයෙන් (සන්ඩේ ඔබ්සර්වර් - 2012.11.18)
- පර්යේෂණ හා සංවර්ධනය තුලින් ප්‍රතිසංවර්ධනය ආරම්භය ලබන සතියේ (ඩේලි මිරර් - 2012.11.30)
- පර්යේෂණ හා සංවර්ධනය තුලින් ප්‍රතිසංවර්ධනය (ඩේලි නිවුස් - 2012.12.07)
- ශ්‍රී ලංකාව, ආසියාවේ දැනුම් කේන්ද්‍රය ලෙස ඉක්මනින්ම (සන්ඩේ ඔබ්සර්වර් - 2012.12.30)

## විද්‍යුත් මාධ්‍ය

විදුලි බුබුලක් නිවා දැමීම සුළු කාර්යයකි. ලංකාවේ සියළු වීදි ලාම්පු එකවර නිවා දැමීම එයටත් වඩා සුළු කාර්යයක් වනු ඇත. ගුවන් විදුලි තරංගයක් ඔස්සේ ශබ්ද තරංගයක් නිකුතුව මගින් රට පුරා සියලු වීදි ලාම්පු එකවර නිවා දැමීමට හැකි වන සේ ප්‍රවර්ධනය කල තාක්ෂණ ක්‍රමයක් ආයතනයීය විද්‍යුත් තාක්ෂණ රසායනාගාරය මගින් ප්‍රවර්ධනය කර ඇත. ලෝකයේ මෙවන් තාක්ෂණයක් නිර්මාණය කල ප්‍රථම අවස්ථාව මෙය නිසා ඒ සඳහා පේටන්ට් බලපත්‍රයක් ලබා ගැනීමට ජාතික අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇත. තාක්ෂණ ක්‍රම වේදය එළිදැක්වීමේ මාධ්‍ය සමුළුවක් හා ඒ පිළිබඳ ලිපි නිකුත් කිරීම සඳහා 'ඩේලි මිරර්' 'සන්ඩේ ඔබ්සර්වර්' 'සන්ඩේ අයිලන්ඩ්' 'කලම්බු ටුඩේ' සහ විද්‍යුත් මාධ්‍ය සමඟ සමුළුවක් පවත්වන ලදි.

# කර්මාන්ත සඳහා තොරතුරු සේවා

## කර්මාන්ත හා පර්යේෂණ සඳහා සහායවීම්

රටෙහි සියලු ව්‍යවසායකයින්, පර්යේෂණ කටයුතු වල නිරත පිරිස්, අධ්‍යාපනික ආයතන, කර්මාන්ත, ව්‍යාපාර හා පොදු මහජනතාව වෙත තොරතුරු සේවා මධ්‍යස්ථානයේ සේවා නිරංරව සපයන ලදි. පර්යේෂණ හා සංවර්ධන මෙන්ම තාක්ෂණ සේවා සඳහා කාර්මික තාක්ෂණ ආයතනය අවශ්‍ය තොරතුරු ලබාදෙන ලදි. මීට අමතරව වෘත්තීය ආයතන හා කර්මාන්ත සඳහා මධ්‍යස්ථානය විසින් පර්යේෂණ තොරතුරු හා සේවා පුහුණු වැඩසටහන් ද දියත් කරන ලදි.

## අප සතු එකතුව

නිරංතරව සිදු කෙරෙන විද්‍යා හා තාක්ෂණ තොරතුරු එකතුවන්ට අමතරව ජෛව තාක්ෂණික මෙන්ම නිනිති තාක්ෂණ ක්ෂේත්‍රයන් පිළිබඳ තොරතුරු මධ්‍යස්ථානය වෙත ඒකරාශී කරමින් ග්‍රන්ථ එකතුව ප්‍රවර්ධනය කිරීම සිදු කරන ලදි. තව ද වෙනත් ආශ්‍රිත ක්ෂේත්‍ර ලෙස කර්මාන්ත හා තාක්ෂණ දැනුම වැඩි දියුණු කිරීම සඳහා වැදගත් වන සංඛ්‍යායන, භාවිත නිර්දේශ, නිෂ්පාදන හා වෙළඳ රටාවන් පිළිබඳ අදාල තොරතුරු ඒ අතර එක්කර ගනිමින් ප්‍රවර්ධනය කරන ලදි. කාර්මික තාක්ෂණ ආයතනයේ සියළු ප්‍රකාශන විද්‍යුත් අංකනය කිරීමේ අඩිතාලම දමමින් ජාතික විද්‍යුත් අංකනගත කිරීමේ වැඩසටහන යටතේ ජාතික විද්‍යා පදනම සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදි. මේ යටතේ වාර්ෂික වාර්තා, විද්‍යා ප්‍රකාශන හා පරීක්ෂණ වාර්තා එහි පළමු අදියර ලෙස අංකනය කොට Dspace මෘදුකාංගය භාවිතා කොට විද්‍යුත් ගබඩාගත කිරීම සිදු කරන ලදි. මෙම කටයුතු ඉදිරියේදී සෞඛ්‍ය තොරතුරු ජාලය (HELLIS) සමඟ තවදුරටත් බෙදාගනු ඇත.

## සේවාලාභීන්ගේ තොරතුරු

උපාධි අපේක්ෂක මෙන්ම පශ්චාත් උපාධි සිසුන් 520 දෙනෙකු ඇතුළු පුස්තකාල පරිශීලකයින් 936 ට වැඩි දෙනෙකු මධ්‍යස්ථානය භාවිතා කොට ඇත. මධ්‍යස්ථානයේ විශේෂිත සේවා ලබාගැනීම සඳහා නව සාමාජිකයින් 16 දෙනෙකු එක් වූ අතර ඉන් 2 දෙනෙකු සංයුක්ත, 7 ක් තැන්පත් හා 7 ක් තනි සාමාජිකයින් වූහ. වඩා අධික භාවිතයට යොදා ගත් ප්‍රකාශන අතර ප්‍රමිති හා ග්‍රන්ථ මූලික වන අතර ඉන් 634 ක් කාර්මික තාක්ෂණ ආයතනයීය කාර්ය මණ්ඩලය වෙත ද 321 ක් පොදු සාමාජිකයින් වෙත ද නිකුත් කර ඇත. අප සතු එක්තුවට කෙරෙන උපහාරයක් ලෙස අන්තර් පුස්තකාල මගින් ද පොත්පත් ගණුදෙනු කිරීමේ පහසුකම් සපයා දෙන ලදි. මධ්‍යස්ථානයේ උපයෝගීතාවය නිශ්චය කිරීම සඳහා පරිශීලක සමීක්ෂණ වෙන්ව හඳුන්වාදීම සඳහා ඉදිරිපත් කරන ලද වැඩසටහන් ද සම්පාදනය කරන ලදි.

## විශේෂිත විමසුම් සේවා

වසර තුලදී තාක්ෂණික විමසීම් 102 ක් ඉටුකරන ලදි. ඉන් කාර්මික තාක්ෂණ ආයතනයීය කාර්ය මණ්ඩලය කළ විමසුම් 28 ක් වන අතර 74 ක් ව්‍යාපාරික හා කර්මාන්ත ක්ෂේත්‍රය වෙනුවෙනි.

# කර්මාන්ත සඳහා තොරතුරු සේවා

වසර තුල විමසුම් කරන ලද විෂය ක්ෂේත්‍රයන් පහත දැක්වෙන අයුරු වෙන්කොට දැක්විය හැක. රසායන විද්‍යා හා විශ්ලේෂණ ක්‍රම - 10, භෞතික විද්‍යාත්මක - 2, ද්‍රව්‍ය හා බලශක්ති - 10, ප්‍රමිති හා පේටන්ට් - 7, ඖෂධ හා ඖෂධ පැලෑටි - 20, සංඛ්‍යාන - 6, ආහාර හා බීම වර්ග (විශ්ලේෂණ හා වට්ටෝරු) – 29, පාරිසරික - 2, වට්ටෝරු - 4, සෞඛ්‍ය හා පෝෂණ - 5, සුවඳ විලවුන් - 3, පොදු ව්‍යාපාරික - 2.

## අගය වැඩි කල සම්පාදිත තොරතුරු

අන්තර්ජාලය භාවිතාවෙන් හා අදාල ජාල පරිශීලනයෙන් පුස්තකාලයේ ඇති ග්‍රන්ථ හා ප්‍රකාශන සුවිශේෂීව භාවිතයට ගනිමින් අගය වැඩි කොට සම්පාදනය කරන ලද තොරතුරු පැකේජයක් ලෙස සැපයීමට කටයුතු පිළියෙල කර ඇත.  මේ අතරින් මූලික වූ විෂය ක්ෂේත්‍රයන් සමහරක් පහත දක්වා ඇත.

- පොල් තෙල් සම්බන්ධ තොරතුරු
- ශ්‍රී ලාංකික පලතුරු සහ එළවළු වල පොටෑසියම් ප්‍රමාණය
- ශ්‍රී ලංකාවේ ආහාර කර්මාන්තය
- ශ්‍රී ලාංකීය සම්ප්‍රදායික හාල් වර්ග
- පොල් කටු අඟුරු සහ නිෂ්පාදනය

## තොරතුරු වෙත ප්‍රවිශ්‍ය වීම්

පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු සපයා ගැනීම සඳහා ක්ෂණික පාදක දත්ත, සයන්ස් ඩිරෙක්ට්, EBSCO, HINARI වැනි ආගන්තුක පාදක දත්ත  ගබඩා වෙතින් බාගැනීම සීඝ්‍ර ලෙස වර්ධනය කෙරිණ.  අපනයන සංවර්ධන මණ්ඩලයේ කාර්මික තොරතුරු සේවාව හා ඇමෙරිකානු මධ්‍යස්ථානය වැනි දේශීය මෙන්ම විදේශීය පාදක දත්ත සම්පත් ග්‍රහණය කරගනිමින් සංඛ්‍යානය හා බද්ධ තොරතුරු මෙන්ම ඇමෙරිකානු පාදක දත්ත පරිශීලනයට ද අවස්ථාව උදාකර ගන්නා ලදි.

නොකඩවා හතරවන වසරටත් සයන්ස් ඩිරෙක්ට් සාමාජිකත්වය පවත්වාගෙන යන ලද අතර රසායන ද්‍රව්‍ය, කෘෂිකාර්මික, ජීව විද්‍යා, විෂ විද්‍යා ආදී ක්ෂේත්‍ර සඳහා දායකත්වය ඇතිව තොරතුරු බාගන්නා ලදි.  වසර තුලදී පර්යේෂණ හා සංවර්ධන පිළිබඳ පත්‍රිකා 450 කට වඩා වැඩි ගණනක් එකතුවට ග්‍රහනය කර ගන්නා ලදි.  මෙම විද්‍යුත් සන්නිවේදන පාදක දත්තයන් විශේෂයෙන් අධ්‍යාපනික මෙන්ම පර්යේෂක වෘතිකයන් අතර බෙහෙවින් ජනප්‍රියත්වයට පත් වෙමින් ඇත. වසර තුල ග්‍රන්ථ 114, ප්‍රති මුද්‍රිත ලේඛන 1000 කට වැඩි ප්‍රමාණයක් සහ සඟරා තුල පල වූ ලිපි 400 ක් ස්වයංක්‍රීය විද්‍යුත් පුස්තකාලීන (AOL) පද්ධතිය තුලට ඇතුලත් කිරීමට හැකි වූ අතර නාමාවලිය හා සාමාජික සේවා තොරතුරු වෙත වෙබ් අඩවි තුලින් පරිශීලනය කිරීමට ද අවස්ථාව සලසාදෙන ලදි.

# කර්මාන්ත සඳහා තොරතුරු සේවා

## මුද්‍රිත මාධ්‍ය උපයෝගී තොරතුරු සන්නිවේදන කටයුතු

කාර්තුවකට වරක් ප්‍රකාශනයට පත් කෙරෙන "ITI බුලටීන්" ප්‍රකාශනය මගින් ආයතනය විසින් සිදු කරන පර්යේෂණ කටයුතු පිළිබඳව නවතම තොරතුරු සන්නිවේදනය කෙරේ. මෙහි පලකල ලිපි ලේඛන, දේශීය ප්‍රවෘත්ති පත්‍ර බොහෝ අවස්ථාවන්හි දී උපුටාගන්නා ලද අතර කාර්මික තාක්ෂණ ආයතනයීය වෙබ් අඩවිය මගින් ද ප්‍රකාශයට පත් කෙරිණ.

විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ නවතම සොයා ගැනීම්, කාර්තුවකට වරක් ප්‍රකාශනයට පත් කෙරෙන "SciTech in Brief" හා කළමණාකරනය පිළිබඳ "Management Thought" ප්‍රකාශනය මගින් ද ආයතනයීය වෙබ් අඩවිය හරහා මෙන්ම ආයතනය තුල පමණක් භාවිතා කෙරෙන ITI – inet තුලින් ද සන්නිවේදනය කරන ලදි. දේශීය ප්‍රවෘති පත්‍ර තුල පල කරන ලද විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ තොරතුරු 'iNet daily'විද්‍යුත් තැපැල් මගින් 'මුද්‍රිත මාධ්‍ය තොරතුරු' ලෙස ප්‍රකාශයට පත් කල අතර මාධ්‍ය තුල පල වූ වැදගත් ලිපි අලලා සකස් කෙරෙන 'News Digest' සතිපතා ප්‍රකාශනයක් ද මුද්‍රනය කර ප්‍රචාරය කරන ලදි.

කාර්ය මණ්ඩලයේ දැනගැනීම සඳහා තත්කාලීන සිදුවීම් පිළිබඳ තොරතුරු අදාල ක්ෂේත්‍රයේ විශේෂඥතා සහිතව කටයුතු කරන පර්යේෂකයින් වෙත මධ්‍යස්ථානය විසින් සැපයීම දිගින් දිගටම සිදුකරගෙන යන ලදි. අවශ්‍ය තොරතුරු සන්නිවේදනය කර ඇති අතර මෙම ප්‍රවෘත්ති ලිපි බෙදාහැරීමේ සේවය මගින් ස්වයංක්‍රීය පර්ගණක (AOL) පද්ධති මෙවලම් මෙන්ම මුද්‍රිත මාධ්‍ය යොදා ගනිමින් පිටපත් කිරීමේ හිමිකම් ආරක්ෂා වන අයුරින් සන්නිවේදනය කෙරිණ.

## දැනුම බෙදා ගැනීමේ සම්මන්ත්‍රණ හා වැඩමුළු

ව්‍යවසායකයින් හා වෘත්තිකයින් අතර දැනුම බෙදාගැනීමේ අරමුණ ඇතිව තොරතුරු සේවා මධ්‍යස්ථානය වෙතින් වැඩසටහන් ගණනාවක් සංවිධානය කරන ලදි. වසර තුලදී සම්මන්ත්‍රන 3 ක්, "ව්‍යාපාරයක් ආරම්භ කරන්නේ කෙසේද", "සන්නිවේදන සේවා සාර්ථක ලෙස පවත්වා ගැනීමට අත්‍යවශ්‍ය කරුණු" සහ "දැනුම ආරක්ෂණය සඳහා ඔබ විසින් කල යුතු දේ". මෙම සම්මන්ත්‍රන මගින් 100 කට අධික සාමාජිකයින් පිරිසක් ප්‍රතිලාභ ලබාගන්නා ලදි. මධ්‍යස්ථානයෙන් සැපයෙන විවිධ සේවා පිළිබඳ දැනුවත් කරමින් පෙරහුරුවක් සොයන විද්‍යා සංගමයේ සිසුන් හා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ වෘත්තිකයින් වෙනුවෙන් පවත්වන ලදි.

## ධාරිතා වර්ධන කටයුතු

නිලධාරීන් දෙදෙනෙකු විද්‍යාපති උපාධි වැඩසටහන් නොකඩවා සිදු කරගෙන යන අතර තවත් එක් නිලධාරියෙකු පුස්තකාල හා සන්නිවේදන විද්‍යාව පිළිබඳව පශ්චාත් ඩිප්ලෝමා අධ්‍යයන කටයුතු සඳහා සම්බන්ධ විය.

# කර්මාන්ත සඳහා තොරතුරු සේවා

ඉංදියානු රජය හා SAARC සංවිධානය කල තොරතුරු තාක්ෂණය තුලින් තොරතුරු කළමණාකරණය පුහුණු වැඩසටහන සඳහා තුන් මස් පුහුණු පාඨමාලාවක් වෙත එක් නිලධාරියෙකු සහභාගී විය. තොරතුරු සැකසීම හා එම සේවාවන් තුල පවත්නා නව තාක්ෂණ හැකියා ප්‍රවර්ධනය සඳහා තොරතුරු සේවා මධ්‍යස්ථාන කාර්ය මණ්ඩල නිලධාරීන් ගණනාවක් සහභාගී වූහ.

## සම්පත් කළමණාකරණය

මධ්‍යස්ථානය සතු සම්පත් තත්කාලීනව හා නිරංතරව වැඩි දියුණු කරමින් පවත්වාගෙන යන ලදි. සතු ග්‍රන්ථ සංඛ්‍යාව 21,331 ක් වන අතර ඉන් 70 ක් මිලදී ගත් මෙන්ම 114 ක් තිළිණ වශයෙන් පසුගිය වසරේදී ලැබුණි. ප්‍රතිමුද්‍රිත ලේඛන සංඛ්‍යාව 12,300 කට වඩා වැඩි ගණනක් වූ අතර ප්‍රති මුද්‍රිත 450 ක් සහ 700 කට වැඩි ප්‍රමාණයක් සඟරා තුලින් උපුටාගත් ලිපි මගින් එක් කරගන්නා ලදි. සඟරා සඳහා සැපයූ සාමාජික ගාස්තු විදේශීය සඟරා 8 කට හා දේශීය 7 ක් ලෙස වසර තුලදී පවත්වාගෙන යන ලදි. ISO, SLSI සහ BS ආදී නව ප්‍රමිති වාර්තා 44 ක් ප්‍රධාන වශයෙන් කාර්මික තාක්ෂණ ආයතනයේ විශ්ලේෂක කාර්ය මණ්ඩලය වෙත සේවා සැපයීම සඳහා හිමිකර ගන්නා ලදි. කෙසේ වුවත් විද්‍යා හා තාක්ෂණ මෙන්ම පර්යේෂණ හා සංවර්ධන ආයතන වෙතින් මෙන්ම අන්තර්ජාලය වෙතින් ලබාගත් ලිපිලේඛන සංඛ්‍යා එකතුවක් භාවිතයට යොදාගනිමින් මධ්‍යස්ථානය තත්කාලීනව පවත්වාගෙන යාමට හැකියාව උදාකරගන්නා ලදි. ග්‍රන්ථ, සඟරා සහ විද්‍යුත් පාදක දත්ත පද්ධති සඳහා රුපියල් මිලියන 5.25 ක වියදමක් දැරීමට මධ්‍යස්ථානයට සිදු විය.

මේ වන විට ඒකරාශී කර ඇති විශාල ප්‍රමාණයක ලේඛන හා ග්‍රන්ථ අතර වෙනත් දේශීය හා විදේශීය විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ හා සංවර්ධන ආයතන සමඟ හුවමාරු කරගත් ලේඛන මෙන්ම ඉලෙක්ට්‍රොනික සම්පත් භාවිතාකොට එක්කර ගෙන ඇති ප්‍රමාණය අති විශාලය. බැඳි සඟරා ග්‍රන්ථ එකතුව 13,803 දක්වා වැඩි කර ගැනීමට හැකි වූ අතර වසර තුල ගණනින් 933 ක් ඊට එක් කරන ලදි.

## පාරම්පරික ඖෂධ පිළිබඳ විශේෂිත පාදක දත්ත

කාර්මික තාක්ෂණ ආයතනය සතු විද්‍යාත්මක ප්‍රබන්ධ, ප්‍රකාශන හා පර්යේෂණ වාර්තා ඡායා රූප, පෝස්ටර් හා වැඩමුළු පිළිබඳ විස්තර ඇතුලත් අත් පත්‍රිකා එකතුව වර්ධනය කරගැනීමට තොරතුරු සේවා මධ්‍යස්ථානයට හැකි විය. ශ්‍රී ලංකාවේ ඇති ශාක 200 ක තොරතුරු ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ඩ් විශව විද්‍යාලය මගින් ප්‍රවර්ධනය කරන ලද ප්‍රසිද්ධ ලියුසිඩ් මෘදුකාංගය භාවිතා කරමින් ඖෂධීය ශාක පිළිබඳ දත්ත ඇතුලත් කොට නිර්මාණය කර ඇති අතර එය තවදුරටත් පුළුල් කරමින් පවතී. ශ්‍රී ලාංකික ඖෂධීය පැලෑටි හඳුනාගැනීම සඳහා යොදාගත හැකි මූලික අංග ලක්ෂණ, ශාක තාක්ෂණ අංශයේ විද්‍යාඥයින් විසින් සොයාගත් දත්ත ඇතුලත් කොට සම්පාදිත වෙබ් අඩවියක් ප්‍රකාශනයට පත් කිරීමේ වැඩකටයුතු සම්පූර්ණ කරන ලදි.

# කර්මාන්ත සඳහා තොරතුරු සේවා

APTMNET නැමැති ආසියානු හා පැසිපික් කලාපීය පාරම්පරික ජාලය සඳහා මධ්‍යස්ථානය නොකඩවා සහභාගී විය. පැලැටි 500 ට අධික ප්‍රමාණයක් හා වෙනත් සම්පත් තොරතුරු 100 ක් ගබඩාකර ග්‍රහණය කරගැනීමට හැකි වූ අතර වාණිජ, ව්‍යාපාරික තොරතුරු විශේෂඥ මෙන්ම අධ්‍යාපනික හා පර්යේෂණ කටයුතු අනුබද්ධ තොරතුරු ද ඊට ඇතුලත් විය.

## තොරතුරු මධ්‍යස්ථානය සඳහා ප්‍රමිති පද්ධතියක්

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, 2011/2012 වසරට අනුකූලව පවත්වන ලද සුපරීක්ෂණ විගණනයේදී මධ්‍යස්ථානය සාමාර්ථය ලබාගත් අතර ISO 9001 : 2008 සහතිකලාභී තත්වය තවදුරටත් ආරක්ෂා කරගනු ලැබුවේ කිසිදු අනනුකූලතා ප්‍රමාණයක් රහිතව ය.

## ජාලගත වීම හා සංයුක්තව කටයුතු කිරීම

වෙනත් තොරතුරු ජාල සමඟ සහසම්බන්ධ වෙමින් AGRINET, HELLIS හා SLSTINET වැනි කෘෂිකාර්මික, සෞඛ්‍ය විද්‍යා හා තාක්ෂණ තොරතුරු අඩංගු ජාල සමඟ මධ්‍යස්ථානය නිරංතරව සම්බන්ධතා පවත්වමින් කටයුතු කල අතර ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ සභාව (CARP), කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය, ජාතික විද්‍යා පදනම (NSF) මේ අතර විය.

සේවාවන් පුළුල් කරමින් පවත්වා ගෙන යනු ලැබූ පුහුණු වැඩසටහන්, ප්‍රකාශන හා තොරතුරු හුවමාරු කටයුතු, සංයුක්ත සම්බන්ධතා ආදිය මෙම ජාල හා අනුබද්ධව පවත්වාගෙන යන ලදි.

සෞඛ්‍ය විද්‍යාත්මක තොරතුරු සහිත HELLIS ජාලය වෙතින් HINARI පාදක දත්ත වෙත ගාස්තු නොගෙවා ප්‍රවිශ්ඨ වීමේ අවස්ථාව මෙන්ම AGRINET ජාලය කෘෂිකාර්මික තොරතුරු සහිත AGORA පාදක දත්ත වෙත පිවිසුමට අවස්ථාව සපයන අතර මෙම ජාල ද්විත්වයට WHO හා FAO සංවිධාන වෙත දායකත්වය ලබාගනිමින් නොමිලයේ ක්‍රියාත්මක තොරතුරු ජාලයන් ය.

# තිළිණ, ප්‍රදාන හා සම්මානලාභී පිළිගැනීම්

## සහසක් නිමැවුම් තිළිණ

2012 සැප්තැම්බර් 30 - ඔක්තෝම්බර් 2 දින දක්වා බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රන ශාලාවෙහිදී පවත්වන ලද ශ්‍රී ලංකා නව නිපැයුම් කොමිසම මගින් ප්‍රථම වතාවට පවත්වන ලද සහසක් නිමැවුම් ප්‍රදර්ශනයේදී විවෘත අංශයේ ප්‍රදර්ශක භාණ්ඩ සඳහා පිරිනැමෙන උසස්ම නිෂ්පාදනය සඳහා ඇගයීම් සහතිකය කාර්මික තාක්ෂණ ආයතනය ඉදිරිපත් කරන ලද අඩු වියදම් ශ්‍රවන ඉන්ද්‍රීය පෙරහන හා ස්වයංක්‍රීය වීදි ලාම්පු පද්ධතියට ද උප කාණ්ඩ වර්ගීකරණ කාණ්ඩ M - වෛද්‍ය - සැත්කම් - අස්ථි - පාද විකෘති - ආබාධිත අංග විකල ද්‍රව්‍ය හා කාණ්ඩ C - පරිගණක විද්‍යා, මෘදුකාංග, විද්‍යුත් ඉලෙක්ට්‍රොනික - සන්නිවේදන ක්‍රම කාණ්ඩ යටතේ තිළිණ හිමිකරගන්නා ලදි.

- කාර්මික තාක්ෂණ ආයතනයීය විද්‍යාඥයින් විසින් උසස්තම පෝස්ටර් 5 සඳහා පිරිනමන තිළින අතුරින් 2 ක්, රසායන විද්‍යා අන්තර්ජාතික සම්මන්ත්‍රනයේදී දිනාගන්නා ලදි.
    - o මනෝරත්න සී එම්, නයනජිත් එල් සී ඩී හා කෝට්ටේගොඩ අයි ආර් එම් සූර්ය කෝෂ හා ලිතියම් බැටරි සඳහා භාවිතා කෙරෙන මිනිරන් මිශ්‍රනයන් වර්ගීකරණය හා කෘතිමව නිෂ්පාදනය කිරීම.
    - o ඩබ් පී කේ එම් අබේසේකර, පී රණසිංහ, ජී ඒ එස් ප්‍රේමකුමාර, ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ තුලින් එක් කරගත් මුරුංගා පත්‍ර තේ (*Moringa oleifera*) තුල පවත්නා ප්‍රතිඔක්සිකරණ හැකියාව

| මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් මූල්‍ය ප්‍රවාහය | (රු. ශත) | (රු. ශත) |
| මෙහෙයුම් අතිරික්තය | 22,628,443 | 59,318,986 |
| ගැලපුම් | | |
| ක්ෂය | 54,491,545 | 116,671,055 |
| පාරිතෝෂික දීමනා සඳහා වෙන් කිරීම් | 60,360 | (2,278,888) |
| ලද පොලී | 9,734,097 | 6,441,548 |
| දේපල ඉවත් කිරීමෙන් ලද ලාභ / අලාභ | (17,111,788) | (6,434,272) |
| ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය | (60,727,176) | (125,785,827) |
| **මෙහෙයුම් අතිරික්තය / (ඌණතාවය)** | **9,075,481** | **47,932,602** |
| | | |
| කාරක ප්‍රාග්ධනයෙහි විචලයයන් | | |
| ආයෝජන (වැඩිවීම්) / අඩුවීම් | (2,199,513) | 1,310,454 |
| ණය ගැතියන්හි (වැඩිවීම්) / අඩුවීම් | (69,718,504) | 1,818,115 |
| පූර්ව ගෙවුම්හි (වැඩිවීම්) / අඩුවීම් | (1,911,717) | 1,218,999 |
| ගෙවිය යුතු ජංගම නොවන අගයන්හි (අඩුවීම) / වැඩිවීම | 8,119,983 | (798,421) |
| ගෙවිය යුතු ජංගම අගයන්හි (අඩුවීම) / වැඩිවීම | 22,722,008 | (27,429,309) |
| උපචිත වියදම්හි (අඩුවීම) / වැඩිවීම | 17,334,105 | (6,397,130) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් මූල්‍ය ඉපැයුම්** | **(16,578,157)** | **17,655,310** |
| ගෙවන ලද පාරිතෝෂික දීමනා | (9,307,649) | (7,053,900) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් මුදල් ප්‍රවාහය** | **(25,885,806)** | **10,601,410** |
| මූල්‍ය ක්‍රියාකාරකම් මගින් ශුද්ධ මුදල් ප්‍රවාහය | | |
| ලද ප්‍රාග්ධන ප්‍රදාන | 97,194,666 | 141,000,000 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුල ශුද්ධ මුදල් ප්‍රවාහය** | **97,194,666** | **141,000,000** |
| | | |
| ආයෝජන ක්‍රියාකාරකම් මගින් මුදල් ප්‍රවාහය | | |
| දේපල, යන්ත්‍ර සූත්‍ර අත්පත් කරගැනීම් | (69,335,867) | (59,263,176) |
| දේපල, යන්ත්‍ර සූත්‍ර අත්පත් කරගැනීම් - භා. ප්‍රතිපාදන ව්‍යාපෘති | (90,800) | (1,219,189) |
| නියමු යන්ත්‍රාගාර ආංශික කපා හැරීම් - පිරිවැය | 29,003,089 | 16,630,703 |
| නියමු යන්ත්‍රාගාර ආංශික ක්ෂය | (27,916,260) | (18,434,417) |
| තැන්පතු / ආයෝජන | (160,000,000) | (26,000) |
| වත්කම් විකිණීමෙන් ලැබීම් | 97,680 | 2,278,888 |
| විද්‍යා සම්මාන අරමුදල් ආයෝජන | (26,000) | |
| වෙනත් වත්කම් (නොනිමි වැඩ) | (40,402,434) | (29,052,415) |
| ස්ථාවර තැන්පත් වලින් ලද පොලී | 17,003,760 | 5,710,605 |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුල ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(251,666,832)** | **(83,375,001)** |
| | | |
| ශුද්ධ මුදල් ප්‍රවාහය | (180,357,972) | 68,226,409 |
| ආරම්භයේදී මුදල් ශේෂය | 251,773,734 | 183,547,325 |
| වර්ෂය අවසානයේදී මුදල් ශේෂය | **71,415,762** | **251,773,734** |

# ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වැදගත් සිදුවීම් - 2012

## 1. පොදු

2012 දෙසැම්බර් 31 වන දිනට ශේෂ පත්‍රය සහ ඊට අදාල මූල්‍ය ප්‍රකාශයන් අඛණ්ඩ පදනම මත, පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව, පරිවර්තිත ඓතිහාසික වටිනාකම මත පිළියෙල කර ඇත. (SLFRSs සහ LKAs)

සේවක විශ්‍රාමික පාරිතෝෂිත ප්‍රදානය අදාල ව්‍යවස්ථාපිත නියමයන්ට අනුකූලව සිදු කර ඇත. සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා ආයතන දායකත්වය පිළිවෙලින් 15% සහ 3% පරිදි වේ. පාරිතෝෂිකය සඳහා වෙන්කිරීම ආයතනය තුල වසර 5 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් සඳහා වන අතර, 1983 අංක 12 දරණ පාරිතෝෂික දීමනා පනතට අනුකූලව සිදුකර ඇත. මෙම ප්‍රතිපාදන අරමුදලක් ලෙස තැන්පත් වී නොමැත.

## 2. ගිණුම් පිළයෙලකර ගැනීමේදී පාදක කරගත් මූලධර්ම

මූල්‍ය ප්‍රකාශනයන් 2012 වසරේ දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ මූලධර්ම හා එකගවන පරිදි සකසන ලදි. තව ද ශ්‍රී ලංකා ගිණුම්කරණ වාර්තා කිරීමේදී පෙර වාර්තා තුල පැවති පරිවර්තක වෙනස්කම් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා මූලධර්ම SLRRSs අනුව සිදුකර ඇත.

නව SLRRSs නියමයන්ට අනුකූලව මූල්‍ය වාර්තා කාර්මික තාක්ෂණ ආයතනයට ද බලපවත්වන පරිදි නව මූල්‍ය ප්‍රතිපත්ති මත 2012 වසරේ සිට සකසා ඇත. පෙර වාර්තා කොට තිබූ මූල්‍ය තත්වයන් SLRRSs නියමයන්ට අනුකූලව පරිවර්තනය කිරීමේදී ආයතනයේ මූල්‍ය ප්‍රවණතා හා මුදල් ගැලීම් මූල්‍ය වාර්තාවේ සටහන් 4 යටතේ සඳහන් කොට ඇත.

## 3. රාජ්‍ය ප්‍රදානයන් සඳහා ගිණුම්කරණ පිළිවෙත

මහා භාණ්ඩාගාරය මගින් ලබා දුන් පුනරාවර්ථන ප්‍රදානය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි ආදායම් ලෙස සැලකිල්ලට ගෙන ඇත. රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 19 හි සඳහන් ආකෘතීන්ට අනුකූලව වර්ෂ 2003 සිට ප්‍රාග්ධන ප්‍රදානය අසම්භාව්‍ය අය ලෙස පෙන්වා ඇත. වසර සඳහා ක්ෂය මූල්‍යනය කිරීම පහත සඳහන් ද ක්‍රමක්ෂය කිරීමෙනි.

| අරමුදල | වර්ෂය සඳහා ක්ෂය |
|---|---|
| අසම්භාව්‍ය අය | 2003 වසරට පසු අත්පත් කරගත් ජංගම නොවන වත්කම් |
| රාජ්‍ය ප්‍රදාන - ප්‍රාග්ධන | 2003 වසරට පෙර අත්පත් කරගත් ජංගම නොවන වත්කම් |
| පරිත්‍යාග සහ ප්‍රදානයන් | පරිත්‍යාගයන්ට අදාල ජංගම නොවන වත්කම් |

## 4. වත්කම් - තක්සේරු කිරීමේ පදනම

### 4.1 ස්ථාවර වත්කම්

ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සඳහා ප්‍රතිපාදන දායකත්වය මහා භාණ්ඩාගාරයෙනි.

පිරිවැයෙන් ක්ෂය අඩු කිරීමෙන් පසු අගය ස්ථාවර වත්කම් ලෙස දක්වා ඇත. වත්කම් පහත දැක්වෙන ප්‍රතිශතයන්ට අනුව ක්ෂය කර ඇත.

| | |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| යන්ත්‍ර - සූත්‍ර | 10% |
| කාර්යාල උපකරණ සහ ලී බඩු | 5% |
| මෝටර් රථ වාහන | 20% |
| පරිගණක | 33.1/3% |
| පුස්තකාල පොත් සහ සඟරා | 5% |
| මෘදුකාංග සහ වෙනත් වත්කම් | 33.1/3% |

1999 ජනවාරි 01 දිනට පෙර මෝටර් රථ, පරිගණක සහ මෘදුකාංග සඳහා වූ ක්ෂය ප්‍රතිශතය 10% ක් වූ අතර, මෙදින සිට මෙය පිළිවෙලින් 20% සහ 33.33% ක් දක්වා සංශෝධනය කෙරුණි.

ආයතනයෙහි පිළිගත් පිළිවෙත් අනුව මිලදී ගත් වර්ෂයේ සිට ඉවත් කෙරෙන දින දක්වා ක්ෂය ගණනය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති මත (SLFRSs හා LKAs) අංක 16 අනුව සිදු කර ඇත.

4.1.1 පරිත්‍යාග ලෙස ලද වත්කම් හෝ රාජ්‍ය ප්‍රදානයන්ගෙන් මිලදී ගත් වත්කම් ඉහත සඳහන් කර ඇති ක්ෂය ප්‍රතිශතයන්ට අනුව ක්‍රමක්ෂය කෙරේ.

### 4.2 ණය ගැතියෝ

නිෂ්කාශනය වෙතැයි ආගනිත අගයන්ට ණය ගැතියෝ සහ වෙනත් අයවිය යුතු දෑ දක්වා ඇත. ණය ගැතියන්ගේ අගය තුල විවිධ වෙළඳ ණය ගැතියෝ සහ බැඳුම්කර සහ ගිවිසුම් කඩ කල සේවයෙන් ඉවත් වූ සේවකයින්ගෙන් අයවිය යුතු ණය ද ඇතුලත් වේ.

### 4.3 තොග

තොග පොත් අගයට දැක් වේ. තොග නිකුත් කිරීම සරල සාමාන්‍ය පදනම මත ගණනය කර ඇත.

### 4.4 ඉතිරි කිරීමේ බැංකු තැන්පත් ගිණුම

මෙම ගිණුමෙහි දැක්වෙනුයේ ලංකා බැංකුවෙහි ආයෝජනය කරන ලද ආරක්ෂණ ඇප තැන්පතු වේ.

### 4.5 පාරිභෝගික ගෙවුම් සඳහා තැන්පත් ගිණුම

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ නියමයන්ට අනුකූලව ලංකා බැංකුවේ මුදල් බැඳුම්කර තුල ඇති අතර මුදල් ලබා ගැනීමේ අණකර (ආනයන) හා පුද්ගල වේතන පිරිවැය ඇතුළු මාස 6 ක ප්‍රාග්ධනය ද ඇතුලත් ය.

### 4.6 රාජ්‍ය ඉඩකඩම්

ආයතනය සතු ඉඩකඩම් රාජ්‍ය ඉඩම් ලෙස සලකන අතර එහි අයිතිය රජය සතු ය.

## 5. බැරකම් සහ වෙන් කිරීම්

ජංගම බැරකම් ලෙස සඳහන් වටිනාකම ඉල්ලුම් කල විට ගෙවිය යුතු හෝ ශේෂ පත්‍ර දින සිට වසරක කාලයක් තුලදී කල යුතු ගෙවීම් වේ.

5.1 කාර්මික තාක්ෂණ ආයතනයීය සභාපතිතුමන්ගේ විද්‍යා සම්මාන අරමුදල සඳහා අරමුදල්

මෙම අරමුදල බාහිර වශයෙන් ආයෝජනය කර ඇත.

## 6. ආදායම් සහ වියදම් ගිණුම

ආදායම් සහ වියදම් උපචිත ගිණුම්කරණය මත පදනම් වේ. වසර සඳහා ආදායම රු. මිලියන 188 වන අතර පෙර වසර හා සන්සන්දනාත්මකව එය මිලියන 31 කින් වැඩි වී ඇත. එසේ වුවද ක්‍රමක්ෂය සමග ආදායම රු. මිලියන 28 කින් පහත වැටී ඇත. එසේ සිදු වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ක්ෂය ප්‍රමාණ ගණනය කිරීමේදී ක්ෂය වීම් මිලට ගත් දින සිට භාණ්ඩ ඉවත් කරන දින දක්වා වෙනස් ආකාරයට ගණනය කිරීමයි.

**7. අඩමාණ ණය සඳහා වෙන් කිරීම**

වසරකට වැඩි කාලයක් තුල නොගෙවන ලද ණය මත සාමාන්‍යයෙන් 2.5%ක ප්‍රතිශතයක් ලෙස අඩමාණ ණය සඳහා වෙන් කිරීම ගණනය කර ඇත. එහෙත් ඉහළ ප්‍රතිශතයක් මත වෙන් කිරීම් කල යුතු යැයි හැඟී ගිය නිශ්චිත ණය සඳහා අමතර වෙන් කිරීමක් සිදුකර ඇත.

**8. පාරිතෝෂික සඳහා වෙන්කිරීම්**

පාරිතෝෂික සඳහා වෙන්කිරීම් නව මූල්‍ය ප්‍රතිපත්ති (LKAS-19) අනුව බැඳුනු දින සිට බලපාන අයුරු සැලකිල්ලට ගෙන ඇත.

**9. දිගුකාලීන පර්යේෂණ සහ සංවර්ධන කටයුතු**

පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා වෙන් කරන ලද භාණ්ඩාගාර ප්‍රතිපාදන මුදා නොහැරීම හේතුවෙන්, වසර තුලදී පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති කපා හැරීමට සිදු විය. එයට අමතරව යම් පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති සඳහා දේශීය නියෝජිත ආයතනයන් වන ජාතික විද්‍යා පදනම (NSF) සහ ජාතික පර්යේෂණ කවුන්සිලය ද (NRC) දායකත්වය ලබා දී ඇත.

**10. අනුමත නොකල වැට් බදු**

මහා භාණ්ඩාගාරය විසින් ආයතනයට මූල්‍ය දායකත්වය ලබාදීමේ කරුණ මත, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් විකල්පයන් දෙකක් ලබා දී ඇත. එනම් භාණ්ඩාගාර දායකත්වය සඳහා එකතු කල අගය මත බදු ගෙවීමට හෝ අනුමත නොකල යෙදවුම් බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමයි. කාර්මික තාක්ෂණ ආයතනය විසින් 2005 වසරේ සිට අනුමත නොකල යෙදවුම් බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන ලදි.

**11. විදාතා වැඩසටහන**

සමාලෝචිත වර්ෂය තුලදී විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය විසින් පවත්වන ලද විදාතා වැඩසටහන් සඳහා සහභාගී වූ කාර්මික තාක්ෂණ ආයතන සේවකයින් සඳහා දරණ ලද මුළු පිරිවැය රේඛීය අමාත්‍යාංශය විසින් ප්‍රතිපූර්ණය කරන ලදි.

## 2012 දෙසැම්බර් 31 වන දිනට ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර සහ රසායනාගාර උපකරණ, ලී බඩු වැද්දුම් මෝටර් රථවාහන, පර්ගණක උපකරණ, පුස්තකාල පොත් සහ සඟරා, මෘදුකාංග සහ වෙනත් වත්කම් පිළිබඳ ලේඛනය

**ජංගම නොවන වත්කම්**

**සටහන - 01**

| විස්තරය | ගොඩනැගිලි 5% (රු.) | යන්ත්‍ර සූත්‍ර සහ රසායනාගාර උපකරණ 10% (රු.) | ලී බඩු වැද්දුම් සහ කාර්යාල උපකරණ 5% (රු.) | මෝටර් රථවාහන 20% (රු.) | පරිගණක උපකරණ 33.33% (රු.) | පුස්තකාල පොත් සහ සඟර් 5% (රු.) | මෘදුකාංග සහ අමතර කොටස් 33. 1/3% (රු.) | වෙනත් වත්කම් 33. 1/3% (රු.) | එකතුව (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| පිරිවැය | | | | | | | | | |
| 2012.01.01 දිනට ශේෂය | **221,303,275.79** | **597,020,852.97** | **41,197,587.15** | **51,489,816.08** | **43,458,023.78** | **77,040,407.75** | **12,686,568.94** | **4,512,594.44** | **1,048,709,126.90** |
| අගය වැඩි වීම - | | | | | | | | | |
| ගැණුම් | 7,261,350.83 | 52,198,280.78 | 1,702,144.04 | 97,690.00 | 6,762,032.45 | 502,890.75 | 811,478.64 | - | **69,335,867.49** |
| පරිත්‍යාග | - | 1,959,380.00 | 16,750.00 | 9,400,000.00 | | - | - | - | **11,376,130.00** |
| පරිත්‍යාග - ම.හා.ප්‍ර | - | 90,800.00 | - | - | - | - | - | - | **90,800.00** |
| ප්‍රත්‍යාගණනය | - | - | - | - | - | - | - | - | **-** |
| අඩු කලා | | | | | | | | | |
| කපා හැරීම් | - | (24,600,853.00) | (723,546.00) | (153,500.00) | (3,525,190.00) | - | - | - | **29,003,089.00** |
| 2012.12.31 දිනට ශේෂය | **228,564,626.62** | **626,668,460.75** | **42,192,935.19** | **60,834,006.08** | **46,694,866.23** | **77,543,298.50** | **13,498,047.58** | **4,512,594.44** | **1,100,508,835.39** |
| අඩු කලා | | | | | | | | | |
| ක්ෂය | | | | | | | | | |
| 2012.01.01 දිනට ශේෂය | **72,746,967.61** | **403,904,528.98** | **15,661,965.50** | **42,004,534.27** | **41,436,946.35** | **49,108,275.99** | **11,729,691.55** | **4,512,594.44** | **641,105,499.69** |
| 2012 සඳහා වැය | | | | | | | | | |
| එකතු කලා | | | | | | | | | |
| ක්ෂය | 10,685,611.68 | 32,576,677.40 | 1,638,646.73 | 4,447,034.69 | 1,969,470.20 | 2,637,287.87 | 536,826.27 | - | **54,491,554.84** |
| අඩු කලා | | | | | | | | | |
| ඉවත් කිරීම් | - | (23,626,529.30) | (611,040.85) | (153,500.00) | (3,525,190.00) | - | - | - | **(27,916,260.15)** |
| 2012.12.31 දිනට ශේෂය | **83,432,579.29** | **412,854,677.08** | **16,689,571.38** | **46,298,068.96** | **39,881,226.55** | **51,745,563.86** | **12,266,517.82** | **4,512,594.44** | **667,680,794.38** |
| 2012.12.31 දිනට ඉදිරියට ගෙන ආ ශේෂය | **145,132,047.33** | **213,813,788.67** | **25,503,363.81** | **14,535,937.12** | **2,021,077.43** | **25,797,734.64** | **1,231,529.76** | **-** | **432,828,041.01** |

## කාර්මික තාක්ෂණ ආයතනය (අනුප්‍රාප්තික ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය)
## 2012 දෙසැම්බර් 31 වන දිනට ශේෂ පත්‍රය සඳහා සටහන්

| වෙනත් වත්කම් (නොනිමි වැඩ) - (සටහන් 2) | 2,012<br>රු. ශත | 2011<br>රු. ශත |
|---|---|---|
| නොනිමි වැඩ - පොදු | | 220,665.95 |
| නොනිමි වැඩ - මාලඹේ නවීන තාක්ෂණ සහ පර්යේෂණ සංකීර්ණය | 139,635,416.50 | 104,208,869.31 |
| ම.හා. 08/24 කුරුඳු සාත්තුව සඳහා විකල්ප ජීවානුහරණ තාක්ෂණය පිළිබඳ අධ්‍යයනය | | 93,482.16 |
| ISO 17043 කාර්මික තාක්ෂණ ආයතනයීය PECMA PT වැඩසටහන ප්‍රතීතකරණය | 140,662.43 | 124,302.75 |
| ම.හා. 11/00/04 ස්වභාවික මිනිරන් යෙදූ මිනිරන් ව්‍යුත්පන්න නිෂ්පාදන | 392,739.65 | 33,617.43 |
| ම.හා. 11/00/06 සංයෝගාත්මක රසායනාගාරය | | 341,577.30 |
| ම.හා. 11/34 අධික යකඩ හා ප්‍රෝටීන සහිත සහල් නිෂ්පාදනය | 666,367.40 | 439,625.96 |
| ම.හා. 11/35 ප්‍රතිඔක්සිකාරක අධික සහල් නිවුඩු ස්නැක්ස් | 589,905.33 | 125,177.00 |
| ම.හා. 11/37 සෙම් රෝගය හා මේදය අඩු කෙරෙන පාරම්පරික සහල් හඳුනා ගැනීම | 4,686.38 | 4,686.38 |
| ම.හා. 11/39 ජෛව ක්‍රියාකාරී කිතුල් බීම | 36,939,14 | 17,207.00 |
| ම.හා. 11/41 ජාඩි වර්ගයන්ගේ ගුණාත්මක බව ඉහල නැංවීම | 611,052.48 | 26,636.39 |
| ම.හා. 11/42 ආනයනික සත්ව ආහාර පරීක්ෂණ පහසුකම් ඉහල නැංවීම | 429,990.46 | 98,705.14 |
| ම.හා. 11/46 ස්ට්‍රෝබෙරි හා පලතුරු හානිකර කෘමි සතුන් ජෛව විද්‍යාත්මක පාලනය | 123,902.72 | 9,081.00 |
| ම.හා. 11/47 ලංකා කුරුඳු ප්‍රභේදකරණය හා රසායනික ඇඟිලි සලකුණු සහ GI | 309,421.54 | 52,861.99 |
| ම.හා. 11/48 සෞඛ්‍ය වර්ධන ගුණාංග නිර්ණය කිරීම | 535,630.55 | 188,185.00 |
| ම.හා. 11/49 ට්‍රෙහෙලෝස් අධික සහල් යෙදූ පාන් නිෂ්පාදනය | 616,445.72 | 167,792.18 |
| ම.හා. 11/50 ඛනිජ තෙලින් දූෂණය වූ පස් ජෛවීය ලෙස පවිත්‍ර කිරීම | 173,550.14 | 11,182.08 |
| ම.හා. 11/51 කාර්මික එන්සයිම නිෂ්පාදනය | 278,156.40 | 107,376.73 |
| ම.හා. 11/52 සෝයා ෆෙරිටීන් යෙදීමෙන් සහල් තුල යකඩ ප්‍රමාණය වැඩි කිරීම | 385,547.72 | 797.82 |
| ම.හා. 11/55 සනීපාරක්ෂක තුවා නිෂ්පාදනය සඳහා කෙසෙල් කෙඳි භාවිතය | 530,791.53 | 97,318.63 |
| ම.හා. 11/56 ෆ්ලෝරයිඩ ඉවත් කිරීම සඳහා රතු මැටි යෙදූ ජල පෙරණ | 351,441.03 | 160,676.76 |
| ම.හා. 11/58 නායයෑම් පිළිබඳ අනතුරු ඇඟවීමේ සංඥා පද්ධති | 377,821,92 | 216,689.34 |
| ම.හා. 11/59 ස්වයංක්‍රීය වීදි ලාම්පු පාලක පද්ධති | 372,429.95 | 164,100.80 |
| ම.හා. 8/23A තුවාල ආවරණ සඳහා හයිඩ්‍රො ජෙල් නිෂ්පාදනය | | 7,770.00 |
| ම.හා. 47A ලංකා කුරුඳු ප්‍රභේදකරණ - DNA පෙල සැකසීම | 174,481.11 | 38,747.42 |
| ම.හා. 11/60 ලංකා කුරුඳු තුල ජෛව ක්‍රියාකාරීත්වය | 701,435.68 | 330,824.55 |
| ම.හා. 11/61 ස්වයංක්‍රීය අම්ල වැසි නිරීක්ෂණ මධ්‍යස්ථානය | 700,066.22 | 624,382.20 |
| ම.හා. DF 12/00/04 - 77 ක්‍රමාංකන පටි නිර්මාණ කටයුතු (කාර්මික මිණුම් රසායනාගාරය) | 2,675.00 | - |
| ම.හා. 11/00/07 අලි ඇතුන් සමග සන්නිවේදනය පවත්වා ගැනීම පිළිබඳ අධ්‍යයන කටයුතු | 23,830.00 | - |
| ම.හා. DF 12/00/01 කලින් සිදු කල පර්යේෂණ ව්‍යාපෘති පිළිබඳ පසු අස්වනු පර්යේෂණ | 70,275.18 | - |
| ම.හා. 11/53 සහල් බීජයේ SBg LR හිගය පෝෂණය මගින් ලයිසීන් අධි ප්‍රෝටීන ප්‍රමාණය දැක්වීම | 315,111.57 | - |
| | **148,550,773.75** | **108,148,339.27** |

## කාර්මික තාක්ෂණ ආයතනය (අනුප්‍රාප්තික ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය)
## 2012 දෙසැම්බර් 31 වන දිනට ශේෂ පත්‍රය සඳහා සටහන්

| රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදානය සඳහා ක්‍රමක්ෂය (5A1) | | රු. ශත | රු. ශත |
|---|---|---|---|
| (ගිණුම් අංක - 604440-70700) | | | |
| ක්ෂය | 2002 වර්ෂය වන තුරු ජංගම වත්කම් | 3,144,149.00 | |
| | 2003 වර්ෂයේ සිට ජංගම නොවන වත්කම් | 35,075,619.00 | |
| | පරිත්‍යාගික ජංගම නොවන වත්කම් | 16,321,787.00 | |
| | ක්‍රමක්ෂය ගැලපුම් | (15,226,646.00) | 39,314,909.00 |
| පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති - | භාණ්ඩාගාර ප්‍රදානිත | 1,035,443.00 | |
| සහ මානව සම්පත් සංවර්ධනය | පර්යේෂණ සහ සංවර්ධන -(Accreditation) | 4,822,820.00 | |
| | මානව සම්පත් සංවර්ධන පුහුණු | 556,505.00 | |
| | පුස්තකාල විද්‍යා නාමාවලිය - වාර්ෂික sub | 4,677,023.00 | 11,091,791.00 |
| පුනරුත්ථාපන සහ ප්‍රතිෂ්ඨාපන | - ගොඩනැගිලි සහ ආකෘති | 3,068,946.00 | |
| | යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 6,354,010.00 | |
| | රථ වාහන වැඩි දියුණු කිරීම | 269,750.00 | |
| | අනෙකුත් ප්‍රාග්ධන වත්කම් වැඩි දියුණු කිරීම | 600,770.00 | 10,293,476.00 |
| | | | **60,700,176.00** |

| අසම්භාව්‍ය අය (සටහන 5 ආ) | රු. ශත | රු. ශත |
|---|---|---|
| රාජ්‍ය දායකත්වය - ප්‍රාග්ධන -2003 වර්ෂයේ සිට | | |
| (ගිණුම් අංක 300102, 29755 සහ 300104) | | |
| 2011.01.01 දිනට ශේෂය | 434,259,056.00 | |
| වර්ෂය තුල එකතු කිරීම් | 97,194,666.00 | 531,453,722.00 |
| උප ලේඛන ගැලපුම් | | |
| ක්‍රමක්ෂය ( ජංගම නොවන වත්කම්හි ක්ෂය) | (35,075,619.00) | |
| ක්‍රමක්ෂය (පර්යේෂණ හා සංවර්ධන - Accreditation | (4,822,820.00) | |
| ක්‍රමක්ෂය (භාණ්ඩාගාරික ප්‍රදානිත ව්‍යාපෘති වැය) | (1,035,443.00) | |
| ක්‍රමක්ෂය ( පුනරුත්ථාපන වැය) | (10,320,476.00) | |
| ක්‍රමක්ෂය (මානව සම්පත් සංවර්ධන) | (556,505.00) | |
| ක්‍රමක්ෂය (පුස්තකාල විද්‍යා නාමාවලිය - Annual sub) | (4,677,023.00) | |
| ක්‍රමක්ෂය ගැලපුම් | | (56,487,886.00) |
| **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **474,965,836.00** |

| සමුච්චිත අරමුදල (සටහන - 6A) | **රු. ශත** | **රු. ශත** |
|---|---|---|
| රාජ්‍ය ප්‍රාග්ධන දායකත්වය - 2002 දක්වා සහ | | |
| ආදායම් සහ වියදම් ගිණුමෙහි ශේෂය | | |
| ගිණුම් අංක 300101-30000 සහ ගිණුම් අංක 300300-30400) | | |
| 2002 වර්ෂය දක්වා රාජ්‍ය දායකත්වය - 2012.01.01 | 356,412,974.00 | |
| ආදායම් සහ වියදම් ගිණුම - 2012.01.01 | (141,394,855.00) | 215,018,119.00 |
| උපලේඛන ගැලපුම් | | |
| ක්‍රමක්ෂය - ප්‍රාග්ධන | (3,144,149.00) | |
| 2012 කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය | 22,628,443.00 | 19,484,294.00 |
| **2012.12.31 වන දිනට ශේෂය** | | **234,502,413.00** |

## කාර්මික තාක්ෂණ ආයතනය (අනුප්‍රාප්තික ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය)
## 2012 දෙසැම්බර් 31 දිනට පරිත්‍යාග සහ ප්‍රදානයන්

සටහන - 6ආ

| පරිත්‍යාග | ගිණුම් අංකය | ශේෂය 2012.01.01 රු. ශත | 2012 වසර තුල එකතු කල අගය රු. ශත | 2012 වසර තුල ක්‍රමක්ෂය රු. ශත | 2012.12.31 දිනට ශේෂය රු. ශත |
|---|---|---|---|---|---|
| ප්‍රදානයන් සහ පරිත්‍යාග | 300201 | 347,577.80 | | (347,577.80) | |
| යුනිඩෝ ආධාර | 300202 | 7,155,210.94 | - | (1,468,769.84) | 5,686,441.10 |
| වෙනත් පරිත්‍යාග | 300204 | | - | | - |
| ප්‍රාග්ධන සංචිත | 300205 | 1,523,209.00 | - | | 1,523,209.00 |
| ආසියානු සංවර්ධන බැංකු පරිත්‍යාග | 300207 | 25,922,921.15 | - | (5,984,187.85) | 19,938,733.30 |
| ජී එම් බී එච් | 300208 | 103,500.00 | | (25,875.00) | 77,625.00 |
| පරිත්‍යාග - එන්සයිලේජ ටැංකිය | 300209 | 1,826,733.42 | | (456,683.48) | 1,370,049.94 |
| ජයිකා ආතනයීය ත්‍යාග | 300210 | 458,665.50 | - | (458,665.50) | - |
| ජර්මනියෙන් ලද ත්‍යාග | 300211 | 6,920.00 | - | (6,920.00) | - |
| ඉතාලියෙන් ලද ත්‍යාග | 300212 | 7,862.50 | - | (7,862.50) | - |
| ජයිකා ත්‍යාග - FP 42 | 300213 | 211,512.23 | - | (137,775.85) | 73,736.38 |
| එම් එච් අයි එම් ත්‍යාග - FP 36 | 300214 | 13,409.39 | | (7,492.40) | 5,916.99 |
| ලංකා කෘෂිකර්ම පර්යේෂණ සභාව මගින් ත්‍යාග - FP 48 | 300215 | 4,950.00 | - | (450.00) | 4,500.00 |
| ලංකා කෘෂිකර්ම පර්යේෂණ සභාව මගින් ත්‍යාග - FP 49 | 300216 | 27,430.00 | - | (24,330.00) | 3,100.00 |
| ජාතික විද්‍යා පදනමෙන් ලද ත්‍යාග - FP 33 | 300217 | 4,482.00 | - | (4,482.00) | - |
| ජාතික විද්‍යා පදනමෙන් ලද ත්‍යාග - FP 44 | 300218 | 3,621.00 | - | (3,621.00) | - |
| ටී වී ඊ සී ආයතනීය ත්‍යාග | 300219 | 47,581.30 | - | (18,439.30) | 29,142.00 |
| ජාතික පර්යේෂන කවුන්සිලයෙන් ලද ත්‍යාග - FP 38 | 300220 | 1,777.50 | - | (1,777.50) | - |
| ජාතික පර්යේෂන කවුන්සිලයෙන් ලද ත්‍යාග - FP 46 | 300221 | 22,453.50 | - | (22,453.50) | - |
| ජපාන 2KR ව්‍යාපෘතිය | 300222 | 5,800,397.72 | 1,916,750.00 | (4,301,074.29) | 14,828,904.85 |
| ජාතික විද්‍යා පදනමෙන් සහ ජයිකා ත්‍යාග | 300223 | 258,029.20 | - | (129,014.40) | 129,014.80 |
| එ ජා සං වැ මගින් ලද ත්‍යාග | 300224 | 3,841,242.65 | - | (650,221.81) | 3,191,020.84 |
| යුනිඩෝ ව්‍යාපෘතිය මගින ලද ත්‍යාග | 300225 | 408,757.75 | - | (68,126.30) | 340,631.45 |
| ජාත්‍යන්තර පරමාණු බලශක්ති අධිකාරිය - පරිත්‍යාග | 300226 | 4,540,303.05 | | (567,537.88) | 3,972,765.17 |
| සුනාමි ව්‍යාපෘතිය - ජාතික විද්‍යා පදනම | 300227 | 6,922.99 | | (1,012.99) | 5,910.00 |
| ජාතික විද්‍යා පදනම -SEM යන්ත්‍රය සඳහා උපාංග | 300228 | 999,000.00 | | (111,000.00) | 888,000.00 |
| අයි සී බී ආර් ජාත්‍යන්තර මධ්‍යස්ථානය - උණ බම්බු ව්‍යාපෘතිය සඳහා | 300229 | 2,171,292.00 | - | (271,411.50) | 1,899,880.50 |
| ග්‍රාමීය කර්මාන්ත සහ ස්වයං රැකියා අමාත්‍යාංශය | 300230 | 40,926.00 | - | (5,115.75) | 35,810.25 |
| වෙළඳ ද්‍රව්‍ය පිළිබඳ පොදු අරමුදල | 300231 | 2,277,932.50 | | (493,187.50) | 1,784,745.00 |
| භාණ්ඩාගාර ප්‍රදාන රථ වාහන | 300232 | | 7,500,000.00 | (696,721.31) | 6,803,278.69 |
| ජෛව තාක්ෂණ ඒකකය සඳහා පරිත්‍යාග | 300234 | | 2,009,380.00 | (50,000.00) | 1,959,380.00 |
| **එකතුව** | | **58,034,621.09** | **11,426,130.00** | **(16,321,787.25)** | **64,551,795.26** |

## කාර්මික තාක්ෂණ ආයතනය (අනුප්‍රාප්තික ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය)
## 2012 දෙසැම්බර් 31 වන දිනට ප්‍රත්‍යාගණිත ශේෂය

සටහන - 6ඇ

| | 2012 | 2011 |
|---|---|---|
| 2008 වසරේ ප්‍රත්‍යාගණනය | රු. ශත | රු. ශත |
| යන්ත්‍ර සූත්‍ර සහ රසායනාගාර උපකරණ | 26,950,099.00 | 26,950,099.00 |
| ලී බඩු වැද්දුම් සහ කාර්යාල උපකරණ | 6,404,627.35 | 6,404,627.35 |
| පරිගණක උපකරණ | (7,197,653.65) | (7,197,653.65) |
| | **26,157,072.70** | **26,157,072.70** |
| 2009 වසරේ ප්‍රත්‍යාගණනය | | |
| ගොඩනැගිලි | 102,685,356.82 | 102,685,356.82 |
| | **128,842,429.52** | **128,842,429.52** |

## කාර්මික තාක්ෂණ ආයතනය (අනුප්‍රාප්තික ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය)
## 2012 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
## ආදායම් සහ වියදම් ප්‍රකාශය පිළිබඳ සටහන්

**ආදායම් (සටහන් - 7අ)**

| | රු. ශත | රු. ශත |
|---|---|---|
| ආදායම් - ප්‍රමිත සේවා | 124,381,992.00 | |
| අඩු කලා - ලද පාරිභෝගික ඉන්වොයිසි නැවත ගෙවීම | 167,820.00 | **124,214,172.00** |
| ආදායම් - උපදේශක සේවා | | 10,089,589.20 |
| ආදායම් - තාක්ෂණ හුවමාරු | | 1,889,601.00 |
| ආදායම් - ගිවිසුම්ගත ව්‍යාපෘති | 15,623,937.00 | |
| අඩු කලා - අනු ගිවිසුම් ව්‍යාපෘති | 7,542,000.00 | 8,081,937.00 |
| ආදායම් - වරණාත්මක සේවා | | 10,090,244.89 |
| ආදායම් - පුහුණු කිරීම් | | 4,016,222.00 |
| | | 962,189.00 |
| | | **159,343,955.09** |

**වෙනත් ආදායම් (සටහන - 7ආ)**

**වෙනත් මෙහෙයුම් ආදායම්**

| | | |
|---|---|---|
| ආදායම් - පුස්තකාල | 370,565.00 | |
| ආදායම් - වෙනත්/පොදු | 8,979,671.11 | **9,350,236.11** |

**වෙනත් මෙහෙයුම් නොවන ආදායම්**

| | | |
|---|---|---|
| ණය පොලී | 777,504.71 | |
| ආයෝජන මත පොලී (ව්‍යාපෘති අරමුදල්, පාරිතෝෂික, LC තැන්පත්) | 17,111,787.99 | |
| කා. තා. ආ. දායකත්වය - ව්‍යාපෘති සඳහා | 163,450.00 | |
| ආදායම් - උපදේශක සේවා ගාස්තුහි ප්‍රතිශතය | 10,500.00 | |
| දේපල අලෙවියෙන් ලද ආදායම | 60,360.00 | |
| හුවමාරු වූ ලැබීම් හා අහිමිවීම් | 1,639,495.43 | **19,763,098.13** |
| | | **29,113,334.24** |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No: ඒල්එස්/ඊ/අයිටීඅයි/ එෆ්ඒ/ 2012 | ඔබේ අංකය / உமது இல / Your No. | දිනය / திகதி / Date: 2013 ඔක්තෝබර් 30 දින |

සභාපති,
කාර්මික තාක්ෂණ ආයතනය.

**කාර්මික තාක්ෂණ ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

කාර්මික තාක්ෂණ ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1974 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩිදියුණු කිරීමේ පනතේ VII කොටසේ 40 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2013 ජුනි 07 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම.

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම.

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

-------------------

2.1 තත්ත්වාගණනය කළ මතය.

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට කාර්මික තාක්ෂණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

----------------------------------------

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පාරිතෝෂික ගෙවීම් පනතේ විධිවිධානවලට පටහැනිව, සේවා කාලය වර්ෂයක් සම්පූර්ණවී නොතිබුණු සේවකයින් 35 දෙනෙකු වෙනුවෙන් පාරිතෝෂික ගෙවීම් සඳහා රු.227,056 ක් වෙන්කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය සහ 2012 දෙසැම්බර් 31 දිනට බැරකම් ඊට සමාන ප්‍රමාණයකින් පිළිවෙලින් අඩුවෙන් සහ වැඩියෙන් දැක්වේ.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී විශ්‍රාම ගෙන තිබුණු නිලධාරියෙකු වෙත ගෙවිය යුතුව තිබුණු රු.774,758 ක්වූ පාරිතෝෂික දීමනා ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය සහ 2012 දෙසැම්බර් 31 දිනට බැරකම් ඊට සමාන ප්‍රමාණයකින් පිළිවෙලින් වැඩියෙන් සහ අඩුවෙන් දැක්වේ.

(ඇ) කත්‍රභාග ආදායම උපචිත පදනම මත ගිණුම්ගත කර නොතිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු රු.264,577 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබීමත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතුව තිබුණු රු.579,729 ක්වූ ආදායම ගිණුම්ගත කර නොතිබීමත් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.315,152 කින් අඩුවෙන් දැක්වෙන අතර 2012 දෙසැම්බර් 31 දිනට වත්කම් රු.579,729 කින් අඩුවෙන් දැක්වේ.

(ඇ) 2012 පෙබරවාරි 24 දින ජෛව තාක්ෂණ ඒකකයෙන් ලැබී තිබුණු පිරිවැය රු.1,959,380 ක්වූ දේපළ පිරියත හා උපකරණ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ රු.166,493 වූ ක්ෂය ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය සහ 2012 දෙසැම්බර් 31 දිනට වත්කම් ඊට සමාන ප්‍රමාණයකින් වැඩියෙන් දැක්වේ.

(ඉ) ප්‍රදාන සහ ආධාර ලෙස ලැබී තිබුණු වත්කම් ඒවායේ ඵලදායී ජීවකාලය අනුව නිවැරදිව ක්‍රමක්ෂය කර නොතිබීම හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට වත්කම් සහ ප්‍රදාන රු.5,002,208 කින් වැඩියෙන් දැක්වේ.

(ඊ) රජයේ ප්‍රදාන ලෙස ලැබී තිබුණු වත්කම් ක්‍රමක්ෂය සම්බන්ධයෙන් 2011 වර්ෂයට අදාළව ගැලපීම් කළ යුතුව තිබුණු රු.19,527,723 ක් වෙනුවට රු.15,226,646 ක් ගැලපීම් කර තිබීම හේතුවෙන් රජයේ ප්‍රදාන සහ ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,301,077 කින් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දැක්වේ.

### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණු පාරිතෝෂික දීමනා මුදල රු.8,881,200 ක් වුවද, පාරිතෝෂික දීමනා වෙන්කිරීම් ගිණුමට එය රු.9,307,648 ක් ලෙස හර කර තිබුණි. රු.426,448 ක්වූ වෙනසට පිළිගත හැකි හේතු ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2012 දෙසැම්බර් 31 දිනට පාරිභෝජන ද්‍රව්‍ය තොග වටිනාකම රු.12,417,303 ක් ලෙස ගිණුම්ගත කර තිබුණද, භෞතික තොග සමීක්ෂණ වාර්තා අනුව එහි වටිනාකම රු.12,132,037 ක් විය. රු.285,276 ක්වූ වෙනසට පිළිගත හැකි හේතු ඉදිරිපත්කර නොතිබුණි.

### 2.2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව රු.301,307 ක්වූ ණයගැති ගිණුම් ශේෂ 05ක් ලැබිය යුතු ගිණුම් යටතේ හෙළිදරව් කර තිබුණ නමුත් එවැනි ණයගැති ශේෂ නොමැති බව ණයගැතියන් විසින් එවා තිබුණු සෘජු ශේෂ සනාථ කිරීම්වලින් තහවුරු විය. තවද, එකතුව රු.256,193 ක් වූ ණයගැති ශේෂ 03ක් තහවුරු කර ගැනීම සඳහා යොමුකරන ලද සනාථ කිරීමේ ලිපි ආයතනය වෙත ආපසු ලැබී තිබුණි.

(ආ) 2011 මැයි 30 දින පවත්වා තිබුණු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අංක 16 දරන නියෝගය ප්‍රකාරව, විදේශ ශිෂ්‍යත්ව ගිවිසුම් කොන්දේසි කඩකළ නිලධාරීන් 18 දෙනෙකුගෙන් අයකර ගතයුතු රු.4,069,011 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඊට අමතරව 2009 වර්ෂයේදී විදේශගතවී තිබුණු නිලධාරිණියක් ගිවිසුම් කොන්දේසි කඩකරමින් 2012 දෙසැම්බර් 31 දින වන විටත් සේවයට වාර්තා කර නොතිබුණු අතර ඇයගෙන් අයකර ගත යුතුව තිබුණු රු.3,789,640 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පසුගිය වර්ෂ කිහිපයකදී අහරුවී ආපසු ලැබී තිබුණු චෙක්පත්වල වටිනාකම රු.546,796 කට සහ රු.71,000 කට අදාළ ණයගැතියන් හඳුනාගෙන මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| විවිධ සේවාවන් සපයා ගැනීම වෙනුවෙන් බාහිර පාර්ශව වෙත තැන්පත්කර තිබුණු මුදල් | 1,760,470 | ලදුපත් හෝ වෙනත් ලිඛිත සාක්ෂි |
| සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණු පර්යේෂණ හා සංවර්ධන දීමනා | 3,107,917 | අනුමත ව්‍යාපෘති යෝජනා ඇතුළත් වාර්තා |
| වර්ෂ 5ට වඩා වැඩි උපචිත වියදම් හා ණයහිමියන් | 249,053 | සත්‍යාපනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි |

### 2.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධානවලට පටහැනිව, මුළු වටිනාකම රු.270,226,000 ක්වූ ආයෝජන සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. ආයෝජනවල සංයුතිය පැහැදිළිව දැක්වෙන පරිදි හෙළිදරව් කරද නොතිබුණි.

2.2.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

---

අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකින් තොරව, රු.2,433,165 ක් බොල් ණය ලෙස කපාහැර තිබුණු අතර රු.6,188,759 ක්වූ ණයහිමි ශේෂ ආදායමට ගෙන තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

---

3.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු.146,371,557 ක ඌනතාවයක් වූ අතර, ඉකුත් වර්ෂයේ අනුරූපී ඌනතාවය රු.102,795,322 ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රු.169,000,000 ක්වූ රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.22,628,443 ක අතිරික්තයක් බවට පත්ව තිබුණු අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.59,318,986 ක අතිරික්තයක් බවට පත්වී තිබුණි. ඒ අනුව පෙර වර්ෂය හා සසඳන කළ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.36,690,543 ක පිරිහීමක් දක්නට ලැබුණි.

සමාලෝචිත වර්ෂයේදී ආයතනය මෙහෙයුම් කටයුතුවලින් ඉපැයූ මුළු ආදායම රු.418,184,465 ක්වූ අතර, ඊට සාපේක්ෂව ඉකුත් වර්ෂයේ ආදායම රු.446,119,776 ක් විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

ව්‍යාපෘති ප්‍රගතිය

(අ) භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ආරම්භ කර තිබුණු පහතින් විස්තර දැක්වෙන ව්‍යාපෘති 02 කට අදාළ භෞතික ප්‍රගතියෙහි සැළකිය යුතු ප්‍රමාදයන් විය.

| ව්‍යාපෘති අංකය | ආරම්භක දිනය | නිමකළ යුතු දිනය | 2012 දෙසැම්බර් 31 දින වන විට ගතවී තිබුණු කාලය | 2012 දෙසැම්බර් 31 දින වන විට භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| | | | | සියයට |
| TG/24 | 2011 මැයි | 2014 මැයි | මාස 18 | 10 |
| TG/36 | 2011 අගෝස්තු | 2013 අගෝසතු | මාස 16 | 15 |

(ආ)2012 ජුනි මාසයේදී නිම කිරීමේ ඉලක්කයක් සහිතව ඊට වර්ෂයකට පෙරදී ආරම්භ කර තිබුණු ව්‍යාපෘති 03 ක කාලය මාස 09 කින් දීර්ඝ කර තිබුණු බැවින්, ඒවා 2013 මාර්තු මාසයේදී නිමකළ යුතුව තිබුණු නමුත්, 2013 මාර්තු 31 දින වන විටත් එම ව්‍යාපෘති නිමකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී රු.1,600,000 ක් පිරිවැයවූ ව්‍යාපෘති 03 ක වැඩ ආරම්භ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

භාණ්ඩාගාර අක්මුදල් ලැබීමේ ප්‍රමාදය ඊට හේතුවූ බව ආයතනයේ සභාපතිවරයා විසින් දන්වා තිබුණි.

(ඈ) වර්ෂ 03 කින් නිමකිරීමේ ඉලක්කයක් සහිතව අංක FP/83 දරන ව්‍යාපෘතිය 2009 මාර්තු මාසයේදී ආරම්භ කර තිබුණු අතර ආයතනය විසින් පිළියෙල කර තිබුණු ප්‍රගති වාර්තාවලට අනුව 2012 දෙසැම්බර් 31 දිනට එහි භෞතික ප්‍රගතිය සියයට 60 ක් වී තිබුණි. නමුත් ව්‍යාපෘති ක්‍රියාකාරීත්වයේ ගැටළු හේතුවෙන් අරමුදල් සපයන ආයතන විසින් අරමුදල් සැපයීම අත්හිටුවා තිබීම මත ව්‍යාපෘතියේ වැඩ 2012 ජනවාරි 01 දින සිට අක්‍රියව තිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අදාළ ආයතන 04ක විගණිත මූල්‍ය ප්‍රකාශනවලට අනුව පවතින නිෂ්පාදන මට්ටම මත ගණනය කළයුතු කතෘ භාගය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ වෙනුවට එම ආයතන 04 විසින් එවා තිබුණු ආදායම පමණක් ගිණුම්ගත කිරීමට කටයුතු කර තිබුණු අතර, එම ආයතන සමග එළඹ තිබුණු ගිවිසුම් ප්‍රකාරව, හිඟ ආදායම් සහ දඩ මුදල් ගණනය කර ගිණුම් ගත කිරීමට හා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) බදු නිදහස් ආයතනයක් වුවත්, ස්ථාවර තැන්පත් පොළී මත අයකර තිබුණු රඳවාගැනීමේ බද්ද නිදහස් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.3 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---

රු.1,179,928 ක්වූ කාර්ය මණ්ඩල ක්‍රියාකාරීත්ව අරමුදල කිසිදු කාර්යයක් සඳහා උපයෝජනය කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

---

විගණනයේදී නිරීක්ෂණයවූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) විදේශ ශිෂ්‍යත්ව හා විදේශ ගමන්

(ආ) ණයගැතියන් හා ණයහිමියන්

(ඇ) මිලදී ගැනීම

(ඈ) සුළු මුදල්

(ඉ) වැටුප් ගෙවීම්

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

වැඩබලන විගණකාධිපති.

| අදාල වගන්තිය | විගණකාධිපති වාර්තාවෙහි විස්තර/ අදහස් දැක්වීම | කාර්මික තාක්‍ෂණ ආයතනිය අදහස් දැක්විම- 31.03.2014 |
|---|---|---|
| 2. 2<br>2. 2. 1 | **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්විම</u>**<br>**<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**<br><br>**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.** | |
| අ) | පාරිතෝෂික ගෙවීම් පනතේ විධිවිධානවලට පටහැනිව, සේවා කාලය වර්ෂයක් සම්පූර්ණ වී නොතිබුණු සේවකයින් 35 දෙනෙකු වෙනුවෙන් පාරිතෝෂික ගෙවීම් සඳහා රු. 227,056 ක් වෙන්කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය සහ 2012 දෙසැම්බර් 31 දිනට බැරකම් ඊට සමාන ප්‍රමාණයකින් පිළිවෙලින් අඩුවෙන් සහ වැඩියෙන් දැක්වේ. | සටහන් කරගන්නා ලද අතර, 2013 වසරෙහිදී නිවැරදි ආකාරයට වෙන් කිරීම් ඇති කිරීමට අවශ්‍ය පියවර ගැනෙනු ඇත. |
| ආ) | සමාලෝචිත වර්ෂය තුල දී විශ්‍රාම ගෙන තිබුණු නිලධාරියෙකු වෙත ගෙවිය යුතුව තිබුණු රු. 774,758 ක්වූ පාරිතෝෂික දීමනා ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය සහ 2012 දෙසැම්බර් 31 දිනට බැරකම් ඊට සමාන ප්‍රමාණයකින් පිළිවෙලින් වැඩි සහ අඩුවෙන් දැක්වේ. | මෙම නිලධාරියාගේ සේවා කාලය දීඝී කිරීම සඳහා අවශ්‍ය තීර්ණය ගනු ලැබුයේ 2013 වසරෙහිදීය. කෙසේ වුවද මෙවැනි අතපසුවීම් වලින් බැහැර වීම සඳහා අවශ්‍ය කටයුතු කෙරේ. |
| ඇ) | කතෘභාග ආදායම උපචිත පදනම මත ගිණුම්ගත කර නොතිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු රු. 264,577ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබීමත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතුව තිබුණු රු. 579,729 ක්වූ ආදායම ගිණුම්ගත කර නොතිබීමත් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. 315,152 කින් අඩුවෙන් දැක්වෙන අතර 2012 දෙසැම්බර් 31 දිනට වත්කම් රු. 579,729 කින් අඩුවෙන් දැක්වේ. | ඉදිරි කාලයේ දි උපචිත පදනම මත ගිණුම් ගත කිරිමට අවශ්‍ය කටයුතු කෙරෙනු ඇත. |
| ඇ) | 2012 පෙබරවාරි 24 දින ජෛව තාක්ෂණ ඒකකයෙන් ලැබී තිබුණු පිරිවැය රු.1,959,380ක්වූ දේපළ පිරියත හා උපකරණ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ රු. 166,493වු ක්ෂය ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය සහ 2012 දෙසැම්බර් 31 දිනට වත්කම් ඊට සමාන ප්‍රමාණයකින් වැඩියෙන් දැක්වේ. | මෙම පරිත්‍යාගයන් 31.12.2012 වසරේදි ගිණුම්ගත කල බැවින් සමාලෝචිත වර්ෂයේදි ක්ෂය සඳහා වෙන්කිරීම් නොකෙරින. ඉදිරියේදි මෙවැනි අඩු ලුහුඩුකම් සිදු නොවිමට කටයුතු කෙරෙනු ඇත. |

| අදාල වගන්තිය | විගණකාධිපති වාර්තාවෙහි විස්තර/ අදහස් දැක්වීම | කාර්මික තාක්ෂණ ආයතනිය අදහස් දැක්වීම- 31.03.2014 |
|---|---|---|
| ඉ) | ප්‍රදාන සහ ආධාර ලෙස ලැබී තිබුණු වත්කම් ඒවායේ ඵලදායී ජීවකාලය අනුව නිවැරදිව ක්‍රමක්ෂය කර නොතිබීම හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට වත්කම් සහ ප්‍රදාන රු. 5,002,208 කින් වැඩියෙන් දැක්වේ. | මෙය 2012 වසර තුල සිදුවී නොමැති අතර මෙය වසර ගණනාවක් තුළ සිට පැවතේ. කෙසේ වුවද, 2012 වසරේදි සැලකිය යුතු ප්‍රමාණයකින් නිවැරදි කර ඇති අතර ඉතිරිය 2013 වසරේදි නිවැරදි කෙරෙනු ඇත. |
| ඊ) | රජයේ ප්‍රදාන ලෙස ලැබී තිබුණු වත්කම් ක්‍රමක්ෂය සම්බන්ධයෙන් 2011 වර්ෂයට අදාළව ගැලපීම් කළ යුතුව තිබුණු රු.19,527,723ක් වෙනුවට රු. 15,226,646 ක් ගැලපීම් කර තිබීම හේතුවෙන් රජයේ ප්‍රදාන සහ ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 4,301,077 කින් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දැක්වේ. | 2013 වසරේදි ගැලපීම් කිරීමට කටයුතු කෙරේ. |
| 2. 2. 2 | පැහැදිලි නොකළ වෙනස්කම්<br><br><u>පහත නිරීක්ෂණයන් කරනු ලැබේ</u> | |
| අ) | සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණු පාරිතෝෂික දීමනා මුදල රු. 8,881,200 ක් වුවද, පාරිතෝෂික දීමනා වෙන්කිරීම් ගිණුමට එය රු. 9,307,648 ක් ලෙස හර කර තිබුණි. රු. 426,448 ක් වූ වෙනසට පිළිගත හැකි හේතු ඉදිරිපත් කර නොතිබුණි. | වසර තුලදී ගෙවන ලද පාරිතෝෂිත මුදල රු. 8,881,200 ක් වේ. සඳහන් කරන ලද වෙනස වසර ගණනාවක සිට ඉදිරියට ගෙන එන ලද ශේෂයන් වන අතර, ඉදිරි කාලයේ මෙය නිවැරදි කිරීමට කටයුතු කෙරෙනු ඇත. |
| ආ) | 2012 දෙසැම්බර් 31 දිනට පාරිභෝජන ද්‍රව්‍ය තොග වටිනාකම රු.12,417, 303 ක් ලෙස ගිණුම්ගත කර තිබුණද, භෞතික තොග සමීක්ෂණ වාර්තා අනුව එහි වටිනාකම රු.12,132,037ක් විය. රු.285,276 ක්වූ වෙනසට පිළිගත හැකි හේතු ඉදිරිපත් කර නොතිබුණි. | ආරම්භක ශේෂයන්හි වෙනස වසර ගණනාවක සිට පැවත එනු ලබන අතර, ශේෂයන් සැසඳීමට උත්සාහ කෙරේ. |

| අදාල වගන්තිය | විගණකාධිපති වාර්තාවෙහි විස්තර/ අදහස් දැක්වීම | කාර්මික තාක්‍ෂණ ආයතනිය අදහස් දැක්වීම- 31.03.2014 |
|---|---|---|
| 2. 2. 3<br><br><br>අ) | <u>ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්</u><br><br>**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ**<br><br>එකතුව රු. 301,307 ක්වූ ණයගැති ගිණුම් ශේෂ 05 ක් ලැබිය යුතු ගිණුම් යටතේ හෙළිදරව් කර තිබුණ නමුත් එවැනි ණයගැති ශේෂ නොමැති බව ණයගැතියන් විසින් එවා තිබුණු සෘජු ශේෂ සනාථ කිරීම්වලින් තහවුරු විය. තවද, එකතුව රු. 256,193 ක් වූ ණයගැති ශේෂ 03 ක් තහවුරු කර ගැනිම සඳහා යොමුකරන ලද සනාථ කිරීමේ ලිපි ආයතනය වෙත ආපසු ලැබි තිබුණි. | <br><br><br><br><br>ගිණුම්කරණ පද්ධතිය වෙනස් කරන අවස්ථාවෙහිදි ශේෂයන් දෙවරක් සටහන් වීම හේතුවෙන් මෙම තත්වය උද්ගත වී ඇති අතර ඉදිරියේදි ගිණුම් සැසදීමට උත්සාහ කෙරේ. |
| ආ) | 2011 මැයි 30 දින පවත්වා තිබුණු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අංක 16 දරන නියෝගය ප්‍රකාරව, විදේශ ශිෂ්‍යත්ව ගිවිසුම් කොන්දේසි කඩකල නිලධාරීන් 18 දෙනෙකුගෙන් අයකර ගත යුතු රු. 4,069,011ක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. ඊට අමතරව 2009 වර්ෂයේදී විදේශගතවී තිබුණු නිලධාරිණියක් ගිවිසුම් කොන්දේසි කඩකරමින් 2012 දෙසැම්බර් 31 දිනවන විටත් සේවයට වාර්තා කර නොතිබුණු අතර ඇයගෙන් අයකර ගත යුතුව තිබුණු රු. 3,789,640ක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල් අයකර ගැණිමට කටයුතු කල නමුත් ඉතා සුළු පිරිසක් පමණක් ප්‍රතිචාර දැක්විය. මෙම කරුණ සම්බන්ධව කිහිප වාරයක් රාජ්‍ය ව්‍යාපාර කමිටුවෙහිදි (COPE) සාකච්ඡා කල අතර, ගිණුම් පියවිමට අවශ්‍ය කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදි. වර්තමානයේ විදේශ ගත වන නිලධාරීන් සම්බන්ධයෙන් මනා පාලනයක් ඇති කිරීම සඳහා දැඩි වාරණයන් සමඟ නව ගිවිසුමක් හඳුන්වාදි ඇත. |

| අදාල වගන්තිය | විගණකාධිපති වාර්තාවෙහි විස්තර/ අදහස් දැක්වීම | කාර්මික තාක්‍ෂණ ආයතනිය අදහස් දැක්වීම- 31.03.2014 |
|---|---|---|
| ඇ) | පසුගිය වර්ෂ කිහිපයකදී අගරුවී ආපසු ලැබී තිබුණු චෙක්පත්වල වටිනාකම රු. 546,796 කට සහ රු. 71,000 කට අදාළ ණයගැතියන් හඳුනාගෙන මුදල් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | මෘදූකාංග සැපයුම් කරුවකු හට අත්තිකාරමක් ලෙස ගෙවන ලද රු. 71,000 ක මුදල එම පුද්ගලයා ජිවතුන් අතර නොමැති බැවින් අයකර ගැනිමට අපොහොසත් විය. අගරු වූ චෙක්පත් හි ශේෂයන් වසර ගණනාවක සිට පැවත එනු ලබන අතර, ඒ සඳහා අදල ලිඛිත සාක්ෂි සොයා ගැනීමේ අපහසුතාවයකට වර්තමානයේ දී මුහුණ පා ඇත. |
| 2. 2. 4 | **වීගණනය සඳහා සාක්ෂි නොවීම**<br><br>පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම හේතුවෙන් විගණනයේ දි සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරීමට නොහැකි විය.<br><br>**විෂයය**<br>විවිධ සේවාවන් සපයා ගැනිම වෙනුවෙන් බාහිර පාර්ශව වෙත තැන්පත්කර තිබුණු මුදල්<br>**වටිනාකම**<br>රු. 1,760,470<br>**ඉදිරිපත් නොකළ සාක්ෂි**<br>ලදුපත් හෝ වෙනත් ලිඛිත සාක්ෂි | තැන්පත් සඳහා අදාල සමහර ලදුපත් විගණනයට ඉදිරිපත් කලහැකි නමුත් සමහර තැන්පත් ඉතා පැරණි බැවින් ලදුපත් ඉදිරිපත් කිරීමට අපොහොත්ය. කෙසේ වුවද, මෙම තැන්පතු ලෙජරයේ සටහන් වී ඇත. |

| අදාල වගන්තිය | විගණකාධිපති වාර්තාවෙහි විස්තර/ අදහස් දැක්වීම | කාර්මික තාක්‍ෂණ ආයතනිය අදහස් දැක්වීම- 31.03.2014 |
|---|---|---|
| | **විෂයය**<br>සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණු පර්යේෂණ හා සංවර්ධන දීමනා<br>**වටිනාකම**<br>රු. 3,107,917<br>**ඉදිරිපත් නොකළ සාක්ෂි**<br>අනුමත ව්‍යාපෘති යෝජනා ඇතුළත් වාර්තා<br><br>**විෂයය**<br>වර්ෂ 5ට වඩා වැඩි උපචිත වියදම් හා ණයහිමියන්<br>**වටිනාකම**<br>රු. 249,053<br>**ඉදිරිපත් නොකළ සාක්ෂි**<br>සත්‍යාක්ෂණය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි | මෙම ව්‍යාපෘතීන් අමාත්‍යාංශය විසින් අනුමත කර ඇති බැවින් පර්යේෂණ දීමනා ලෙස මෙම ගෙවීම් කර ඇත. අදාල ලියවිලි විගණනය සඳහා ඉදිරිපත් කලහැක.<br><br>මෙම ශේෂයන් ඉතා පැරණි වන අතර, 2013 වර්ෂයේදී සඳහන් කර ඇති ණය හිමියන්ගේ ශේෂයන් තහවුරු කර ගැනිමට කටයුතු කෙරේ. |
| 2. 2. 5 | **නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකුල නොවීම**<br><br>1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධානවලට පටහැනිව, මුළු වටිනාකම රු. 270,226,000ක්වූ ආයෝජන සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. ආයොජනවල සංයුතිය පැහැදිළිව දැක්වෙන පරිදි හෙළිදරව් කරද නොතිබුණි. | මහා භාණ්ඩාගාරයේ අනුදැනුම සහ අනුමැතිය ඇතිව, පාරිතෝෂික දිමනා සඳහා වෙන් කරන ලද රු. මි. 100ක මුදල තැනපත් කර ඇත. ඉතිරි තැන්පතුව ආයතනිය කාරක ප්‍රාග්ධන ( රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛ අංක 56 අනුව ) සහ මාලඹේ නවින පර්යේෂණ සංකීර්ණයෙහි ඉදිකිරීම් කටයුතු සඳහා වේ. |
| 2.2.6 | **ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**<br><br>අධ්‍යක්ෂ මණ්ඩල තීර්ණයකින් තොරව, රු. 2,433,165ක් බොල් ණය ලෙස කපාහැර තිබුණු අතර රු. 6,188,759ක්වූ ණයහිමි ශේෂ ආදායමට ගෙන තිබුණි. | මෙම ශේෂයන් ඉතා පැරණි සහ ප්‍රතිසටහන් වන ලද ඒවා වේ. මෙම කරුණ සම්බන්ධයෙන් විගණන කමිටුවෙහිදී සාකච්ජා කරන ලද අතර, පොත් වලින් කපා හරිනු ලැබිය. |

| අදාල වගන්තිය | විගණකාධිපති වාර්තාවෙහි විස්තර/ අදහස් දැක්වීම | කාර්මික තාක්ෂණ ආයතනිය අදහස් දැක්විම- 31.03.2014 |
|---|---|---|
| 3. | **මූල්‍ය සමාලෝචනය** | |
| 3.1 | **මූල්‍ය ප්‍රතිඵල**<br><br>ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු. 146,371,557 ක ඌනතාවයක් වූ අතර, ඉකුත් වර්ෂයේ අනුරූපී ඌනතාවය රු. 102,795,322 ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රු. 169,000,000 ක්වූ රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 22,628,443 ක අතිරික්තයක් බවට පත්ව තිබුණු අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 59,318,986 ක අතිරික්තයක් බවට පත් වී තිබුණි. ඒ අනුව පෙර වර්ෂය හා සසඳන කළ සමාලෝචිත වර්ෂයේ පූල්‍ය ප්‍රතිඵලය රු. 36,690,543 ක පිරිහීමක් දක්නට ලැබුණි.<br><br>සමාලෝචිත වර්ෂයේදී ආයතනය මෙහෙයුම් කටයුතුවලින් ඉපැයූ මුළු ආදායම රු. 418,184,465ක්වූ අතර, ඊට සාපේක්ෂව ඉකුත් වර්ෂයේ ආදායම රු. 446,119,776ක් විය. | සඳහන් කිරීමට වෙනත් අදහස් දැක්විම් නොමැත. |

| අදාල වගන්තිය | විගණකාධිපති වාර්තාවෙහි විස්තර/ අදහස් දැක්වීම | කාර්මික තාක්ෂණ ආයතනිය අදහස් දැක්වීම-31.03.2014 |
|---|---|---|
| 4. | **මෙහෙයුම් සමාලෝචනය** | |
| 4. 1 | **කාර්යසාධනය** | |
| | **ව්‍යාපෘති ප්‍රගතිය** | |
| අ) | භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ආරම්භ කර තිබුණු පහතින් විස්තර දැක්වෙන ව්‍යාපෘති 02කට අදාළ භෞතික ප්‍රගතියෙහි සැළකිය යුතු ප්‍රමාදයන් විය. | |

| ව්‍යාපෘති අංකය | ආරම්භක දිනය | නිමකළ යුතු දිනය | 2012 දෙසැම්බර් 31 දින වන විට ගතවී තිබුණු කාලය | 2012 දෙසැම්බර් 31 දින වන විට භෞතික ප්‍රගතිය සියයට | කාර්මික තාක්ෂණ ආයතනිය අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| TG/24 | 2011 මැයි | **2014 මැයි** | මාස 18 | 10 | **TG(භ.ව.) 11/24**<br>මෙය වසර 3ක ව්‍යාපෘතියක් වන අතර, මාස 8 ක කාලයක් සම්පූර්ණ වී ඇත, පර්යේෂණ විද්‍යාඥයෙකු බඳවාගත් විගස මෙම ව්‍යාපෘතයෙහි කටයුතු ආරම්භ කරනු ඇත. |
| TG/36 | 2011 අගෝස්තු | 2013 අගෝස්තු | මාස 16 | 15 | **TG/36(භ.ව.) 08/36**<br>ප්‍රායෝගික සහ විද්‍යාත්මක/ විශ්ලේෂණ අවහිරතාවයන් හේතුවෙන් මෙම ව්‍යාපෘතියෙහි කටයුතු තාවකාලිකව නතර කර ඇති අතර, 2013 මැයි මස සිට නැවත ආරම්භ කර ඇත. |

කාර්මික තාක්ෂණ ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

| අදාල වගන්තිය | විගණකාධිපති වාර්තාවෙහි විස්තර/ අදහස් දැක්වීම | කාර්මික තාක්ෂණ ආයතනිය අදහස් දැක්වීම- 31.03.2014 |
|---|---|---|
| ආ) | 2012 ජුනි මාසයේදී නිම කිරීමේ ඉලක්කයක් සහිතව ඊට වර්ෂයකට පෙරදී ආරම්භ කර තිබුණු ව්‍යාපෘති 03 ක කාලය මාස 09 කින් දීර්ඝ කර තිබුණු බැවින්, ඒවා 2013 මාර්තු මාසයේදී නිමකළ යුතුව තිබුණු නමුත්, 2013 මාර්තු 31 දින වනවිටත් එම ව්‍යාපෘති නිමකර නොතිබුණි. | ව්‍යාපෘතිය සඳහා අධි තාක්ෂණයෙන් යුත් යන්ත්‍ර-සූත්‍ර උපකරණ සහ විශේෂිත, රසායන ද්‍රව්‍ය අවශ්‍ය වූ බැවින් ඒ සඳහා අවශ්‍ය මුදල් මහා භාණ්ඩාගාරයෙන් ලබා ගැණිමේදී සිදු වූ ප්‍රමාදයන් සහ සියළු කරුණු හේතුවෙන් ව්‍යාපෘතියෙහි කටයුතු ප්‍රමාද විය. කෙසේ නමුදු 2013 වසරේ සිට මෙම ව්‍යාපෘතියන්හි නැවත කටයුතු ආරම්භ කර ඇත. |
| ඇ) | සමාලෝචිත වර්ෂය තුල දි රු.1,600,000 ක් පිරිවැයවු ව්‍යාපෘති 03 ක වැඩ ආරම්භ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.<br><br>භාණ්ඩාගාර අක්මුදල් ලැබීමේ ප්‍රමාදය ඊට හේතුවු බව ආයතනයේ සභාපතිවරයා විසින් දන්වා තිබුණි. | මහා භාණ්ඩාගාරයෙන් අරමුදල් ලබාගැනීමට ප්‍රමාද වූ බැවින් මෙම ව්‍යාපෘතිය නවතා දැමීමට සිදුවිය. |
| (ඇ) | වර්ෂ 03 කින් නිමකිරීමේ ඉලක්කයක් සහිතව අංක FP/83 දරන ව්‍යාපෘතිය 2009 මාර්තු මාසයේ දි ආරම්භ කර තිබුණු අතර ආයතනය විසින් පිළියෙල කර තිබුණු ප්‍රගති වාර්තවලට අනුව 2012 දෙසැම්බර් 31 දිනට එහි භෞතික ප්‍රගතිය සියයට 60 ක් වි තිබුණි. නමුත් ව්‍යාපෘති ක්‍රියාකාරීත්වයේ ගැටළු හේතුවෙන් අරමුදල් සපයන ආයතන විසින් අරමුදල් සැපයිම අත්හිටුවා තිබිම මත ව්‍යාපෘතියේ වැඩ 2012 ජනවාරි 01 දින සිට අක්‍රියව තිබුණි. | අරමුදල් ලබාදුන් ආයතනය, ව්‍යාපෘති කටයුතු සඳහා අරමුදල් ලබාදිම නතර කල බැවින් ව්‍යාපෘතියෙහි කටයුතු නතර කිරීමට සිදුවිය. |

| අදාල වගන්තිය | විගණකාධිපති වාර්තාවෙහි විස්තර/ අදහස් දැක්වීම | කාර්මික තාක්ෂණ ආයතනිය අදහස් දැක්විම- 31.03.2014 |
|---|---|---|
| 4.2 | **කළමනාකරණ අකාර්යක්ෂමතා**<br><br>**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ** | |
| අ) | අදාල ආයතන 04ක විගණිත මූල්‍ය ප්‍රකාශනවලට අනුව පවතින නිෂ්පාදන මට්ටම මත ගණනය කළයුතු කතෘ භාගය අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. ඒ වෙනුවට එම ආයතන 04 විසින් එවා තිබුණු ආදායම පමණක් ගිණුම්ගත කිරීමට කටයුතු කර තිබුණු අතර, එම ආයතන සමග එළඹ තිබුණු ගිවිසුම් ප්‍රකාරව, හිඟ ආදායම් සහ දඩ මුදල් ගණනය කර ගිණුම් ගත කිරීමට හා අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | නිසි කාලයේ දි කතෘ භාගය සඳහා ලැබිය යුතු මුදල අයකර ගැණිමට කටයුතු කෙරෙන අතර, ඒ සඳහා අදල ආදායම් වාර්තා ලබා ගැනීමට උත්සාහ දරනු ඇත. |
| ආ) | බදු නිදහස් ආයතනයක් වුවත් ස්ථාවර තැන්පත් පොළි මත අයකර තිබුණු රඳවා ගැනිමේ බද්ද නිදහස් කර ගැනිමට කටයුතු කර නොතිබුණි. | රඳවා ගැණිමේ බදුවලින් නිදහස් කර ගැනීමට ඇති අවස්ථාවන් පිළිබඳ සොයා බලා කටයුතු කරනු ඇත. |
| 4. 3 | **නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**<br><br>රු. 1,179,928ක්වු කාර්ය මණ්ඩල ක්‍රියාකාරීත්ව අරමුදල කිසිදු කාර්යයක් සඳහා උපයොජනය කර නොතිබුණි. | 2013 වසරේදී මෙම අරමුදල මගින් ක්‍රියාකම් කර ඇත. |

කාර්මික තාක්ෂණ ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

| අදාල වගන්තිය | විගණකාධිපති වාර්තාවෙහි විස්තර/ අදහස් දැක්වීම | කාර්මික තාක්ෂණ ආයතනිය අදහස් දැක්වීම- 31.03.2014 |
|---|---|---|
| 5. | පද්ධති හා පාලන<br><br>විගණනයේ දි නිරීක්ෂණයවූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.<br><br>අ) විදේශ ශිෂ්‍යත්ව හා විදේශ ගමන්<br><br>ආ) ණයගැතියන් හා ණයහිමියන්<br><br>ඇ) මිලදී ගැනීම්<br><br>ඈ) සුළු මුදල්<br><br>ඉ) වැටුප් ගෙවීම | ඉදිරියේදි අදල ක්ෂේත්‍රයන්හි අඩුපාඩුකම් මගහරවා ගැණිමට අවශ්‍ය කටයුතු කෙරෙනු ඇත. |

අ.ක. ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
වැඩබලන විගණකාධිපති

අ.ක. මහාචාර්ය ඩබ්ලිව් අභයවික්‍රම
සභාපති